# THE WHITE HACKLE



## උදාරය ඔබ...

63rd ISSUE
January 2010

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

இலங்கை காலாட் படை சஞ்சிகை

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY



ආසේමු (දකුණ) හා රෙම ශ්‍රීලපාහ වෙත යුද
හමුදාපතිතුමා සිදු කළ සංචාරයේ කැමරා
ඇස රැඳුනු තැන් කිහිපයක්

# THE WHITE HACKLE

JANUARY 2010 VOLUME 15 NO.03 63rd ISSUE


## Headlines


Page

- අදහස් උදහස් හා විවේචන 02
- සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරවය දැක්වීම සඳහාය03
- සේවා වනිතා 04
- එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා හයිටි රාජ්‍යයට ගිය 11 වන බළඇණිය 05-07
- පොපිමල් සැමරුම 08
- Veera Puran Appu 09-11
- තවත් පාබල විරුවෙක් 12
- අන්තර් රෙජිමේන්තු ප්‍රායෝගික රයිෆල් තරගාවලිය - 2010 13
- 2 වන ආධාරක බළඇණිය ශ්‍රීලපාහ පළමුවන සංවත්සරය සැමරූ වගයි 14
- 18 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාවේ පළමුවන වසර සැමරුම 15
- ජ්‍යෝතිෂයයි ඔබයි 16
- 1 ශ්‍රීලපාහ 26 වන අණදෙන නිලධාරී 17
- 20 වන රෙජිමේන්තු සංවත්සරය 18-21
- ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපතිතුමාගේ ඒකක සංචාරය 22-23
- වයිට් හැකල් කාටූනය 24
- ජිවිතය හා ඇන්පිම 26
- තම යෞවනය මාතෘභූමියේ හෙට දිනය වෙනුවෙන්... 27
- දේශයේ මුර දේවතා එළි විහිදුවාලන්නට වරම් ලැබූ තවත් පිරිසක් විසිර ගිය වගයි 28
- THE WORLD SNIPING RIFLES 30
- මාරියා මොරේවිනා (රුසියන් සුරඟනා කතාව) 31-34
- දසුනේ හසුන 37
- ප්‍රහේලිකා අංක 43 39-40




06 පුහුණුවකට උපදෙස්



22 18 (සෙව්) ශ්‍රීලපාහ බිහිවී වසරයි



33 1 ශ්‍රීලපාහ 26 වන අණදෙන නිලධාරී




## කවරයේ කථාව

ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු මධ්‍යස්ථානය පිහිටුවා විසි වසරක් සම්පූර්ණ වීම නිමිතිකොට ගෙන දශක තුනක් තිස්සේ පැවති ත්‍රස්තවාදය නිමා කිරීම උදෙසා ප්‍රාණ දානයෙන් කැපවූ ශ්‍රීලපාහ රණවිරුවන් 3807 දෙනා වෙනුවෙන් ඉදිකිරීමට නියමිත ස්මාරකය සඳහා 2009-12-18 වන දින පැවති උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූ ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මැතිතුමා සුබ මොහොතින් මුල්ගල තැබූ අවස්ථාව.


Designed & Printed by
softwave
107D, Havelock Road, Colombo 05.

# THE WHITE HACKLE

**SRI LANKA
LIGHT INFANTRY MAGAZINE**

**Colonel Of The Regiment**

**Maj Gen** RMD Rathnayake RWP RSP USP ndu psc

**Centre Commandant**

**Col** TJ Kodithuwakku RWP

## The White Hackle Staff

Editor in Chief

Col TJ Kodithuwakku RWP

Assistant Editor

Maj KA Pushpakumara RSP psc SLLI
(ADJUTANT RHQ SLLI)

Associate Editor

Maj TP Weerasinghe SLLI
(OIC 'WHITE HACKLE')

Chief Consultant

Maj Gen RMD Rathnayake RWP RSP USP ndu psc

Honorary Consultants

Maj Gen HV Athukorale VSV psc FBIM
( Rtd – Reg Force )
Brig AER Abeysinghe
(Rtd – Vol Force)

Publisher - Regimental Centre
Sri Lanka Light Infantry

Telephone - 0112855204
0112855356 - 60
Ext - 57380

Fax - 0112855204

E-mail - rhqslli@yahoo.com

Website - www.slli.lk

# Feedback

## අදහස්, උදහස් හා විවේචන

## Readers Please Write in

The WHITE HACKLE the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 63rd issue. This quarterly is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears though 'THE WHITE HACKLE', the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience go ahead and write in to 'THE WHITE HACKLE' We are willing to accept and use what if of a standard, like sketches cartoons stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is " Ich Dien", " I Serve". Let 'White Hackle' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

***Editor***

## කර්තෘ වාක්‍යය

දවස් සති විය. සති මාස විය. මාස වසරක් වී 2010 වර්ෂය ද උදා වී ඇත. 2010 වර්ෂයේ ප්‍රථම කාර්තුවේ එනම් වයිට් හැකල් සගරාවේ 63 වන කලාපය මෙලෙස සතුටින් අපි ඔබ අතට පත් කරමු. පසුගිය දශක තුනහිදීම වසරක් නිමාවී වසරක් උදාවන විට අපි ප්‍රාර්ථනා කළේ යුධ ගිනි නිවී අප රටට සාමය උදාවේවා! යි කියාය. දැන් සාමය උදාවී ඇත. ස්වප්නයකි. එහෙත් එය සිහිනයක් නොවේ. කොටි ත්‍රස්තවාදය සුනුවිසුනු වීමෙන් අනතුරුව එළඹුනු පළමුවන වසර මෙයයි. මිනිමරු දුෂ්ඨ වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ කොටි ත්‍රස්තවාදය තුරන් වූ ශ්‍රී ලංකාවක අපි දැන් ජීවත් වන්නෙමු.

රෝමය එක් රැයකින් ගොඩනැංවුවක් නොවේ. වර්තමානයේ සාමය පිරුනු ශ්‍රී ලංකාව ද දවසෙන් දෙකෙන් මැජික් බලයකින් ගොඩනැගුවක් නොවේ. අද අපි භුක්ති විඳින සාමය බිහිවුයේ දහඩියෙන් කඳුලෙන් සුසුමෙන් හා රුධිරයෙනි. මෙරටට සාමය උදාකිරීමේ ගෞරවය හිමිවිය යුත්තේ දේශපාලන අධිකාරියට සහ හමුදා අධිකාරියට පමණක් නොව රණවිරුවන් කෙරෙහි භක්තියෙන් යුද බිමට ටොෆියක් බිස්කට් පැකට් එකක් හෝ එවූ එමෙන්ම පන්සල් පල්ලි කෝවිල් වල නොයෙක් පුද පූජාවල නිරතවූ එමෙන්ම හදවතින් රණවිරුවන්ට ආශිර්වාද කළ සිවිල් ජනතාවටද හිමිවිය යුතුය. ශ්‍රී ලංකාවේ උතුර හා නැගෙනහිර මුදාගැනීමට දායක වූ ශ්‍රී ලංකා පාබල හමුදාවේ නිලධාරි සහ සෙබළු භටද යුද බිම පිළිබඳව බිහිසුනු සහ දුක්මුසු මතකයන් ඉතිරිවී පවතී. ශ්‍රී ලංකාවේ භෞමික දේශසීමා අධිකාරීත්වය සහ පරමාධිපතිත්වය සාක්ෂාත් කර ගැනීමට සකලවිධ සතුරු බළමුළු මුළුමනින්ම උපුටා දැමීමට ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් නිලධාරි සහ සෙසුනිලයෝද ප්‍රාණ දානයෙන් ඇප කැප වූහ. කාය දානයෙන් ද ඇප කැප වූහ. සේවා දානයෙන්ද ඇප කැප වූහ. ඥාණ දානයෙන්ද ඇප කැප වූහ. එවන් උතුම් කැප කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස 2010 වර්ෂය සාමකාමී වසරක් වී තිබේ. ඉතාම ශුභ වසරක් වී තිබේ.

The White Hackle is published quarterly under the supervision of the Regimental Centre commandant to provide the Regiment with information on people, policies, operations, technical developments, views, opinions and ideas about the Sri Lanka Light Infantry. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn,57380 or 57404. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, Of PA Army HQ CBO by letter No, A/275/27 of 16 Mar, '94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

# සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරව දැක්වීම සඳහාය

# IN HONOUR OF THOSE KILLED IN ACTION

**1983 වසරේ සිට මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවි පුද කළ ශ්‍රීලපාහ වීරෝදාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් මියගිය අයගේ නාමලේඛනය 1999 ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සදහන් පරිදි පලකරනු ලැබේ.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2997 | S/164559 | L/Cpl | Janaka Kumara LKG | 12 SLLI | Kalyanapura | 07/08/2008 |
| 2998 | S/177745 | L/Cpl | Priyadarshena MK | 12 SLLI | Kalyanapura | 07/08/2008 |
| 2999 | S/188113 | L/Cpl | Bandara AGBS | 12 SLLI | Kalyanapura | 07/08/2008 |
| 3000 | S/170511 | L/Cpl | Ranasinha MJP | 12 SLLI | Kalyanapura | 07/08/2008 |
| 2954 | S/318218 | Sgt | Bandara KMCS | 7 SLLI | Palampiddi | 15/06/2008 |
| 2955 | S/319255 | Cpl | Lasantha NAR | 8 SLLI | Periyamadu | 17/06/2008 |
| 2956 | S/176576 | L/Cpl | Dissanayaka DMTK | 8 SLLI | Periyamadu | 17/06/2008 |
| 2957 | S/174854 | L/Cpl | Jayasekara DJYMWN | 8 SLLI | Periyamadu | 17/06/2008 |
| 2958 | S/314342 | Sgt | Prithikumara L | 11 SLLI | Mannar | 18/06/2008 |
| 2959 | S/178734 | L/Cpl | Madusanka NCP | 15 SLLI | Kiri Ebban Wewa | 6/23/2008 |
| 2960 | S/307845 | Cpl | Basnayaka BMS | 15 SLLI | Kiri Ebban Wewa | 6/23/2008 |
| 2961 | S/185814 | L/Cpl | Dissanayaka SVSC | 8 SLLI | Periyamadu | 24/06/2008 |
| 2962 | O/307995 | Lt | RMP Samaraweera SLLI | 11 SLLI | Mannar | 25/06/2008 |
| 2963 | S/312656 | Cpl | Bandula Kumara HMP | 12 SLLI | Kalyanapura | 01/07/2008 |
| 2964 | S/186081 | L/Cpl | Liyanage HLASK | 12 SLLI | Gen:Hosp:ANP | 02/07/2008 |
| 2965 | S/00392 | L/Cpl | Jayasena PGSI | 12 SLLI | Kalyanapura | 05/07/2008 |
| 2966 | S/2D03341 | L/Cpl | Rasika LG | 15 SLLI | Gen:Hosp:ANP | 7/4/2008 |
| 2967 | S/317675 | Cpl | Premathilaka MRRM | 6 SLLI | Nagarkovil | 07/07/2008 |
| 2968 | S/177065 | L/Cpl | Prasanna LAA | 15 SLLI | Gen:Hosp: KND | 08/07/2008 |
| 2969 | S/176546 | L/Cpl | Senavirathna YMC | 7 SLLI | Thunnukkai | 17/07/2008 |
| 2970 | S/316240 | S/Sgt | Wipulasena HM | 10 SLLI | Mannar | 18/07/2008 |
| 2971 | S/316994 | L/Cpl | Jayarathna JSK | 7 SLLI | Thunnukkai | 18/07/2008 |
| 2972 | S/176676 | L/Cpl | Kularathna BADL | 12 SLLI | Kalyanapura | 20/07/2008 |
| 2973 | S/172267 | L/Cpl | Karunarathna RMN | 7 SLLI | Thunnukkai | 21/07/2008 |
| 2974 | S/311998 | L/Cpl | Marasinhe MM | 7 SLLI | Thunnukkai | 24/07/2008 |
| 2975 | S/318036 | Cpl | Rajasinha Banda AGRP | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2976 | S/172310 | L/Cpl | Amarasena AS | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2977 | S/160686 | L/Cpl | Ghanarathna RB | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2978 | S/317544 | L/Cpl | Perera JMAI | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2979 | S/306139 | L/Cpl | Nishantha Kumara PGI | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2980 | S/317511 | L/Cpl | Saman Kumara KL | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2981 | S/164754 | L/Cpl | Kumara WRSS | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2982 | S/4Q02475 | L/Cpl | Wickrama WTN | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2983 | S/319518 | L/Cpl | Gunarathna UGPK | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2984 | S/319248 | L/Cpl | Perera AAC | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2985 | S/319506 | L/Cpl | Wimaladasa IM | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2986 | S/317457 | L/Cpl | Maduranga GKC | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2987 | S/312995 | L/Cpl | Weratunga SNP | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2988 | S/172647 | L/Cpl | Kumarasinhe RDA | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2989 | S/319287 | L/Cpl | Kumarasiri HAA | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2990 | S/317077 | Cpl | Abesinhe AMMP | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2991 | S/315789 | L/Cpl | Herath Kumara DMN | 7 SLLI | Gen:Hosp:ANP | 28/07/2008 |
| 2992 | S/186084 | L/Cpl | Rukshan Prasad KP | 12 SLLI | Kalyanapura | 28/07/2008 |
| 2993 | S/181826 | L/Cpl | Suranjith HLD | 12 SLLI | Kalyanapura | 28/07/2008 |
| 2994 | S/320272 | L/Cpl | Mihidupala RD | 15 SLLI | Gen:Hosp:ANP | 30/07/2008 |
| 2995 | S/302654 | Sgt | Aberathna Banda AG | 15 SLLI | Kiri Ibban Wewa | 03/08/2008 |
| 2996 | S/172287 | L/Cpl | Wasantha SU | 7 SLLI | Thunnukkai | 05/08/2008 |
| 2997 | S/164559 | L/Cpl | Janaka Kumara LKG | 12 SLLI | Kalyanapura | 07/08/2008 |
| 2998 | S/177745 | L/Cpl | Priyadarshena MK | 12 SLLI | Kalyanapura | 07/08/2008 |
| 2999 | S/188113 | L/Cpl | Bandara AGBS | 12 SLLI | Kalyanapura | 07/08/2008 |

තව කොටසක් ලබන කලාපයේ

**අවට බැලීමට කාලය ගන්න එය ආත්මාර්ථකාමී වීමට ඇති කාලය අඩු කරයි**

## සේවා වනිතා

# ශ්‍රීලපාහ සේවාවනිතාවන්ගෙන් තව තවත් රණවිරු සත්කාරක වැඩසටහන්





දශක තුනක කාලයක් පුරා අප දෙරණ ලෙයින් කඳුලින් තෙත් කළා වූ ඒ කුරිරු යුද්ධය අද වන විට සහමුලින්ම අවසන් වී ඇත. එය ඔබත් අපත් හෙට උපදින දරු පරපුර ලද භාග්‍යයක් වන අතර ජීවිත හා විවිධ කැපකිරීම් කළ අප ආදර රණවිරුවන් විසින් අභිමානයෙන් යුතුව දිනා දුන් දේශය ආරක්‍ෂා කර ගැනීම ශ්‍රී ලංකාවාසී අප සියළු දෙනාගේ යුතුකමකි. ඔබට ද අපට ද නිදහසේ මාතෘභූමිය පුරා සැරිසරන්නට නිදහස් නිවහල් රටක් උරුම කර දෙනු වස් ඒ සහෝදර රණවිරුවෝ දෙඇස් දෙපා දෙඅත් ජීවිත දන් දුන්හ. ජීවත්ව සිටින අප වෙනුවෙනි. හෙට උපදින්නට සිටින දරු පරපුර වෙනුවෙනි. එසේ නම් දැන් අප කළ යුත්තේ ඒ රණවිරුවන් වෙනුවෙන් හා ඔවුන්ගේ ළඟම ඥාතීන් වෙනුවෙන් අපි කළ හැකි යම් කැපකිරීමක් පරිත්‍යාගයක් වේ නම් ඔවුන් වෙනුවෙන් ඉටු කිරීමයි. ඒ මන්දයත් එම රණවිරුවන් ඔබෙන් අපෙත් හෙට දිනය වෙනුවෙන් ඔවුන්ගේ ජීවිත කැපකළ නිසාවෙනි.

දශක තුනක් පුරා විහිදී ගිය කුරිරු යුද්ධයට මුහුණදුන් සමස්ත රණවිරුවන් අතර සැළකිය යුතු රණවිරුවන් පිරිසක් ශ්‍රී ලංකා පාබල හමුදාවටද අහිමි විය. තවත් පිරිසක් අතුරුදන්ව තවත් විශාල පිරිසක් විවිධ ආබාධ තත්ත්වයන්ට පත්ව ඇත. එදා මෙදා තුර ඔවුන් පසු පස හිඳ ඔවුන් දිරි ගන්වමින් විශාල ශක්තියක් වූ ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාව මේ වන විට එම රණවිරුවන් වෙනුවෙන් ලබා දී ඇති සේවාව මෙතෙකයි කියා නිම කළ නොහැක. ශ්‍රීලපාහ සේවා වනිතාවන් විසින් මෙතෙක් කළාවූ ඒ මෙහෙවර අතර ඉඩම් නිවාස ව්‍යාපෘති/ශිෂ්‍යත්ව/වෛද්‍යාධාර ආබාධිත රණවිරුවන්ට කෘත්‍රිම පාද ලබාදීම වැනි ව්‍යාපෘති ප්‍රධාන තැනක් ගනී.

ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛා සභාපතිතුමිය ප්‍රමුඛ සාමාජිකාවන් විසින් තවත් සුවිශේෂ වූ රණවිරු වැඩසටහනක් 2009.08.26 වන දින රෙමශ්‍රීලපාහ ප්‍රධාන දේශන ශාලාවේදී පවත්වන ලදී. ඒ යුද්ධයේදී ආබාධිත හා යුද්ධයට මුහුණදුන් ශ්‍රීලපාහ නිලධාරින්/සෙසුනිලයන්ගේ චිත්ත ධෛර්ය නංවාලීම වෙනුවෙන් මහාචාර්ය සරත් ගමගේ මහතාගේ දේශනයක් එම රණවිරුවන් වෙනුවෙන් පැවැත්වීම. මෙම දේශනය ඔවුන්ගේ එදිනෙදා රාජකාරිය කරගෙන යාමත් සිවිල් ජීවිතය ජය ගැනීමත් ආබාධිත රණවිරුවන්ගේ චිත්ත ධෛර්ය නගා සිටුවීමටත් මනා පිටුවහලක් වූ බැවි එම දේශනයට සහභාගී වූ සැමගේ අදහස විය. එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී හා ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනිය දමයන්ති රත්නායක මැතිනිය හිටපු ගරු සභාපතිනිය ධනංජනී කරුණාසේකර මැතිනියත් සහභාගී වූ අතර රෙජිමේන්තු සේනාවිධායක කර්නල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්පී රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් අයිජීආර්ජී බෝගොඩවත්ත ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරිහු ඇතුළු ශ්‍රීලපාහ නිලධාරිහු ද ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාවේ සෙසු සාමාජිකාවෝ හා ශ්‍රීලපාහ රණවිරුවෝ විශාල පිරිසක් සහභාගි වූහ.



සේවා වනිතා ශාඛාව
රෙම ශ්‍රීලපාහ



**ශ්‍රී ලංකා පාබල හමුදාවේ මියගිය ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වූ මේජර් ජේසී මල්පහන ශ්‍රීලපාහ ගේ ආදරණීය බිරිය හා දරුවන් වෙනුවෙන් නව නිවසක් ඉදිකර ගැනීමට රු. 5 00,000/- ක් (රුපියල් ලක්‍ෂ පහක මුදලක්) ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනිය විසින් මාතෘභූමියට හිතැති දානපතියෙකුගේ ආධාර අනුව 2009.11.15 දින පරිත්‍යාග කළ අවස්ථාව.**

# එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා හයිටි රාජ්‍යයට ගිය 11 වන බළඇණිය

ශ්‍රී ලංකාවේ සිට කි:මී: 15500 ක් පමණ දුරින් හා උතුරු ඇමරිකානු සහ දකුණු ඇමරිකානු මහද්වීප අතර හයිටි ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය පිහිටා ඇත. උතුරින්, දකුණින් සහ බටහිරින් උතුරු අත්ලාන්තික් සාගරයෙන්ද නැගෙනහිරින් ඩොමිනිකන් සමූහාණ්ඩුවෙන්ද වටවී ඇත. විශාලත්වයෙන් වර්ග කිලෝ මීටර් 67820 ක් පමණ වන මෙහි මිලියන 8.1 ක ජනගහණයකින් සමන්විත වේ.




හයිටි රාජ්‍යය පිහිටීම

1991 වර්ෂයේදී හයිටි රාජ්‍යයේ ඇති වූ හමුදා කැරැල්ල, දේශපාලන අස්ථාවරත්වය සහ දූෂණ හේතුවෙන් එරට නීතිය සහ සාමය පවත්වාගෙන යාමට අපහසු වූ බැවින් එම වර්ෂයේ සිට එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සිදුකර ඇත. එම සාම සාධක මෙහෙයුම් සඳහා 2004 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව වෙතින්ද සාම සාධක හමුදා සහභාගි කරවා ඇත. 2004 අවසන් අඩ වසරේ සිට එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා රාජකාරී සඳහා **හයිටි රාජ්‍යයේ** රාජකාරී කිරීමේ අවස්ථාව උදාවූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ඊට පළමු බළඇණිය වශයෙන් හටපිරිස් සහභාගි කරවීමේ භාග්‍යය ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව වෙත හිමිවිය. ඒ අනුව දැනට යුද්ධ හමුදාව වෙතින් එකී රාජකාරී සඳහා බළඇණි 10 ක් රපෝර්තු කරවා ඇති අතර, හය වන බළඇණිය වශයෙන්ද ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව වෙතින් හටපිරිස් සහභාගි කරවා **හයිටි දේශයේ** සාමය සුරකීමේ ව්‍යායාමයට මනා දායකත්වයක් ලබා දී ඇත.




ඒ අනුව මෙම සාම සාධක රාජකාරී තවදුරටත් ඉටු කිරීම පිණිස 11 වන බළඇණිය ලෙස ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව වෙතින් 749 දෙනෙකුගෙන් සමන්විත බළඇණියක් 2009 දෙසැම්බර් මස අවසානයේ හයිටි රාජ්‍යයේ සාම සාධක රාජකාරී සඳහා යාමට සැලසුම් කරන ලදී.

එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරීන් සඳහා වන පුහුණුවීම් දින 14 ක් තුළදී එජාසාසාබ පුහුණු පාසල කුකුලේගඟ හිදී සිදුවිය. මේ සඳහා සාම සාධක රාජකාරී සඳහා යාමට තෝරා ගන්නා ලද හටපිරිස් සහ අතිරේකව තෝරාගත් හටපිරිස් පහත සඳහන් කාලසීමාව ආවරණය වන පරිදි අධියර 02 ක් යටතේ පුහුණුවීම් කටයුතු සිදුකරන ලදී.

1 වන අධියර
2009.10.26 වන දින සිට 2009.11.14 වන දින දක්වා නිලධාරීන් 16ක් හා සෙසුනිලයින් 410ක් පුහුණුව ලබන ලදී.

2 වන අධියර
2009.11.16 වන දින සිට 2009.12.04 වන දින දක්වා නිලධාරීන් 26ක් හා සෙසුනිලයින් 348ක් පුහුණුව ලබන ලදී.

මෙතෙක් ක්‍රියාත්මක රාජකාරී සඳහා පමණක් ශාරීරිකව හා මානසිකව හැඩගැසී තිබූ හටපිරිස් සාමය ආරක්ෂා කරනු ලබන සාම සාධක සෙබළෙකුට උචිත මානසිකත්වයකින් හෙබි හටපිරිසක් බවට පත් කිරීම පිණිස ඉහත දැක්වෙන කාල සීමාව තුළදී පැවැත්වූ පුහුණු පාඨමාලාවන් සඳහා පහත සඳහන් විෂයට අදාළ කරුණු පිළිබඳව න්‍යායාත්මක, නිදර්ශණ, ප්‍රායෝගික හා අභ්‍යාස මඟින් මනා පුහුණුවක් ලබාගන්නා ලදී.

- පුහුණු ප්‍රදේශය 01 - මාර්ග බාධක.
- පුහුණු ප්‍රදේශය 02 - ආහාර බෙදාදීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සහ නීති විරෝධි පෙළපාළියක් විසිරුවා හැරීම.
- පුහුණු ප්‍රදේශය 03 - නිරායුධකරණය, පුනරුත්ථාපනය. නැවත සිවිල් ජන ජීවිතයට මුදා හැරීම සහ වටලා සෙවීම.
- පුහුණු ප්‍රදේශය 04 - වාහන ආරක්ෂක මුර සංචාර.
- පුහුණු ප්‍රදේශය 05 - පාමුර සංචාර සහ මර උගුල්.

මෙයට අමතරව පහත සඳහන් විෂය කරුණු යටතේ දේශණ මගින් හටපිරිස් හි අවබෝධය සහ දැනුම ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකිවිය.

- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවිධානය, එහි ව්‍යාප්තිය සහ එහි පරිච්ජේද 6 සහ 7 පිළිබඳ හඳුන්වාදීම.
- හයිටි දේශයේ පිහිටීම, සංස්කෘතිය සහ ඔවුන්ගේ ජන ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබාදීම.
- සමාජ රෝග සහ ඒඩ්ස් (AIDS) හා එච්අයිවී (HIV) වෛරසය පිළිබඳව දැනුවත් කිරීම සහ එය මැඩ පවත්වා ගන්නා ක්‍රමවේදයන් පිළිබඳව දැනුමක් ලබාදීම.
- ගිනි වර්ග. ගිනි නිවීම සහ ගිනි නිවන උපකරණ පිළිබඳව හඳුන්වාදීම.

## සංවිධානය

| | | | |
|---|---|---|---|
| අණදෙන නිලධාරී | කර්නල් | කේජේ ජයවීර ආර්එස්පී | |
| දෙවන අණදෙන නිලධාරී | ලුතිතන් කර්නල් | එච්එම්ඩබ්ලිව්කේ හේරත් ආර්එස්පී | ශ්‍රීලපාහ |
| භකාස භාර නිලධාරී | ලුතිතන් කර්නල් | එච් වල්ගම | ශ්‍රීලයුපොසේබ |
| විධායක අධිකාරී | මේජර් | එම්පීඑස්පී කුලසේකර | ශ්‍රීලපාහ |
| ක්‍රියා හා පුහුණු භාර නිලධාරී | මේජර් | ඕඑන් මානගේ ආර්එස්පී | ශ්‍රීලපාහ |
| බුද්ධි නිලධාරී | කපිතාන් | එන්අයිපීකේ ගමගේ | ශ්‍රීලපාහ |
| නිලධාරී අණදෙන 'පාලන කණ්ඩායම' | මේජර් | ටීඋක්ඩී ධර්මසේන | ශ්‍රීලපාහ |
| නිලධාරී අණදෙන 'ආධාරක කණ්ඩායම' | මේජර් | බීඑම්සී බෙලිගස්වත්ත | ශ්‍රීලපාහ |
| නිලධාරී අණදෙන 'ඒ' කණ්ඩායම | මේජර් | එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී | ශ්‍රීලපාහ |
| නිලධාරී අණදෙන 'බී' කණ්ඩායම | මේජර් | ජේකේආර්පී ජයසිංහ,ආර්ඩබ්ලිව්පී ආර්එස්පී | ශ්‍රීලපාහ |
| නිලධාරී අණදෙන 'සී' කණ්ඩායම | මේජර් | අයිපී ජයසිංහ | ශ්‍රීලපාහ |
| නිලධාරී අණදෙන 'ඩී' කණ්ඩායම | මේජර් | එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී | ශ්‍රීලපාහ |
| රෙජිමේන්තු සැරයන් මේජර් | ඔනි I | ජේපීඑම්බීයු ජයවර්ධන | |

වැඩ කිරීමට කාලය ගන්න එය සාර්ථකත්වයේ වටිනාකමයි

- වෙඩි ද්‍රව්‍ය හඳුන්වාදීම, හඳුනා ගැනීම සහ ඒවා පරිහරණය කිරීම පිළිබඳ අවබෝධයක් ලබාදීම.
- එක්සත් ජාතීන්ගේ නීති රීති, බලය භාවිතා කිරීමේ නීති, සිවිල්/සාම හමුදා නීති පිළිබඳ අවබෝධයක් ලබාදීම.
- හයිටි රාජ්‍යයේ වැඩිපුර භාවිතා කෙරෙන "ක්‍රේයොල්" භාෂාව ඉගැන්වීම.
- නිලධාරීන් සඳහා දින 05 ක් ප්‍රංශ භාෂාව ඉගැන්වීම.




පුහුණුවීම් විශේෂ අවස්ථා

ලබාගැනීමේ වැඩසටහන 2009.11.10 යුධ හමුදා සාමාජිකයින්ගේ ශාරීරික යෝග්‍යතාවය ඉහළ මට්ටමකට නංවාලන ආයතනය වන පනාගොඩ යුධ හමුදා





ආගමික වතාවත්හි යෙදෙමින්



රෙජිමේන්තු අධිපති සම්මාන මුරය පිළිගනිමින්

ශාරීරික අභ්‍යාස පුහුණු පාසැල මෙදින සියලු අයවළුන්ගේ මනස දහම් සිසිලෙන් සංසිඳුවාලන ආගමික සිද්ධස්ථානයක අසිරිය ගෙන තිබිණි. මෙදින 1700 පැයට පමණ හේව්සි හොරණෑ දවුල් බෙරහඬ මධ්‍යයේ පෙරදිග සංස්කෘතික අංගයන්ට මුල්තැන දෙමින් පැවැති අලංකාර පෙරහැරකින්, 11 වන සාම සාධක බළඇණියෙහි අණදෙන නිලධාරී තුමන් විසින් සධාතුක කරඬුව පෙරටු කොට මහා සංඝරත්නය දහම් ශාලාව වෙත වැඩම කරවා ආගමික වතාවත් ඉටුකරන ලදි. දිවයිනේ ප්‍රසිද්ධ ධර්ම දේශක පූජ්‍ය බණ්ඩාරවෙල අමිතානන්ද මාහිමිපාණන් වහන්සේ ඇතුළු මහා සංඝරත්නය සත් නමක් වඩම්මවාගෙන එන ලදී.

මෙහිදි මෙම අවස්ථාවට එක්වු අණදෙන නිලධාරීතුමා ප්‍රමුඛ රෙජිමේන්තු සේනාවිධායක කර්නල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී, හා භකාස කටයුතු භාර නිලධාරී ලුතිතන් කර්නල් එච් වල්ගම ශ්‍රීලයුපොහේබ, දෙවන අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එච්එම්ඩබ්ලිව්කේ හේරත් ආර්එස්පී, ශ්‍රීලපාභ සහ රෙජිමේන්තු මුලස්ථාන බළඇණියේ අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් අයිපීආර්පී බෝගොඩවත්ත ශ්‍රීලපාභ ඇතුලු සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින් තිසරණ සහිත පංචසීලයෙහි පිහිටුවා නාහිමිපාණන් වහන්සේ විසින් හරවත් ධර්ම දේශණයක් පැවැත්වීමෙන් පසු සෙත්පිරිත් සජ්ජායනයක් කර පිරිත් නූල් බැද ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය ලබාදීමෙන් අනතුරුව පිරිකර පූජාව සිදුකර 1930 පැයට පමණ මෙම ආගමික වැඩසටහන නිමාවට පත්කරන ලදි.

මෙම බළඇණියේ සියලුම නිලයින් හට සෙත් පැතීම සහ දේවාශිර්වාදය

පුහුණුවීම් අතරතුර 2009 නොවැම්බර් මස 27 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයු පීඑස්සී මැතිතුමා කුකුලේගඟ පුහුණු මධ්‍යස්ථානයට පැමිණ පුහුණුවීම් පරීක්ෂාකර සියලු නිලධාරී/සෙසුනිලයන් හට ඒ සඳහා ඇවැසි උපදෙස් ලබාදෙන ලදි.

හයිටි දේශයට යාමට ප්‍රථම ආගමික වතාවත් ඉටුකර ආශිර්වාද ලබා ගැනීම රෙජිමේන්තු අධිපතිගේ සංකල්පයකට අනුව 11 වන සාමසාධක බළඇණියේ අණදෙන නිලධාරී කර්නල් කේජේ ජයවීර ආර්එස්පී ගේ උපදෙස් පරිදි හයිටි දේශයේ රාජකාරී සඳහා යාමට නියමිත සියලු නිලයින් හට ආශිර්වාද




රෙජිමේන්තු අධිපති සම්මාන පෙළපාළිය අමතමින්

සිතීමට කාලය ගන්න එය බලයේ උල්පතයි

ලබාගැනීම පිණිස නවගමුව විහාරස්ථානයේදී බෝධි පූජා පිංකමක් සහ එහි පත්තිනි දේවාලයෙහි පළතුරු පූජාවන් පවත්වා ආශිර්වාද ලබාගැනීමේ පිංකම් මාලාවක් පැවැත්වීමට කටයුතු යොදා තිබිනි. ඒ අනුව අණදෙන නිලධාරීතුමා එම මැතිනිය, හකාස භාර නිලධාරි, එම මැතිනිය සහ පවුලේ සැම මෙන්ම හයිටි රාජ්‍යය බලා යාමට නියමිත සියලු කණ්ඩායම් වෙතින් සියලු නිලයින් නියෝජනය වන පරිදි නිලධාරීන් 12 දෙනෙකු සහ සෙසුනිලයින් 48 දෙනෙකුගෙන් සමන්විත පිරිසක් 2009.12.14 වන දින සන්ධ්‍යාවේ නවගමුව විහාරස්ථානය වෙත ගොස් මෙම ආගමික වතාවත් සහ පූජාවන් පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙහිදී ප්‍රථමයෙන්ම නවගමුව විහාරස්ථානයෙහි බෝධීන් වහන්සේ අභියස බෝධි පූජාමය පිංකම පැවැත්වූ අතර, මෙම බෝධි පූජා පිංකම නවගමුව විහාරවාසී පූජ්‍ය ආටිගල පඤ්ඤාරතන නාහිම්පාණන් වහන්සේ විසින් සිදුකරන ලදී. උන්වහන්සේ විසින් බෝධි පූජාව අවසානයේ සියලු නිලයින් උදෙසා ධර්මදේශණයක් පවත්වා ආශිර්වාද ලබාදෙන ලදි. බෝධි පූජාවෙන් අනතුරුව සියලු දෙනා පත්තිනි දේවාලයෙහි පළතුරු පූජාව සඳහා සහභාගි වූහ. මෙම පූජාව පත්තිනි දේවාලයෙහි දැල බංඩාර ප්‍රධාන කපු මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර, 1800 පැයට දේවාලයේ පවත්වනු ලබන තේවා කටයුතු ද ආවරණය වන පරිදි මෙම විශේෂ පළතුරු පූජාව පවත්වා දේවාශිර්වාද ලබා දෙන ලදී. පසුව නවගමුව විහාරවාසී පූජ්‍ය ආටිගල පඤ්ඤාරතන නාහිම්පාණන් වහන්සෙ විසින් මෙම පිංකම් මාලාවට සහභාගි වූ සියලු දෙනා හට පිරිත් නූල් බැඳ ත්‍රිවිධ රත්නයේ ආරක්ෂාව ප්‍රාර්ථනය කොට ආගමික වතාවත් නිමාවට පත් කරන ලදී.



රෙජිමේන්තු අධිපතිතුමා විසින් අණදෙන නිලධාරී වෙත නිල වශයෙන් ධජ භාරදීම

හයිටි රාජ්‍යයේ සාම සාධක රාජකාරි සඳහා නික්ම යාමට ප්‍රථම බළඇණියේ ප්‍රෞඩත්වය විදහාපෑම සඳහා 2009 දෙසැම්බර් මස 23 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු සරඹ භූමියේදී සම්මාන පෙළපාළියක් පැවත්වන ලදී. රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී,ආර්එස්ප යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ප්‍රධාන ආරාධිතයා වශයෙන් මෙම පෙළපාළිය සඳහා සහභාගි විය. රෙජිමේන්තු සේනාවිධායක. අනිකුත් රෙජිමේන්තු සේනාවිධායකවරුන්, නාවික හා ගුවන් හමුදාව ඇතුලු ජ්‍යේෂ්ඨ නිලධාරි විශාල සංඛ්‍යාවක් මෙම අවස්ථාවට සහභාගි වූහ. එදින 0955 පැයට සම්මාන මුරය පිරි නැමීමෙන් අනතුරුව 1000 පැයට පමණ ප්‍රධාන ආරාධිත අමුත්තා වෙත සම්මාන පෙළපාළිය පිරිනමන ලදී. ඉන් අනතුරුව රෙජිමේන්තු අධිපති තුමා විසින් පෙළපාළිය අමතමින් එක්සත් ජාතින්ගේ සාම සාධක රාජකාරින් සඳහා සහභාගි වීම සඳහා සෙනින් තෝරා ගැනීමේදී නිවැරදි පිළිවෙතක් අනුගමනය කළ බවත්, ඒ සඳහා පෙර අවස්ථා වලදී මෙන් කිසිදු දෝෂාරෝපනයක් එල්ල නොවූ බවත්, ඒ සැබැදිව කටයුතු කළ සියලු අයවළුන් හට ස්තුතිය පළ කළේය. තව දුරටත් අදහස් දක්වමින් රාජකාරි සිදුකිරීමේදි විනය සාමාන්‍ය මට්ටමට වඩා වැඩියෙන් පවත්වාගෙන යන ලෙසත් ඒ සඳහා සියලු දෙනා හට සුබ පතන බවත් ප්‍රකාශ කරන ලදි.

සම්මාන පෙළපාළිය අවසානයේදි සියලු නිලයින් හා ආරාධිත අමුත්තන්ගේ සහභාගිත්වයෙන් 1045 පැයට පමණ තේපැන් සංග්‍රහයක් පැවති අතර, අනතුරුව 1115 පැයට පමණ හයිටි දේශයේ රාජකාරි සඳහා නික්ම යන නිලධාරි/සෙසුනිලයින් වෙත සකසන ලද සහ විවිධ උත්සව අවස්ථාවන් සඳහා යොදාගන්නා භාණ්ඩ/ඇඳුම් ආයිත්තම්, පෙරදිග නැටුම් කණ්ඩායම හා කැලිප්සෝ සංගිත කණ්ඩායම රෙජිමේන්තු අධිපති තුමාගේ නිරීක්ෂණය සඳහා ප්‍රදර්ශණය කරන ලදී. මෙම කාර්යයන් සාර්ථකව ඉටුකිරීම සඳහා පත් කරන ලද මණ්ඩලයේ මණ්ඩල වාර්තාවන්ද රෙජිමේන්තු අධිපති තුමාගේ නිරීක්ෂණය සඳහා ලබාදෙන ලදි. සාමසාධක රාජකාරී ඉටු කිරීමට නියමිත අයවලුන් හා පැමිණි සිටි ප්‍රධාන ආරාධිත අමුත්තා ඇතුළු සියලු දෙනා සමඟ සමූහ ඡායාරූපයට පෙනී සිටීමෙන් පසු 1230 පැයට පමණ සියලු නිල දිවා භොජන සංග්‍රහයක් පවත්වන ලදී.

වර්ෂ 2009 ක්වූ දෙසැම්බර් මස 24 වන දින ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක මේජර් ජෙනරාල් එල්එච්එස්සී සිල්වා ඩබ්ලිව්ඩබලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී විසින් සාම සාධක බළඇණියේ රාජකාරී සඳහා සහභාගි වීමට නියමිත සියලුම නිලධාරීන් අමතා සාම සාධක රාජකාරි සිදුකිරීමේදි එහි වගකීම දැරිය යුතු ආකාරය සහ රාජකාරි සිදුකළ යුතු ආකාරය පිළිබඳව දැනුවත් කරන ලදි.

එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරීන් ඉටුකිරීමට ශ්‍රී ලංකාවෙන් හයිටි රාජ්‍යය වෙත ගොස් රාජකාරී කල පළමු බළඇණිය එම රාජකාරි ඉතා උසස් මට්ටමෙන් සිදුකර අනිකුත් රටවල්ද ශ්‍රී ලංකා බළඇණිය ආදර්ශයට ගෙන කටයුතු කර ඇත. එවන් සුවිශේෂිව රාජකාරී කර ශ්‍රී ලංකා මාතාවගේ නාමය ලොව පුරා බබලවන්නට ත්‍රිවිධ රත්නයේ පිහිට ආරක්ෂාවෙන් හා අදහන ආගමික ශාස්තෲවරුන්ගේ පිහිටෙන් හැකිවේවායැයි එක සිතෙන් අපි ප්‍රාර්ථනා කරන්නෙමු.

මූලස්ථානය 11 එජාසාසාබ





රෙජිමේන්තු අධිපතිතුමා භාණ්ඩ පරීක්ෂා කරන අයුරු

**ජීවිතය කටුක වන්නේ පතන දේ ලැබෙන තුරු නොඉවසිලිමත් වීම නිසයි.**

# පොපි මල් සැමරුම



පළමුවන ලෝක යුද්ධයෙන් ඉතා දරුණු ප්‍රහාරයන්ට ලක්වූ, ප්‍රංශයට අයත් ප්ලාන්ඩර්ස් සහ පිනාඩි යන ප්‍රදේශ දෙක ලෝක ඉතිහාසය වැළඳගත්තේ ඛේදාන්ත ඉරණමක අමිහිරි සටහන් සනිටුහන් කරමිනි. ජනාකීර්ණ නගර සහිත ගොඩනැගිලි දර්ශනීය තුරුලතා හරිතවර්ණ සරුසාර ගොවිබිම් හරහා යුධ ගිනිදැල් හඹා ගියේ ඒ සියල්ල දුර්ධාන්ත වූ විනාශ මුඛයට ඇද දමමිනි. වර්ෂ 1914 ඇවිලුණු යුධ ගිනිදැල් වර්ෂ 1918 නිවියාමෙන්, නිමාවක් දකින විට මෙම ප්‍රදේශයන්හි ඉතිරිව පැවතියේ මියගිය සෙබළුන්ගේ සොහොන් ගොඩැලි හා සාරවත් ගොවිබිම් වෙනුවට මඩ ගොහොරු පමණි.

ජන ශුන්‍ය වූ මෙම ප්‍රදේශවල තැනි -න් තැන ද, සෙබළුන්ගේ සොහොන් ගොඩැලි හා බෝම්බ දැමීමෙන් සෑදුණු වළවල් මත මෙන්ම ගොඩදැමූ පස්කඳු මුදුන්හි ද මඩ කඩිති ආසන්නයේ ද රත් පැහැයෙන් බබළන පොපිමල් පිපෙන්නට විය. තවද රත් පැහැය ගත් සිනිඳු පෙති දෙකකින් හා කළු පැහැති රේණු සහිත පිපුණු පොපිමල් යායක් සිතුවම් කළේ සමස්ත පරිසරය වෙලාගත් රක්තවර්ණ දර්ශනයකි. එය මව්බිම වෙනුවෙන් මහ පොළොව



සිපගනිමින් ජීවිත කැප කළ සෙබළුන් ගෙන් ගලා ගිය රුධිර ගංගාවක ස්වභාවය පිළිඹිබු කළේය.

පළමුවන ලෝක සංග්‍රාමය අවසන් වූ වර්ෂ 1918 නොවැම්බර් මස 11 දින 1111 පැයට මානව සංහතියේ ඉරණම තීරණය කරන සාම ගිවිසුමක් ද අත්සන් කෙරුණි. අනතුරුව වර්ෂ 1919 නොවැම්බර් මස 11 දින 1111 පැයට පළමුවන ලෝක යුද්ධය වෙනුවෙන් මියගිය අයවලුන් අනුස්මරණය කිරීම් වස් විනාඩි 2ක නිශ්ශබ්දතාවයක් පැවැත්විය. එදින ධාවනය වෙමින් පැවැති දුම්රිය ඇතුළු සියලු යාන වාහන නියමිත වේලාවට නවතා උත්තමාචාරය පුද කර ඇත. මෙය විශේෂයෙන්ම මහා බ්‍රිතාන්‍ය හා රට අයත් යටත් විජිතයෙන් ද මෙම අනුස්මරණ සම්ප්‍රදාය අනුගමනය කළහ.

පොපි මල් අනුස්මරණීය සංකේතයක් ලෙස පැළඳීම සඳහා මුලපිරුවේ වර්ෂ 1915 දී කර්නල් ජෝන් මැක්රේ විසින් රචනා කරනු ලැබූ "ඉන් ප්ලාන්ඩර්ස් ෆීල්ඩ්ස්" නම් කාව්‍ය සංග්‍රහයයි. වර්ෂ 1915 දෙසැම්බර් මස 08 වන දින ප්‍රංශයේ පළවූ "පන්ච්" නම් සඟරාවට ලිපියක් සපයමින් පොපි මල අනුස්මරණීය පුෂ්පයක් ලෙස ද මැක්රේ හඳුන්වා දුනි. වර්ෂ 1918 කර්නල් මැක්රේ සඳහටම දෙනෙත් පියා ගත් පසු ඔහුගේ දෛනික සටහන් පොතේ ලියා තිබූ මෙම කවි පංතිය යුරෝපය පුරා ප්‍රචලිත විය. කාව්‍ය සංග්‍රහය එළි දුටු ප්‍රථම අනුස්මරණ දිනයේ දී මැක්රේ ගේ පියා වෙත සුබ පැතුම් රාශියක් ගලා එන්නට විය. මියගිය සෙබළුන්ගේ ආත්ම විසින් ජීවත්වන සෙබළුන්ගේ හදවත් තුළට කථා කරනු ලබන මෙම කාව්‍ය සංග්‍රහය කැපවීම අධිෂ්ඨානය හා නොපසුබට උත්සාහය ධ්වනිත කරන්නෙකි.

යුරෝපීය ජනතාවගේ හදවත් ප්‍රකම්පනය කෙරෙහි බලපෑ මෙම කාව්‍ය සංග්‍රහය ඇමරිකානු යුධ ලේකම්වරියක වූ මොයිනා මිචෙල් කෙරෙහි නව කාව්‍ය සංකල්පනා අවධි කිරීමට පවා සමත් විය. ඇය ද වික්ටරි එම්බෙල්ම් නම් කාව්‍ය සංග්‍රහය රචනා කළේ ද මැක්රේ ගේ කාව්‍ය සංග්‍රහයට ප්‍රති උත්තරයක් වශයෙනි. ඉන් නොනැවතුන ඇය මියගිය සෙබළුන් සිහි කිරීම වස් තමාම පොපි මලක් පැළඳ, තමා වෙත ඇති ඉතිරි පොපි මල් මිතුරන් අතරේ බෙදා දී ඉන් ලැබෙන මුදල් මියගිය හමුදා සේවා පවුල්වල සුබ සාධනය වෙනුවෙන් ද පරිත්‍යාග කර ඇත.


මෙය වඩාත් දිරිමත් කරන ලද්දේ මෙඩෙෂි ගෘරින් මැතිනිය විසිනි. ප්‍රංශ ජාතික කාන්තාවක් වූ ඇය තනිවම පොපි මල් නිෂ්පාදනය කර එවා විකුණා ලැබෙන මුදලින් හමුදා රණවිරු පවුල්වල යැපෙන්නන් නගා සිටුවීමට උපකාර කළාය. ප්‍රංශ ක්‍රිස්තියානි සංගමයේ ලේකම්වරියක වූ ඇය පොපි මල් එම සංගමය හරහා නිෂ්පාදනය කිරීමේ කටයුතු ද ඇරඹීය. ඒ අනුව පොපි මල් ආභාසය ප්‍රථම වරට නෙදර්ලන්තයටත් එංගලන්තයටත් ප්‍රවිෂ්ට වූයේ ප්‍රංශයෙනි. වර්ෂ 1921 බ්‍රිතාන්‍යයේ පවත්වන ලද ප්‍රථම පොපි මල් දිනය සැමරීමට පොපි මල් ගෙන්වන ලද්දේ ප්‍රංශයෙනි. ඉන්පසුව පොපි මලේ නිෂ්පාදනය ලන්ඩනයේ කෙන්ට් මාවතින් ඇරඹිණි. සැම වසරකම ජාත්‍යන්තර දිනය නමින් වෙන්වූ නොවැම්බර් මස 11 යුද්ධයෙන් මිය ගිය විරුවන් සිහිකිරීම වෙනුවෙන් වෙන් කෙරුණි.

බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවැති සමයේ පටන් අප ද එම දිනය ඒ ආකාරයෙන්ම සැමරුම් කෙරුණි. එහෙත් ශ්‍රී ලංකාව ජනරජයක් වීමත් සමගම ඒ සඳහා නොවැම්බර් මස 11 දිනට ආසන්න ඉරු දිනට යොදා ගැනිණ. 1950 දශකයේ මුල් භාගයේ දී අග්‍රාමාත්‍යවරයෙකු ව සිටි සර් ජෝන් කොතලාවල ද රටේ නායකයකු වශයෙන් පොපි මල් සැමරුම් උත්සවයට සහභාගී වූ අතර, ත්‍රිවිධ හමුදාපතිවරුන් ඇතුළු තානාපතිවරු ද මෙම සැමරුම් උළෙල නියෝජනය කළහ.



දෙවන ලෝක යුධ සංග්‍රාමයට දායක වූ අප රට වයෝවෘද්ධ තත්ත්වයට පත්වූ සෙබළුන් වර්තමානයේ ජීවිතයේ සැඳෑ සමය පසු කරමින් සමු ගනිමින් සිටිති. මෙවැනි කාල වකවානුවක රටේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් ත්‍රස්ත ප්‍රහාරයන්ට ලක්ව අමිල ජීවිත කැපකර නිදහස් නිවහල් දේශයක් ගොඩනැගීමට උරදුන් ජාතියේ අභීත රණවිරුවන් ගෞරවාන්විතව සැමරීම සඳහා ද මෙම දිනය යොදා ගැනීමට සිදුවීම හමුදා සම්ප්‍රදාය තුළින් බිහිවූ සදාචාරාත්මක අයිතියකි. පොපි මල එංගලන්තයෙන් ලැබුණද ඒවා අලෙවිකර ලබන ආදායමෙන් දෙවන ලෝක රණවිරුවන්ට පමණක් නොව වර්තමාන ආබාධිත රණවිරුවන් ගේ සුබ සාධනය වෙනුවෙන් වැය කිරීම ද අපි නොපිරිහෙලා ඉටු කරමු.

(ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ ප්‍රකාශනයකින් උපුටා ගන්නා ලදී)






# VEERA PURAN APPU

"Porang Appo", earlier Francisco Fernando (a relative of mine), stood up heroically against the injustice of British colonialism in Ceylon and has been an example for my own life. He gave leadership to a peasant population in 1848 who had lost their King and their Chiefs. He stood up in rebellion against the mighty Empire of Queen Victoria "an Empire on which the sun never set."

Writing in the Island of January 1, 2000, Dayan Jayatileke has named Porang Appo or more popularly called Puran Appu as Sri Lanka's man of the Millennium.

"The rebels of 1848 were still more heroic because they took up arms against a more entrenched colonial rule, having seen or heard of the defeat of 1818 and the scorched earth reprisals that followed. Nor were they nobles partly motivated by the loss of their class status and role; for the most part they were commoners, some belonging to so-called lower castes, many from the low-country where the might and main of the occupier was concentrated and most clearly visible. Puran Appu then is our real Lankan hero. Here is my Man of the Millennium, of this island".

Puran Appu wanted to make a difference and jumped in at the Deep End. He was prepared to face the Winds of Fire.

The English Press in Colombo have always thrown brickbats at me that I am "claiming" relationship to Puran. My relationship to Puran Appu is as follows Veerahennedige Francisco Fernando of Moratuwa had three sons - Juan Fernando, Gabriel Fernando and Abraham Fernando. Juan Fernando's great grandson was Francisco Fernando, later named Puran Appu. Abraham Fernando's great granddaughter, Joslin Senaratne was my mother's mother. (Many generations apart!)

I am grateful to Wimalasiri Fernando and Gustavus Jayawardena of Moratuwa for kindling my interest in Puran Appu and making available to me all the material on him in their possession. I have done much research into Puran's activities and the following is based on that.

## Puran's Early Life

Francisco, born in 1812, attended the Wesleyan School in Moratuwa (the original building is now part of Veera Puran Appu School). He was a very mischievous boy. After a fight with the village headman, he fled from Moratuwa in 1825, at the age of thirteen. He then travelled about the country, mostly the hill country - to Ratnapura, Haldemulla, Badulla and other places and finally to Kandy.

In 1840, he stayed with his uncle, W. Marcellenus Francisco Fernando, the first Sinhala proctor who had a flourishing practice at Ratnapura - at Kahangamuwa Walawwa in Ratnapura.

Between 1842 and 1844, he became famous as a fearless person in the Uva province. He broke into the house of Magistrate Dawson of Badulla (because of some injustice), and was imprisoned and then broke prison. He cursed Major Rodgers who brought a false charge against him and Major Rodgers was struck by lightning in Nuwara Eliya.

The gazette notification by the Colonial Secretary, Sir Emmerson Tennent on January 1st 1847, offered ten pounds for his apprehension and described him as follows:

"Porang Appoo originally of Morotto, lately of Kandy, trade - unknown, caste - fisher, aged - 34 years, height - 5 ft. 7 1/2 inches, hair - long and black, eyes - light hazel. complexion - light. well looking, make - well made, stout, marks of pL11lish111Cint Oil the back and foul" vaccination marks".

James Alwis, writing in 1876 of the events of 1848 in the "Ceylon Overland Examiner" states that Puran Appu or Veerahennedige Franciscu Fernando was of the Karawa caste "in whom a bold and daring disposition was combined with a strong and healthy constitution".

**Between 1842 and 1844, he became famous as a fearless person in the Uva province. He broke into the house of Magistrate Dawson of Badulla (because of some injustice), and was imprisoned and then broke prison. He Cursed Major Rodgers who brought a false charge against him and Major Rodgers was struck by lightning in Nuwara Eliya.**

In early 1847 in Kandy, he met and married Bandara Menike, the daughter of Gunnepana Arachchi. They begat a daughter, Siribara Menike.

He census of 1835 (when Puran was aged 23) records the population details as follows:

| | |
|---|---|
| Whites | 9,121 |
| Free blacks | 1194,482 |
| Slaves | 27,397 |
| Aliens and resident strangers | 10,825 |

(Nira \Wickramasinghe: Sri Lanka in the Modern Age. p.48).

The "slaves" were workers in coffee plantations brought from South India who were, according to some

Englishmen, treated with "disgraceful injustice and cruetly" which was "worse than Negro slavery".
(Kumari Jayawardene: Nobodies to Sombodies, p.99)

## Turmoil in Kandy

By the time Puran Appu came to Kandy, the Kandyan provinces were in a state of turmoil. The Kandyan provinces had been under British rule for 32 years. The depression in the United Kingdom had severely affected the local coffee and cinnamon industry.

Planters and merchants clamoured for a reduction of export duties. Sir Emerson Tennent, the Colonial Secretary in Colombo recommended to Earl Grey, Secretary of State for Colonies in London, that taxation should be radically shifted from indirect taxation to direct taxation. This proposal was accepted. It was decided to abolish the export duty on coffee and reduce the export duty on cinnamon leaving a deficit of 40,000 pounds, which was to be met by direct taxes on the people. A new Governor, 35-year¬old Torrington. a cousin of PM Lord Russell, was dispatched to Colombo by Queen Victoria to carry out these reforms.

On the 1st ofJuly 1848, licence fees were imposed on guns, dogs, carts and shops and labour was made compulsory on plantation roads, unless a special tax was paid. These taxes bore heavily on both the purse and the traditions of the Kandyan villager.

On the 6th ofJuly, a multitude gathered at the Kandy Kachcheri. Unarmed peasants were set upon and beaten up. On the 8th of July, Sir Emmerson Tennent, the Colonial Secretary told Headmen, "pay two and six and keep a gun or be flogged".

A mass movement against the oppressive taxes was developing. The masses were without the leadership of their native King (deposed in 1815) and their chiefs (annihilated after the 1818 rebellion). Keppetipola had been killed and Ehelepola banished (I visited this tomb in Mauritius in 2003). The leadership passed for the first time in the Kandyan provinces into the hands of ordinary people.

One of the group was Gongalagoda Banda who claimed relationship to the deposed King and was crowned in Dambulla.

The real hero and Iivewire in this group became Francisco Fernando, who, having earned a name for himself in the hill provinces as a courageous man, was now popularly known as "Porang Appo" (Puran Appu).

Professor Kingsley de Silva in his book, "Rebellion of 1848" (1965) says that, "Puran Appu was a most resourceful and courageous man who took a leading part in the events and died a courageous death" (p.22, 26).

## Armed Rebellion

After three weeks of preparation, in the early hours of 28th July 1848, a crowd of eight to ten thousand men under Puran Appu's leadership armed with guns, spears and knives set off for Kandy from Dambulla.

The plan was for Puran Appu, Gongalagoda Banda and Dingirala to go in three different directions then meet at Katugastota and attack Kandy on Sunday the 30th of July.

Puran Appu's army first attacked Fort MacDowell in Matale. Government buildings and property were ransacked -Kachcheries, jails, rest houses and courthouse records. The coffee stores of Lieutenant General Herbert Maddock, a key advisor to the government in Kandy was set on fire.

Meanwhile, Gongalagoda Banda was attacked by British soldiers at Wariyapola and fled. A stone memorial "The rebels were dispersed here" stands on the Kandy Matale to this day (This was nearly destroyed by bulldozers expanding the road but was saved thanks to the timely intervention of 'the then Highways Minister, A.H. M. Fowzie). Dingirala was captured at Kurunegala and hanged.

The people then spontaneously proclaimed Puran Appu as the King. Rev. Fr. S. G. Perera in his "History of Ceylon for Schools" (1932) records, "At Matale crowds became unruly and burnt and ransacked some houses and proclaimed a low country man Puran Appu King of Kandy".

Then, on the 29th of July, Lord Torrington. the Governor proclaimed Martial Law. Indian troops were sent for. They sailed in the steamer "Lady Mary Wood" and landed at Trincomalee. Captain Albert Watson and his Javanese soldiers were let loose on a rampage of murder, arson, rape and looting.

**Puran Appu's army first attacked Fort MacDowell in Matale. Government buildings and property were ransacked - Kachcheries, jails, rest houses and courthouse records. The coffee stores of Lieutenant General Herbert Maddock, a key advisor to the Government in Kandy was set on fire.**

Puran Appu himself was captured on his way to Kandy on the 29th of July. A confidential letter dated 3rd August sent to the Government by a Kandyan Chief and a Proctor of the Supreme Court (probably J. A. Dunuvilla) says that Puran Appu's capture "is winning half of the battle" (Kingsley de Silva p.23).

Puran Appu was tried by a Court Martial for treason and having been found guilty was executed in Kandy on the 8th of August 1848, at the age of 35 (Coincidentally I was born in Kandy on 8th August 1941).

The Colombo "Observer" of 10th August 1848, states,"We append a Kandy letter received by yesterday's coach from which it will be seen that the notorious Puran Appu has been shot and two of his fellow rebels sentenced to transportation".

Sir Emmerson Tennent reported to Governor Torrington on 12th August 1848 that Puran Appu died "most heroically". Governor Torrington in a letter to Earl Grey, the Colonial Secretary in London dated 9th October

1849 states, "I remind you of the last words of Puran Appu. He held up his hand and said if there had been half a dozen such men as me to lead, there would not be a white man living in the Kandyan province. This is true. If there had been such leaders without doubt for a time we should have lost the country" (the original of this letter is still available at Durham University and a photocopy is in my possession). It can also be seen at the National Archives and at the Museum I set up in his old school at Moratuwa (much neglected now). The Puran Appu Statue which I had constructed in 1978 at the Moratuwa Municipality grounds is in good order and an annual commemoration is held here on the 8th of August with my laying a wreath. I had a stamp also issued to commemorate Puran.

Veera Puran Appu has a permanent place in our history as a real hero and Leader of the only People's Revolution in our history the one in 1848 which was indeed the `Year of Revolutions' the world over.





**This is quoted from "Through Winds of Fire" the autobiography of late Mr. Tyronne Fernando. He was a Foreign Minister and a Governor of the Northern and Eastern Provinces.**


---

## නව දෙවන අණදෙන නිලධාරි 6 ශ්‍රීලපාහ



**6 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ 17 වන දෙවන අණදෙන නිලධාරි ලෙසින් නි/6 25 88 මේජර් එස්ජ්‍යූජ් සෝලංග ආරච්චි පිඑස්සි ශ්‍රීලපාහ සුබ මොහොතින් පොල්තෙල් පහන දල්වා වැඩ භාරගත් මොහොත කාවයේ සටහන් වූ අයුරු.**

**බුද්ධි අංශය 6 ශ්‍රීලපාහ**






# නවත් පාබල වීරුවෙක්

වර්ෂ 1973.03.26 දින ගාල්ල රජයේ රෝහලේදී උපත ලද දෙහිගහවත්තගේ සුජිත් ලාල් අපොස (සාපෙළ) දක්වා ගා/බොනවිස්ටා මහා විද්‍යාලය වෙතින් අධ්‍යාපනය හදරා තම රැකියාව වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තෝරා ගන්නා ලදි. වර්ෂ 1993.01.26 දින ගාල්ල යුධ හමුදා කඳවුරෙන් යුධ හමුදාවට බැඳී පාඨමාලා අංක 01 මණ්ඩතිව් වෙතින් ආධුනික පුහුණු පාඨමාලාව හදාරා 7 ශ්‍රීලපාහ ඒකකය වෙත ඇතුලත්ව රාජකාරි කරන්නට විය. පසුව 10 ශ්‍රීලපාහ ඒකකය වෙත 2001.05.23 දින රාජකාරීන් සඳහා රපෝර්තු කර එතැන් පටන් මේ දක්වා ඒකකය සමගින් සියලු ක්‍රියාන්විතයන්ට සහභාගි වෙමින් ඒකකයේ දිප්තිමත් ජෙප්කොනොනියෙකු වශයෙන් රාජකාරි කරනු ලබයි.

2008 වර්ෂයේ අවසාන මාසයේ වන්නි මානුෂිය මෙහෙයුමේ මෙතෙක් ගමන්කළ හා එම මෙහෙයුමේදි ත්‍රස්තවාදින්ගෙන් මුදවා ගන්නා ලද භූමි ප්‍රදේශයන් සම්බන්ධයෙන් සළකා බලන කල අප ඒකකය වෙත ලබාදුන් භූමි ප්‍රදේශ අත්පත් කර ගැනිමේ අභියෝගය ඉතාමත් බැරෑරුම් කාර්යයක් විය. ඒ මන්දයත් මෙම භූමි ප්‍රදේශය එල්ටීටීඊ ත්‍රස්තවාදින්ගේ පරිපාලන නගරය ලෙසින් පවත්වාගෙන ගිය කිළිනොච්චි නගරයට ඇතුල්වන මුවදොර වශයෙන් සැළකු හෙයින් අප හට පිරිස් හි ආගමනය වැළැක්විම සඳහා ඒ 9 මාර්ගයේ සිට ඉරණමඩු වැව දක්වා ආරක්ෂිත පස් බැම්මක් සකසා තිබු අතර, මෙය යුධ අගල්, බිම්වෙඩි කෙත්




ආදියෙන් ගහණ වු ශක්තිමත් බංකර් පෙළක් සහිතව අඩි 08 ක් පමණ උසට පස් යොදා මෙම ආරක්ෂිත පස් බැම්ම ඉදිකර තිබිණි. එහෙත් මෙම ප්‍රදේශයේ පැවති ත්‍රස්තවාදින්ගේ දැඩි ක්‍රියාකාරකම් තුට්ටුවකට හෝ මායිම් නොකර, වන්නි මානුෂිය මෙහෙයුමේ අභිමතාර්ථයන් ඉටුකරලිමේ ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව මෙම අභියෝගය ඒකකය වෙත භාරගැනිමෙන් පසු නි/61481 ලුතිතන් කර්නල් ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්පී ආර්එස්පී පිඑස්සී ශ්‍රීලපාහගේ නිසි උපදෙස් මත මෙම ඒකක "ඒ" කණ්ඩායමේ නිලධාරි අණදෙන



නි/65138 කපිතාන් එන්පිඑච්එල්එම්කේ නාරංගොඩ ශ්‍රීලපාහ හා "බි" කණ්ඩායමේ නිලධාරි අණදෙන නි/65239 කපිතාන් කේපීටීඑල් තැලිස් ශ්‍රීලපාහ යන නිලධාරින්ගේ කණ්ඩායම් වෙත පවරන ලදි. එහිදි නි/65239 කපිතාන් කේපීටීඑල් තැලිස් ශ්‍රීලපාහ ගේ මගපෙන්විම යටතේ මෙම බැරෑරුම් කාර්යය සෙ/305151 සැරයන් ලාල් ඩිඩබ්එස් යන ජෙප්කොනොනි විසින් ස්වකිය කැමැත්තෙන් යුතුව භාරගන්නා ලදි. මෙහිදි තමන්ගේ ජිවිත අවධානම ගැන පවා නොතකා මෙරටේ ස්වෛරිභාවයට හා භෞමික අඛණ්ඩතාවයට පිළිලයක්වු බෙදුම්වාදි ත්‍රස්තවාදින්ගේ ක්‍රියාකාරකම් මෙරටින් තුරන් කිරිමේ පරම පවිත්‍ර චේතනාවෙන් යුතුව, තමන් යුද්ධ හමුදා ජිවිතයේ ලද අත්දැකිම් හා යුධ උපාය ක්‍රමවේදයන් අනුගමනය කර නිර්භිතව ක්‍රියාකරමින් සතුරා මහත් පරිශ්‍රමයක් යොදා රැක සිටි ආරක්ෂක වළල්ල අත්පත් කර ගැනිමේ ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව මෙම මෙහෙයුම දියත් කරන ලදි. මෙම භූමි ප්‍රදේශය සතුරාට අතිශයින්ම වැදගත් මෙන්ම ඔවුන්ගේ ත්‍රස්තවාදි ක්‍රියාකාරකම් තවදුරටත් පවත්වාගෙන යාම සඳහා අනිවාර්යයෙන්ම රැකගත යුතු භූමි ප්‍රදේශයක් වු බැවින්, ත්‍රස්තවාදින් විසින් සකස් කරගෙන තිබු ආරක්ෂක වළල්ලේ සිට දැඩි ලෙස ප්‍රහාර එල්ල කරන ලදි. එසේම සතුරු ආරක්ෂක වළල්ල වෙත අප හටපිරිස් හි ආගමනය වළක්වාලිම පිණිස බිම්වෙඩි කෙත්, මර උගුල් හා වෙනත් බාධක යොදා තිබු අතර, සතුරු ආරක්ෂක වළල්ල ආසන්න වෙත්ම බර අවි, සුළු අවි, කාතු හා විෂ වායු යොදමින් දැවැන්ත ලෙස ප්‍රහාර එල්ල කරන ලදි. මෙම ප්‍රහාරයන් සඳහා සාර්ථකව මුහුණදෙමින් සතුරා විසින් යොදා තිබු සියලුම බාධක ඉවත්කරමින් තමන් යටතේ සිටින අනෙකුත් සියලුම අයවළුන්ගේ ජිවිත අවධානම තමන් නතුකර ඔවුන්ගේ ආරක්ෂාවද යොදමින් ස්වකිය කැමැත්තෙන් භාරගන්නා ලද මෙම අභියෝගාත්මක කාර්යය කෙසේ හෝ ඉටුකරලිමේ අරමුණ පෙරදැරිව උපක්‍රමශිලිව සතුරු ආරක්ෂක වළල්ල වෙත ළගාවන ලදි. සතුරු ආරක්ෂක වළල්ල වෙත ළගාවෙත්ම ඔවුන් විසින් අතිරේක පිරිස්ද එම ප්‍රදේශයට ගෙන්වාගෙන අප හටපිරිස් වෙතට ප්‍රහාර එල්ල කළ අතර, එම දැඩි ප්‍රහාර මධ්‍යයේ එම භූමි ප්‍රදේශයේ කෙසේ හෝ අත්පත් කරගෙන එම ප්‍රදේශයෙන් ත්‍රස්තවාදින් පළවා හරිමින් හා ඔවුන් විනාශ කරමින් අප මාතෘ භූමියේ කුරිරු ත්‍රස්තවාදයේ සෙවණැල්ල සඳහටම තුරන්කිරිමේ ස්ථිර අරමුණින් යුතුව සතුරාගේ සුළු ප්‍රමාද දෝෂයක් නිරික්ෂණය කර තමන් සතු ආධාරක අවි සහ සුළු අවි යොදා ගනිමින් සතුරා විශ්මයටත්, පත්වන ආකාරයේ දැවැන්ත ප්‍රහාරයක් එල්ල කර සතුරු ආරක්ෂක බැම්මේ ස්ථාන 02 කින් සතුරා විසින් සකස්කර ගෙන තිබු ශක්තිමත් බංකර් 06 ක් කඩාබිඳ දමමින් ත්‍රස්තවාදින්ගේ ආරක්ෂිත පස් බැම්ම සහිත ප්‍රදේශය මුදවා ගැනිමට කටයුතු කරන ලදි. මෙහිදි ත්‍රස්තවාදින් විසින් කිලිනොච්චිය ආරක්ෂක පවුර අහිමිවිමෙන් ලද පරාජයෙන් වියරු වැටි නැවතත් ප්‍රතිසංවිධානයවි එල්ලකළ දරුණු ප්‍රහාරය හමුවේ වුවද මම වික්‍රමාන්විත ජෙප්කොනොනි ඇතුළු කුඩා කණ්ඩායම එකි සතුරු ප්‍රහාරයට සාර්ථකව මුහුණදෙමින් ගරිල්ලා සටන්කරුවන්ගේ කුට යුධ උපායන් පරාජය කිරිම සඳහා ලැබුණු උපදෙස් හා නියෝග ඒ ආකාරයෙන්ම පිළිපදිමින් තම සහෝදර සෙබළුන්ගේ ජිවිත සුරක්ෂිත කරමින් එල්ලවන ත්‍රස්තවාදි ප්‍රහාර ව්‍යර්ථ කිරිම සඳහා වික්‍රමාන්විත ලෙස කටයුතු කර ඇත. මෙහිදි ත්‍රස්තවාදින් විසින් ඔවුන්ගේ අවසන් උත්සාහය ලෙස ආරක්ෂක වළල්ල පුරාවටම කාතු / මෝටාර් සහ විෂ වායු සහිත ගෑස් ප්‍රහාරය හමුවේ වුවද අභිත ලෙස ක්‍රියාකරමින් අත්පත් කරගත් සතුරු ආරක්ෂක වළල්ල තුලම රැඳී සිටිමින් කිලිනොච්චිය පිවිසුම් දොරටුව නැවත සතුරාට අත්පත් කර ගැනිමට කිසිදු අවකාශයක් ලබා නොදි ඔවුන්ගේ සියලුම උත්සාහයන් ව්‍යර්ථ කරමින් සතුරා වෙත ශාරිරික මෙන්ම මානසික පරාජයක් ගෙනදිමට සමත් වි ඇත.

ආරක්ෂක වළල්ල අත්පත් කර ගැනිමෙන් පසුව එතැනින් නොනැවති තව දුරටත් ඉදිරියට ගමන් කිරිමේදි මෙම ජෙෂ්ඨ කොම්ෂන් නොලත් නිලධාරි හට ත්‍රස්තවාදින් විසින් වළදමා තිබු පුද්ගල නාශක බිම් වෙඩිල්ලක් පැගිමෙන් තමාගේ පාදයක් අහිමි විය. දේශය එක ධජයක් යටතට ගෙන ඒම සඳහා සමස්ත ජාතියම එක්ව ක්‍රියාකරන මෙවන් මොහොතක තමාගෙන් මව් බිමට ඉටුවිය යුතු මාහැගි යුතුකම ඉතා විශිෂ්ට ලෙස ඉටුකරමින් සිටියදි මෙම ජෙප්කොනොනි තමාගේ පාදයක් අහිමි විමෙන් ස්ථිර ආබාධිත තත්ත්වයට පත් විය. මෙලෙසින් යුධබිමේ රණ ගොස පතුරවා මවුබිමට කිර්තියක් ගෙනඑමින් සිදුකළ මෙහෙයට මෙම කොම්ෂන් නොලත් නිලධාරි හට **වීර වික්‍රම විභූෂණ පදක්කම** හිමි ගැන්විමට අණදෙන නිලධාරි නි/61481 ලුතිතන් කර්නල් ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්පී ආර්එස්පී පිඑස්සී ශ්‍රීලපාහ විසින් නිර්දේශ කරන ලදි.

බුද්ධි අංශය 10 ශ්‍රීලපාහ



# අන්තර් රෙජිමේන්තු ප්‍රායෝගික රයිෆල් තරගාවලිය 2010




2010 අන්තර් රෙජිමේන්තු ප්‍රායෝගික රයිෆල් තරගාවලිය 2009.12.13 වන දින සිට 2009.12.18 වන දින දක්වා දියතලාව ප්‍රගුණ වෙඩික්කරු පුහුණු පාසල විසින් සංවිධානය කරන ලදී. ඒ සඳහා අප රෙජිමේන්තු වෙඩිතැබීම් කණ්ඩායම ඉතා අඩු පුහුණු කාල සීමාවක් තුල පුහුණුවී නවකයින් රාශියක් සමගින් තරගාවලිය සඳහා ඉදිරිපත් වී ජයග්‍රහණ රාශියක් සතු කර ගන්නා ලදී.

මෙහිදී අප රෙජිමේන්තු වෙඩිතැබීම් අංශයේ සාමාජිකයන් මෙන්ම කණ්ඩායමට ඇතුලත් වූ නවක වෙඩි කරුවන් තම සැඟවුනු දක්‍ෂතා පිළිඹිබු කිරීම අප රෙජිමේන්තුව ලද සුවිශාල ගෞරවයකි. ජයග්‍රහණයකි. එසේම මෙවන් දක්‍ෂතා ඉස්මතුවීම රෙජිමේන්තුවේ වෙඩිතැබීම් අනාගතය ගැන කියාපාන සුබ ලකුණක් සේ සැලකීය හැක. අප වෙඩිතැබීම් කණ්ඩායම මෙම තරගාවලියේදී ආධුනික අංශයේ දෙවන ස්ථානය දිනාගනිමින් රිදී පදක්කම සතුකර ගැනීමට සමත්වන ලදී. කෙසේ නමුත් මෙම ජයග්‍රහණ තුලින් අප රෙජිමේන්තු වෙඩිතැබීම් අංශය සියල්ලෙන් පරිපූර්ණව ඇතැයි නොසිතමු. අපට තරගකාරී අභියෝගාත්මක ඉදිරි ගමනක් ඇත. එයට මුහුණ දී සමස්ත හමුදාවේම වෙඩිතැබීම් තරග ජයගැනීමට සියලු පාබල සාමාජිකයින් අධිෂ්ඨාන කරගත යුතුය.

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ජගත් කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාභ ගේ සෘජු අධීක්‍ෂණය සහ දිරිගැන්වීම අප ඉතා අගය කොට සලකන්නෙමු. එමෙන්ම නිබඳවම වෙඩිතැබීම් ගැන සොයාබලා අපව දිරිමත් කරන 611 බලසේනාධිපති ලුතිතන් කර්නල් ජීඑම්සීකේබී ඒකනායක ආර්එස්පී ශ්‍රීලපාභ ගේ මග පෙන්වීම හා අධික වැඩ රාජකාරි මධ්‍යයේ වුවද දුරකතනයෙන් හෝ සෑම දිනම තරගකරුවන් අමතමින් මෙම තරගය සඳහා කෙසේ මුහුණ දිය යුතුද යන්න සොයා බැලීම ඉතා ප්‍රයෝජනවත් විය. එමෙන්ම 19 ශ්‍රීලපාභ අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් පීඩීවයිආර් පෙරේරා ආර්එස්පී ශ්‍රීලපාභ විසින් වෙඩික්කරුවන්ගේ මානසික මට්ටම ඉහළ නැංවීමට ගත් උත්සාහයද ඉතා අගය කොට සලකමි.

කරුණු කෙසේ වුවද අප සතු වගකීම වන්නේ නව වෙඩික්කරුවන් සොයා යාම සහ සැඟවුනු දක්ෂතා ඇති වෙඩික්කරුවන් හඳුනාගෙන රෙජිමේන්තු වෙඩිතැබීම් අංශය ශක්තිමත් කිරීමයි. මෙම ක්‍රියාදාමය තුලින් රෙජිමේන්තුවේ වෙඩිතැබීම් අනාගතය ශක්තිමත් වන බව නොරහසකි. මේ සඳහා දැනට රෙජිමේන්තු අධිපති තුමාගේ සංකල්පයකට අනුව අප සැම පෙළගැසෙමින් සිටින්නෙමු. එය අදට නොව හෙට දිනට ශ්‍රී ලංකා පාබල හමුදාවේ සියලු සාමාජිකයින් හට සතුටට කරුණක් වනු ඇත.

දක්‍ෂතා තමන් සතුව ඇත. ඔපගැන්වීම කළ යුතුව ඇත. උනන්දුව කැපකිරීම කැපවීම තුලින් ජයග්‍රහණය සොයා යා හැක. ඒ සඳහා අප සැම පෙළ ගැසෙමු.

වෙඩිතැබීමේ අංශය, රෙම ශ්‍රීලපාභ









# 2 වන ආධාරක බලඇණිය ශ්‍රීලපාහ පළමුවන සංවත්සරය සැමරූ වගයි

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ නවතම සාමාජිකයෙක් ලෙස 2008.12.01 දින යුධ හමුදාවේ විවිධ රෙජිමේන්තු වලට අයත් යුධබිමේදී තුවාල ලත් නිලධාරි/සෙනින්ගේත් සමන්විතවී 2 වන ආධාරක බළඇණිය ශ්‍රීලපාහ අභිනවයෙන් යුතුව 563 බසේමු යටතේ ඕමන්තේ ප්‍රදේශයේ ආරම්භ කරන ලදී.



දෙවන අණදෙන නිලධාරි විසින් බළඇණි මූලස්ථානය වෙත අණදෙන නිලධාරි කැඳවා ගෙන ඒමෙන් පසු ඒකක ධජය එසවීම සිදු කරන ලදී. ඉන් අනතුරුව රෙජිමේන්තු ගීතය ගායනා කිරීම සහ මියගිය රණවිරුවන් සිහි කරමින් විනාඩි 02ක නිශ්ශබ්දතාවයක් සිදු කරන ලදී. අණදෙන නිලධාරි තුමාගේ සංකල්පයක් මත ඒකකයේ රාජකාරි කරනු ලබන නිලධාරි / සෙසුනිලයින් හට හා බළඇණියේ මියගිය ජ්‍යෙකොනොනි සහ සිවිල් සේවක මහතා සිහි ගන්වමින් සේවා ප්‍රණාම සහතික ප්‍රදානය කරන ලදී. අනතුරුව අණදෙන නිලධාරි විසින් සියලුම අයවළුන් ඇමතීම සිදු කරන ලදී.

බළඇණි දිනය සනිටුහන් කරනු වස් අණදෙන නිලධාරි ගේ ආරාධනාවෙන් වැඩම කරන ලද ඇමරිකාවේ තෙරුවන් නමදිමු සංවිධානයේ අනුශාසක පූජ්‍ය යටිරාවන විමල හිමියන් සහ අණදෙන නිලධාරි විසින් අඹ පැලය බැගින් රෝපණය කරන ලදී. බළඇණි මූලස්ථානයේ නව බුදු මැදුර පූජ්‍ය යටිරාවන විමල හිමියන් විසින් ආගමික වතාවත් සිදුකර අප බළඇණිය වෙත භාර කිරීම ද එම සමරු ඵලකය අණදෙන නිලධාරි විසින් නිරාවරණය කිරීම සිදු විය. පසුව බළඇණි මූලස්ථානයේදී සියලුම අයවළුන්ගේ සහභාගිත්වයෙන් තේ පැන් සංග්‍රහයක් පවත්වන ලද අතර, සියලුම නිලයින් නියෝජනය වන පරිදි අණදෙන නිලධාරි ගේ ප්‍රධානත්වයෙන් දිවා



හෝජන සංග්‍රහක් ද පවත්වන ලදී. ඉන් අප බළඇණියේ රාජකාරි කරනු ලබන සිවිල් සේවක මහතුන් හට ත්‍යාග ලබා දීමක් ද සිදු කිරීමෙන් පසු උත්සව කටයුතු අවසන් විය.

අප බළඇණි දිනට සමගාමීව ඇමරිකාවේ තෙරුවන් නමදිමු සංවිධානයේ අනුශාසක පූජ්‍ය යටිරාවන විමල හිමියන් විසින් අප ඒකකයේ සහ අවට ඒකකයන් හි ඇස් පෙනීම දුර්වල නිලධාරි/සෙනින්හට අක්ෂි සායනයක් පවත්වා ඇස් කන්නාඩි ලබා දෙන ලදී. එම උත්සවය සඳහා ඇමරිකාවේදී ලොස් ඇන්ජලීස් නුවර බෞද්ධ විහාරාධිපති හිමියන් සහ නිව්යෝක් නුවර විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් ද වැඩම කරන ලදී.

බළඇණිය ස්ථාපන කර වසරක් සපිරෙන මේ මොහොතේ අනිකුත් බළඇණි හා උරෙන් උර ගැටෙමින් විවිධ වූ අපහසුතාවයන් මධ්‍යයේ වුවද ඉතා කෙටි කාලයක් තුලදී යුධ හමුදාවේ දීප්තිමත් බළඇණියක් ලෙස පෙරට ඒමට හැකිවූයේ ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලයින්ගේ අපරිමිත ධෛර්යයත් නොපසුබට උත්සාහයත් නිසා බැව් සඳහන් කරනු ලබන අතරම, අප බළඇණියේ ඉදිරි අනාගතය සාර්ථකව සිදුකරලීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවා! යි එක සිතින් ප්‍රාර්ථනා කරමු.

බුද්ධි අංශය 2 ආබ ශ්‍රීලපාහ



# 18 (සේවා) ශ්‍රී ලංකා පාබල හමුදාව අභිමානවත් පළමුවන වසර සැමරූ වගයි...

අභිමානවත් දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ තවත් එක් සුවිශේෂි සංධිස්ථානයක් සනිටුහන් කරමින් වර්ෂ 2008 ඔක්තෝම්බර් මස 15 දිනැති යුධ හමුදා නියෝගය අනුව 2009 ජනවාරි මස 01 වන දින පාබල රෙජිමේන්තු පවුලේ 18 වන සාමාජිකයා ලෙස යුධ



හමුදා ඉතිහාසයට එක්වූ අප බළඇණිය 2010 ජනවාරි මස 01 වන දින පන්ඩිසුඩාන් පරන්තන් ප්‍රදේශයේ දී පළමු වන බළඇණි සංවත්සරය අභිමානවත් සහ චාම් ලෙස සමරන ලදී.

ඒකකය ආරම්භයේ සිට මේ දක්වා අප ඒකක නියමුවා වශයෙන් ප්‍රථම ඒකක අණදෙන නිළධාරි මේජර් යු වනිගසූරිය ශ්‍රීලපාහ ගේ ඍජු නිවැරදි අණ දීම හා මගපෙන්වීම යටතේ දෙවන අණදෙන නිලධාරි වශයෙන් මේජර් ජේඑච්එම්එස්එස් ජයසුන්දර ශ්‍රීලපාහ, නිලධාරි අණදෙන "ඒ" කණ්ඩායම මේජර් එල්කේඑම් ධනපාල ශ්‍රීලපාහ, නිලධාරි අණදෙන "බී" කණ්ඩායම කපිතාන් ඩීඑස්පීකේ ද සිල්වා ශ්‍රීලපාහ, නිලධාරි අණදෙන "සී" කණ්ඩායම කපිතන් කේබීජී අත්තනායක ශ්‍රීලපාහ,නිලධාරි අණදෙන "ඩී"කණ්ඩායම ලුතිතන් පීඑල්ජී වික්‍රමසිංහ ශ්‍රීලපාහ, විධායක අධිකාරි ලුතිතන් බීඒබීආර් පෙරේරා ශ්‍රීලපාහ යන නිලධාරීන් විසින් අණදෙන නිලධාරි හට ශක්තියක් විය. 612 බලසේනා ප්‍රදේශයේ 61 වන සේනාංකය යටතේ පළමුව ක්‍රියාන්විත රාජකාරි ආරම්භ කර ඉන් පසුව 58 වන සේනාංකය යටතේ 583 බලසේනා ප්‍රදේශයේද, 57 වන සේනාංකය යටතේ 573 බලසේනා ප්‍රදේශයේ ද වන්නි මානුෂික මෙහෙයුමට සහභාගි වීමෙන් පසු පන්ඩිසුඩාන් පරන්තන් ප්‍රදේශය නිසැක කිරීමේ සෝදිසි මෙහෙයුම් හි නිරතව සිටියි. ඒකකය ආරම්භ කළ දින සිට වන්නි මානුෂීය මෙහෙයුම සඳහා සහභාගී වී දැඩි කැපවීමෙන් කටයුතු කළ අප බළඇණිය වෙත පැවරෙන රාජකාරි හැකි උපරිම අයුරින් ඉටුකරමින් වසරක් තුළ විශාල ප්‍රගතියක් ලබා ඇති බව සිහිපත් කරනුයේ අභිමානයෙන් යුතුවයි.

මෙවන් පසුබිමක් තුළ පළමුවන බළඇණි සංවත්සරය ඒකකය ස්ථානගත පන්ඩිසුඩාන් පරන්තන් ප්‍රදේශයේදී ආගමික වතාවත් වලට මුල් තැන දෙමින් ඉතාමත් චාම් අන්දමින් පැවැත්විනි. උත්සව කටයුතු ආරම්භ කරමින් 2010 ජනවාරි මස 1 දින ඒකක අණදෙන නිලධාරි විසින් කඳවුරු සම්මාන මුරය පිළිගන්නා ලදී. ඒකක ධජය එසවීමෙන් අනතුරුව මව්බිමේ ඒකීය භාවය භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් දිවි කැප කළ රණවිරුවන් සිහිකිරීම උදෙසා විනාඩි දෙකක නිශ්ශබ්දතාවයක් ආරක්ෂා කිරීමෙන් පසු සියලුම නිලයින් අමතා හරවත් දේශණයක් අණදෙන නිලධාරි විසින් පැවැත්වූ අතර, සාමකාමී වාතාවරණයක් පැවති නිසා මෙම අවස්ථාව සඳහා ඒකකයේ සියලුම නිලධාරීන් සහ බනි/ජේක්කොනොනීන්ද, සෙසුනිලයන්ද විශාල පිරිසක් සහභාගි වන ලදී. මෙහිදී රැස්ව සිටි පිරිස අමතා ඒකකය වෙනුවෙන් කළ සේවය අගය කරමින් ඒකකයේ සේවයේ නියුතු සියලුම නිලධාරීන්ටත්, සෙසුනිලයන්ටත් සිවිල් සේවක මහතුන්ටත්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් සුබ පතමින් අණදෙන නිලධාරි විසින් සිය හරවත් දේශණය අවසන් කරන ලදී.

ඉන් අනතුරුව සියලුම නිලයින් සඳහා තේ පැන් සංග්‍රහයක් සූදානම් කර තිබූ අතර, මෙම අවස්ථාව සඳහා ඒකක අණදෙන නිලධාරි ගේ ප්‍රධානත්වයෙන් චිරාගත සම්ප්‍රදානුකූලව දෙවන අණදෙන නිලධාරි, විධායක අධිකාරි සහ කණ්ඩායම් නිලධාරි අණදෙනවරුන් විසින් පොල්තෙල් පහන දල්වා තේපැන් සංග්‍රහය ආරම්භ කරන ලද අතර, සියලු දෙනා විසින් තේපැන් සංග්‍රහය සතුටින් භුක්ති විඳින ලදී.

ඉන් අනතුරුව අණදෙන නිලධාරි ගේ ආරාධනයෙන් 573 බලසේනාධිපති ලුතිතන් කර්නල් පීඑච්එන් සිරිශාන්ත, ශ්‍රීලපාහ හා අණදෙන නිලධාරි දෙවන අණදෙන නිලධාරින්ගේ ප්‍රධානත්වයෙන් ඒකකයේ සියලුම අයවලුන්ගේ සහභාගිත්වයෙන් උත්කර්ෂවත් ලෙස දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදී.




තවද එදින ඒකක මූලස්ථානයේ ස්ථාපිත බුදුගෙය සහ බෝධීන් වහන්සේ අභියස බෝධි පූජාමය පිංකමක් පවත්වා ක්‍රියාන්විතයේදී දිවි පිදූ හා තුවාල ලැබූ රණවිරුවටත් පිං අනුමෝදනා කිරීම සහ ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමත් සේවයේ නියුතු අණදෙන නිලධාරි ඇතුළු සියලුම නිලධාරීන්ටත් සෙසුනිලයන්ටත් තම මව් බිම වෙනුවෙන් සේවය කිරීමට අවශ්‍ය ධෛර්ය හා ශක්තිය ලබා දීමත් සියලුම රණවිරුවන්ගේ හා සිවිල් සේවක මහතුන්ගේ පවුල්වල ඥාතීන්ටත් ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ලබා දීමෙන් අනතුරුව පළමුවන බළඇණි උත්සව මාලාව අවසන් කළ අතර, ශ්‍රීලංකා යුධ හමුදාවේ පාබල හමුදා රෙජිමේන්තුවේ දීප්තිමත් ගෞරවාන්විත ඒකකයක් ලෙස තම ඒකක උදෘත පාඨය වන " සේවය කරමි " යන්න මුල් තැන්හි තබා මව්බිම වෙනුවෙන් චිරාත් කාලයක් සේවය කිරීමට අවශ්‍ය ධෛර්ය ශක්තිය ලැබේවා!යි ප්‍රාර්ථනා කරන්නෙමි.

ලුතිතන් (උපා) පීජී චන්ද්‍රවිමල් ශ්‍රීලපාහ

**මිතුරුව සිටීමට කාලය ගන්න. එය සතුටු වීමේ මාධ්‍යයයි.**

THE WHITE HACKLE

# ඔබේ ලග්නයට අනුව සෑදීමට ඉඩ ඇති ලෙඩ රෝග

**ජ්‍යෝතිෂයයි ඔබයි**

**මේෂ ලග්නය :** හිස රුදා, පොල් පැලීම, දද තුවාල, ඉදිමුම්, කුරුලෑ, වසූරිය, විදුරු මස් රෝග, හිසකේ වැටීම, ලේ රෝග, පිත් රෝග ආදියයි.

**වෘෂභ ලග්නය** : උගුරේ සහ බෙල්ලේ සෑදෙන රෝග, තුවාල ආදිය

**මිථුන ලග්නය** : නහර ගත වාත රෝග, උරහිස් සහ අත්වල සෑදෙන රෝග ලේ නරක් වීම, උමතු රෝග ආදියයි.

**කටක ලග්නය** : බඩවැල්වල රෝග, ජඨරාග්නියේ රෝග, පපුව, පයෝධර යන ස්ථානවල සෑදෙන පිළිකා ආදියයි.

**සිංහ ලග්නය** : දෑලවර, හෘදය, ඇස්, පිට යන මේ තැන් හි සෑදෙන රෝග, පිත්තාධික රෝග, සෙංගමාල ආදියයි.

**කන්‍යා ලග්නය** : උදරයේ, බොක්ක අණ්ඩකෝෂය යන ස්ථානවල සෑදෙන රෝග, ක්‍රිමි හා වාත රෝග ආදියයි.

**තුලා ලග්නය** : ලේ කෝප රෝග, තුනටියේ හා මුත්‍රා බොක්කේ රෝග ආදියයි.

**වෘශ්චික ලග්නය** : මුත්‍රාශය, ගර්භාශය, වස්ති මාර්ගය යන මේ තැන්වල සෑදෙන රෝග ආදියයි.

**ධනු ලග්නය** : ගින්නෙන්, උෂ්ණයෙන් සෑදෙන රෝග, ක්‍රීඩා වලින්, දිවීමෙන්, අසුන් ආදීන්ගෙන් පැමිණෙන තුවාල, කලව, තට්ටම් යන තැන්වල සෑදෙන රෝග, ලේ කෝපයෙන් හටගන්නා ආබාධ ආදියයි.

**මකර ලග්නය** : දණිස් රෝග, තුවාල, කුෂ්ට, පිළිකා ආදී හමේ හටගන්නා රෝග ආදියයි.

**කුම්භ ලග්නය** : කකුල්, කෙණ්ඩ යන තැන්වල සෑදෙන රෝග, වාත රෝග, නහර ගත ආබාධ ආදියයි

**මීන ලග්නය** : පාද රෝග, හොරි, වණ, පාද සීතල වීමෙන් බඩේ සෑදෙන රෝග, අධික සෙම් පහවීම් ආදියයි.

ඕ. ඇන්ඩිරියස් පෙරේරා ඩී. අයි. එම්. ඇස්. (ලංකා) විසින් සම්පාදනය කරන ලද "ජ්‍යෝතිෂය ස්වාධ්‍යයනය හෙවත් නක්‍ෂත්‍ර ගුරුවරයා යන කෘතිය ඇසුරිනි)

---

## යුධ හමුදාව ගැන අදහස්

☞ ලිබරල්වාදීන් පවසන අන්දමට සන්නද්ධ හමුදා සහ පොලීසිය ජනතාවගේ ආරක්ෂකයෝ වෙති. නීතිය හා සාමය රැක රටේ ජනතාවට ශාන්ත ජීවිතයක් සහතික කිරීමේ ක්‍රමය එයයි.

☞ පැසිස්ට්වාදීන් පවසන අන්දමට සන්නද්ධ හමුදා සහ පොලීසිය රටේ පරම පාලකයෝ සහ ගැලවුම් කාරයෝ වෙති. ඔවුහු දූෂණය මුලිනුපුටා දමනු ඇත. විනය රැකීම සහතික කරනු ඇත. රටට කීර්තිය ලබා දෙනු ඇත.

☞ මාක්ස්වාදීන් කියන අන්දමට සන්නද්ධ හමුදා සහ පොලීසිය පාලක පන්තියේ ආයුධ වෙති.

## සෙබල සිතින් ලියන වග නම්...

ත්‍රස්තවාදය....... භීතිය දනවන වදනක්.......
එදවස අද රටේ සියලුම ජනයා........
සාමයෙන්..... සමගියෙන් සිටියහ....
නිකමටමෙන් මට සිහිවුයේ පෙර වසර 33ක
කාලයක්.... රජ කළ උතුරේත්.........
නැගෙනහිරත් අර මිනීමරු ත්‍රස්තවාදය.........
බිය වද්දා
තිබුනේ..... පව් අසරණ මිනිසුන්.......... කබලෙන්
ලිපට වැටුනා.........

ලක් දෙරණ ඒ ත්‍රස්තවාදයෙන් රට මුදා
ගන්නා.... සෙබළ මිතුරනේ ලෝකයේ....
ත්‍රස්තවාදය...... විනාශ කළ..... මේ ලෝකයේ
එකම...... රට..... මේ....... ඉන්දියන් සාගරයේ....
මුතු ඇටය තමයි.

2/ලුතිතන් එච්ආර්එන් සංජීව ශ්‍රීලපාහ
23 ශ්‍රීලපාහ



# 1 ශ්‍රීලපාහ 26 වන අණදෙන නිලධාරි



1950 මැයි 12 වන දින අභිමානයෙන් ආරම්භ කරන ලද පළමුවන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව පුරා දශක හයක් තිස්සේ මව්බිමේ ඒකීයභාවය උදෙසා ''සේවය කරමි'' යන උද්ධෘත පාඨය පෙරදැරි කර ගනිමින් මව්බිමට සේවය ලබා දුන් අද්වීතීය බළඇණියකි. ඒකකය වෙතින් දෙස් විදෙස් වෙත ලබා දුන් දායකත්වය අගයමින් රාජිනි වර්ණ / ජනාධිපති වර්ණයන්ගෙන්ද පිදුම්ලත් පළමුවන බළඇණිය ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියයි.

1999 වසරේ සිට මන්නාරමේ ස්ථානගතව සිට 2006 අගෝස්තු 11 වන දින මුහමාලේ ඉදිරි ආරක්ෂක වළල්ල විනිවිද යෑම උදෙසා ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන ලද ප්‍රහාර මැඩ පැවැත්වීමට කඩිනමින් එම ස්ථාන වෙත යොමුකරන ලද පළමුවන බළඇණිය ත්‍රස්තවාදීන් වෙත ප්‍රතිප්‍රහාර එල්ල කරමින් ත්‍රස්තවාදීන් පලවා හරින ලද අතර, එමගින් යාපනය අර්ධද්වීපය ත්‍රස්තවාදි ප්‍රහාරයෙන් රැක ගැනීමෙහි ලා තම දායකත්වය ලබාදෙන ලදි. එතැන් පටන් මුහමාලේ ඉදිරි ආරක්ෂක වළල්ලේ බලය තහවුරු කර ගනිමින් සීමිත ක්‍රියාන්විතයන්හි නිරතවී යාපනය අර්ධද්වීපයම රැකගන්නා ලද අතර, 2009 නොවැම්බර් මස 15 දින සිට පුරා දින පහක් නොකඩවා යුධ වදිමින් මුහමාලේ ඉදිරි ආරක්ෂක වළල්ල බිඳ අද්විතිය මෙහෙවරක යෙදීනි.

එතැන් පටන් නගර්කෝවිල් සිට පුදුමාතලන් උතුර දක්වා බලය අත්පත් කර ගනිමින් මානුෂීය මෙහෙයුමට ජීවිත පරිත්‍යාග යෙන් දායකත්වය ලබාදෙන ලදි.

පුදුමාතලන් උතුරු ප්‍රදේශය අත්පත් කර ගනිමින් ක්‍රියාන්විතයෙහි යෙදී සිටියදී 2009 මාර්තු 05 වන දින දෙවන අණදෙන නිලධාරි වශයෙන් පත්වීම් ලබා ගනිමින් නි/61989 මේජර් ඩබ්එස්කේ ලියනවඩුගේ ශ්‍රීලපාහ බළඇණිය වෙතට සපැමිණ එවකට අණදෙන නිලධාරි ලෙස කටයුතු කළ ලුතිතන් කර්නල් සී රණවිර ආර්එස්පී ශ්‍රීලපාහ යටතේ බළඇණියට ශක්තිය ලබාදෙන ලදි. ලුතිතන් කර්නල් සී රණවිර ආර්එස්පී ශ්‍රීලපාහ 563 බසේමු හි බලසේනාධිපති



වශයෙන් පත්ව බළඇණියෙන් සමුගැනිමෙන් පසු 1 වන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදාවේ අභිමානවත් 26 වන අණදෙන නිලධාරි වශයෙන් වර්ෂ 2009 ක් වු නොවැම්බර් මස 17 වන දින වැම්පියන්පත්තු කඳවුරේදී ශුභ මොහොතින් රාජකාරිය භාරගන්නා ලදි.

අතීතයේ සිට පැවැත එන චාරිත්‍ර සම්ප්‍රදායන් රැකගනිමින් බළඇණිය ඉදිරියට ගෙනයාමටත් 1 වන බළඇණිය සෑම ස්ථානයකදීම සෑම අවස්ථාවකදීමත් 1 වන බළඇණිය විය යුතු බවටත්, කරවිය යුතු බවටත්, 26 වන අණදෙන නිලධාරී තුමන් දුන් ප්‍රතිඥාව සැබෑවීමට ධෛර්යය ශක්තිය ලැබේවා!යි අපි ප්‍රාර්ථනා කරන්නෙමු.

බුද්ධි අංශය 1 ශ්‍රීලපාහ

## ඔබත් සෙබල බිරියක් ද .....?

- ඔබේ සැමියා වීරයෙක් බව ඔහුට නොහැගෙනා පරිදි නිතර නිතර හඟවන්න.. එවිට ඔබට වඩාත් ආදරය කරාවි.
- ඔහු ගැන තරහක් ඇතිවන සෑම විටම දේශාභිමානි ගීතයකට සවන් දෙන්න. එවිට ඔබට ඔහු ගැන වඩ වඩාත් ආඩම්බර සිතේවි.
- තමා ගැන ආත්මානුකම්පාවක් ඇති වන සෑම විට අත්මාභිමානයක් ඇති කර ගන්න. එවිට ඔබ රණවිරුවෙකුගේ බිරියක් ලෙස සතුටු සිතේවී.
- ඔබට තනිකමක් දැනෙනා සෑම විටම ඔබේ කුසගින්න ගැන සිතන්න. එවිට ඔබේ සැමියාගේ රැකියාව කුමක්දැයි මතක් වේවි.
- තම දරුවන්ට චිත්ත පෝෂණය මෙන්ම උපයෝගී නායකතවයද ලබා දෙන්න උත්සහ කරන්න. එවිට ඔහු ඔබ ගැන ආඩම්බර වේවි.
- ඔබේ කඳුළු වලට වඩා ඔහු ඉදිරියේ සිනාසී සිටින්න උත්සාහ කරන්න. එවිට ඔහු, ලාලිත්‍යයෙන් පිරි සුන්දර ගැහැණිය ඇතුලත ඇති පිරිමි සිතද හදුනාගනීවි.
- ඔබේ සැමියාව කිසිවිටකත් සෙබළකු ලෙස නිවසට වද්දවා නොගන්න. එවිට ඔබේ නිවසද යුධ පිටියක් වනු ඇත.

ඉරේෂා එදිරිවීර
ලුතිතන් කර්නල් ඊඑපී එදිරිවීරගේ බිරිය

**පළමුව සිතන්න දෙවනුව ක්‍රියාකරන්න.**


' උදාරයි ඔබ' උත්සව අවස්ථාවට සපැමිණි ආරාධිත අමුත්තන් පිළිගනිමින්
ප්‍රධාන ආරාධිතයා වූ ජනාධිපති ලේකම්
ලලිත් වීරතුංග මැතිතුමාගේ සම්ප්‍රාප්තිය
චිරාගත
සම්ප්‍රදායානුකූලව
පොල්තෙල් පහන්
දැල්වීම
සේවා දානයට

# ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ විසි වසරක උදාරත්වය සැමරීමේ දසුන්



ශ්‍රී ලංකා පාබල හමුදා රණවිරු ස්මාරකයට මුල්ගල තැබීමේ විවිධ අවස්ථා

වර්ෂ 1881 අප්‍රේල් මස 01 වන දින ලංකා ස්වේච්ඡා පාබල හමුදාව නමින් අංක 4369 දරණ ගැසට් පත්‍රය මගින් ස්ථාපනය වී ක්‍රමක්‍රමයෙන් ව්‍යප්ත වීමත් සමග ඒකක කිහිපයක් බිහි විය. ලංකාවට නිදහස ලැබීමෙන් පසු 1949 අංක 17 දරණ යුද හමුදා පනත මගින් එතෙක් ස්වේච්ඡා ඒකකයන්ට සීමා වූ යුද හමුදාව තුල නිත්‍ය ඒකකයන් ද ස්ථාපනය විය. පසුව 2 (සේවි) ශ්‍රීලපාහ හා 1 ශ්‍රීලපාහ නමින් ඒකක දෙකක් අවස්ථා දෙකකදී බිහිවිය. ලෝක මහා සංග්‍රාමයන්ටද ලංකා පාබල හමුදාව සහභාගිවී ඇති බව ප්‍රකට කරුණකි.'එම සංග්‍රාමයන් පිළිබඳව ඒකක ඉතිහාසයේ සනිටුහන් වී ඇති අතර ඉන් පසු රටේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් අගනා සේවයක් ඉටු කර 1985 දෙසැම්බර් 16 වන දින 3 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ද 1987 මැයි මස 5 දින 4 ශ්‍රීලපාහ ද. 1987 අගෝස්තු මස 15 වන දින 5 (සේවි) ශ්‍රීලපාහ ද නගා සිටුවීමෙන් යුද හමුදාව තුල කැපී පෙනෙන රාජකාරියක් ඉටු විනි. මෙම ඒකකයන් වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලංකා පාබල හමුදාව 1989 ඔක්තෝබර් මස 23 වන දින පනාගොඩ 1 ශ්‍රීලපාහ භූමියේදී ස්ථාපනය විය. ආරම්භයේදී නිත්‍ය ඒකක 3 ක් හා ස්වේච්ඡා ඒකක 2 කින් සමන්විත වුවද 20 වන රෙජිමේන්තු සංවත්සරය සමරන අවස්ථාව වන විට නිත්‍ය ඒකක 13 ක්ද ස්වේච්ඡා ඒකක 9 ක්ද ආධාරක බළඇණි 5 කින්ද සමන්විත වේ. 2009 ඔක්තෝබර් මස 23 වන දිනට වසර විස්සක් සපිරීම නිමිත්තෙන් ඉතා උත්කර්ෂවත් ලෙසින් දශක දෙකක උදාරත්වය විදහා පාමින් 2009 දෙසැම්බර් මස 18 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී සමරන ලදි. එහිදී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මැතිතුමා හා ශ්‍රී ලංකා යුද හමුදාපතිතුමා ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගි වු අතර, මෙහිදී වැඩසටහන් රාශියක් සිදු කරන ලදි. එම වැඩසටහන් අතුරින් කිහිපයක් සඳහන් කරන්නේ නම්.

1 දශක තුනක් මුළුල්ලේ පැවති රුදුරු ත්‍රස්තවාදය ශ්‍රී ලංකාව තුලින් තුරන් කිරීමට ප්‍රාණ දානයෙන් කැප වු රණවිරුවන් 3807 දෙනා වෙනුවෙන් ඉදිකරන්නට සැලසුම් කළ ස්මාරකය වෙනුවෙන් මුල්ගල තැබීම ජනාධිපති ලේකම්තුමා අතින් සිදු කිරීම හා එම රණවිරුවන්ගේ ළඟම ඥාතීන් වෙත ප්‍රණාම සහතික ලබා දීම.
2 තුවාල ලබා ආබාධිත වී කාය දානයෙන් කැපවු රණවිරුවන් වෙනුවෙන් ප්‍රණාම සහතික ප්‍රදානය කිරීම.
3 රෙජිමේන්තුව වෙත තම තාරුණ්‍යය කැප කර දැනට විශ්‍රාම ලබා සිටින ඥාණ දානයෙන් කැපවූවන්ට ප්‍රණාම සහතික ප්‍රදානය කිරීම.
4 දැනට සේවයේ නියතු 18000 කට අධික ශ්‍රීලපාහ සමාජිකයින්ට සේවා දානය වෙනුවෙන් ප්‍රණාම සහතික ප්‍රදානය කිරීම.
5 මෙම සියලු දෙනාට අභිමානවත් සේවයක් කිරීම සඳහා උපරිම දායකත්වයක් දක්වමින් ශක්තියක් ධෛර්යයක් වු රණවිරු බිරින්දෑවරු ඇගයීමට ලක්කිරීම.
6 අවසන් මානුෂීය මෙහෙයුම සඳහා සක්‍රීයව දායක වු ඒකක සඳහා සමරු ඵලකයක් ලබාදීම.
7 ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට අඩුපාඩුවක්ව පැවති නිල වෙබ් අඩවියක් ජනාධිපති ලේකම්තුමා අතින් ආරම්භ කිරීම.
8 මියගිය රණවිරුවන් වෙනුවෙන් පිරිත් සජ්ඣායනයක් සිදුකර පසු දින මහා සංඝයා වහන්සේලා වෙත හිල් දානය පුජා කිරීම.

මෙම කාර්යයන් සිදු කිරීම සඳහා රෙජිමේන්තු අධිපති, සේනාවිධායක හා රෙම ශ්‍රීලපාහ කාර්ය මණ්ඩලයේ විශිෂ්ට සහය මෙන්ම සියලුම ඒකක අණදෙන නිලධාරීවරු ඇතුළු සියලුම දෙනාගේ සහය ලැබුණි. එම සහයෝගය මත විසිවන රෙජිමේන්තු සැමරුම "සේවය කරමි" යන උද්ධෘත පාඨය පෙරටු කර " උදාරයි ඔබ" සංකල්පය මත උදාර ලෙසින් සිදු කිරීමට හැකි විය.



රෙජිමේන්තුවේ ප්‍රණාමය



ප්‍රණ දානයට රෙජිමේන්තුවේ ප්‍රණාමය



ඥාණ දානයට රෙජිමේන්තුවේ පුණ්‍යාමය





සේවා වනිතාවන්ගේ සේවය ද අගයමින්



උත්සව සභාව අමතන ජනාධිපති ලේකම්තුමා



උත්සව සභාව විචිත්‍රවත් කරමින්


# ශ්‍රී ලංකා පාබල හමුදාවේ විසි වසරක




කාය දානයට රෙජිමේන්තුවේ පුණ්‍යාමය



සදාතුක කරඬුව පෙරටුකරගත් මහා සඟ රුවන පිරිත් මණ්ඩපයට වඩින අයුරු



පිරි



තුනු



උත්සවයේ ප්‍රථම අධියර සමාප්තියේ ජාතික ගීය වාදනය



පසු දින හීල් දානය







අන්තර්ජාලයට එක්වෙන ශ්‍රීලපාත





උත්සව සභාව අමතන රෙජිමේන්තු අධිපතිතුමා





ජනාධිපති ලේකම් ගරු ලලිත් වීරතුංග මැතිතුමා හට ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ මංගල වස්තුව වන කණ්ඩුල සංකේතවත් කරමින් සමරු ඵලකයක් පිරිනැමීම.

# ර්ක උදාරත්වය සැමරීමේ දසුන්



පිරිත් සජ්ඣායනය සඳහා




මානුෂීය මෙහෙයුම සඳහා දායක වූ ඒකක වෙත සමරු ඵලක ලබාදීම.







තුනුරුවනේ රැකවරණය












# රෙජිමේන්

# මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආ

# සිදු කළ ශ්‍රීලපාහ ඒකක සංචා













# ්තු අධිපති
# ාර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු පීඑස්සී
# ාරයේ කැමරා ඇස ගිය තැන්

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු පීඑස්සී පසුගියදා රෙම ශ්‍රීලපාභ ට අයත් 1,4,6,7,8,10,11,12,15,19,20,23,24 ශ්‍රීලපාභ 2,5,9,14,16,18,21,22 (සෙව්) ශ්‍රීලපාභ 1 ආබ, 2 ආබ, 3 ආබ, 4 ආබ ශ්‍රීලපාභ හා රෙජිමේන්තු පුහුණු පාසලේ මෙන්ම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරී නිරත නිලධාරි හා සෙසුනිලයන් ඇමතූ අතර එහිදී ඔවුන් හට පැන නැගී ඇති ප්‍රශ්න හා ඉදිරියේදී ඇති අභියෝග පිළිබඳව සියලු දෙනා මෙම සංචාරයන් හීදී දැනුවත් කළේය.











# වයිට් හැකල් කාටූනය




අදහස : මේජර් තරිඳු වීරසිංහ ශ්‍රීලපාහ
චිත්‍ර : සෙ/301875 කෝප්‍රල් ප්‍රේමලාල් ටීඑච්කේ (4 ශ්‍රීලපාහ)

# රණවිරුවන්ට දක්වමු බැති උපහාර

සුරවිර සෙන්පති ජනපති තුමනි
දිරිදුන් සැමට ගෝඨාබය මැතිතුමනි
නාවික ගුවන් යුධ හමුදාපති වරුනි
ලක් මව මුදාගත් මුර දේවතාවුනි

පෙන්වා තමන්ගේ එඩිතරකම් සුර
සතුරු බල සෙනග පරදවමින් කෲර
මව්බිම මුදාගත් බිම් අඟලක් නෑර
රණවිරුවන්ට දක්වමු බැති උපහාර

තමන් නිජබිමේ උරුමය පතාගෙන
දරුනු ගිනි අවිය සුරතෙහි තබාගෙන
කුරිරු සතුරගේ බලකොටු කඩාගෙන
විරුවන් ජයගත්තේ ලක් මව මුදාගෙන

බිහිසුනු සටන්කාමින් මහ වනන්තරේ
දහස් ගණන් දිවි පුදමින් නිරන්තරේ
බලකොටු බිඳ දැමූ ලක්බිම උතුරුකරේ
ජයගොස ලොව දස දෙස පැතිරේ

දසක තුනකටත් වැඩියෙන් දුක්වූවා
දෙස්පාලන නායකයින් බිලිවූවා
දහස් ගණන් රණවරුවන් දිවි පිදුවා
ලක්‍ෂ ගණන් දන හට මරු කැඳවූවා

මව්පිය දූදරුවන්ගෙන් දුරුවීමෙන්
රුදුරු ත්‍රස්ත සතුරන් හට මැදිවීමෙන්
මව්බිම නාමයෙන් නිති සටනේ යෙදෙමින්
විරුවන් ජය ලැබුවා රට එක්සේසත් කරමින්

උසස් නිලයන්ගේ උපදෙස් ලබාගෙන
මඩු හා කිළිනොච්චි කඳවුරු දිනාගෙන
පුදුකුඩිඉරුප්පු සමගින් විශ්වමඩු යන
කඳවුරු ජයගත්තේ ගිනි අවි සොයාගෙන

අලිමංකඩ මුලතිවු පූනරින් යන
ත්‍රස්ත මහා බලකොටු බිඳ දමාගෙන
සතුරු සේනා සතු අධි බල උපකරණ
විරුවන් ලැබ ගත්තේ ජය ගොස පතුරාගෙන

මෙලෙසින් දිවි පරදු කොට නිති සටන් වැදී
මව්බිම මුදාගැන්මේ අදිටනින් බැඳී
රුදුරු ත්‍රස්තයින් වටලා පහර දිදී
බිම හෙලූ අපගේ විරුවන් හට බැති පුදදී

යන එන ගමන් සැමගේ නිති සරුවේවා
කරනා සියලු කටයුතු සැම ඉටුවේවා
උතුම් තුනුරුවන් බලයෙන් සෙත්වේවා
තිස්තුන් කෝටියක් දෙවිවරු රැකදේවා

විශ්‍රාමලත් විදුහල්පතිනි ඩී.ඇම්. දිසානායක
ලුතිතන් කර්නල් ටීපීඩීඇම්ඊබී දිසානායක ශ්‍රීලපාහ ගේ මව

# මේ සිනහවට කුමක් වුනිදෝ...



හිරු අවරට යන්නයි එන්නේ
ආලෝකය මැකී අඳුරයි රජවෙන්නේ
එත් සිඟිති දුව ඔබ තුරුලේ සතුටින් ඉන්නේ
කුණාටුවක් ළඟ එන බව තාත්තේ නෑ දැනුනේ

මා සැමදා වඩා ගන්නට ඔබ හරි කැමතියිනේ
සෙල්ලම් කරන්නට මාත් මඟ බලමින්නේ
යහළුවන් විලස ඔබ හා මා දොඩමළු වන්නේ
කොහොම ද තාත්තේ මේ දේවල් අමතක කරන්නේ

ඔබ මතක් වෙන සැමවිට මා සිතට
කඳුළු ගංගා මටත් නොදැනි නෙත් වලට
කුමක් වුනේ තාත්තේ මේ ඔබට
කිසිම සලකුණක්වත් නෑ ඔබගේ අපට

ලොවට හොරා ඔබ යන්නට ගියත්
සිතින් නම් යන්නට බෑ ඔබට කවදත්
දිවිය තිබෙන තුරු ඔබ මා තනි කළත්
සිඟිති දියණියයි මා ඔබගේ කවදත්

නැවත මෙලෙස මා වඩාගන්නේ කවදාදෝ
ඔබ මා දොඩමළු වෙන්නේ කෙලෙසකදෝ
පිය සෙනෙහස නැතිව ජිවත් වෙන්නටදෝ
මේ සිනාවට අපගේ කුමක් වුණිදෝ

15 ශ්‍රීලපාහ මියගිය මේජර් ඩීආර් ප්‍රනාන්දුගේ
දියණිය ඩී චමරි ගයන්තිකා ප්‍රනාන්දු

වරද පිළිගෙන එය දුරලන අයට දයාව ලැබේ.

# ලෝකල්



හිරු අඩපණ වෙච් මුහුදට වැටෙන විට
මීවිත ටිකක් දාගත්තොත් හොඳයි මට
යන සිතුවිල්ල මගෙ හද තුල නැගෙන විට
පා දෙක සෙමින් එයි මිදුලට හොරෙන් මට

බාධක හැමදාම මේ ගමනට එනවා
නැත මා ගනන් ගන්නේ ආවත් මොනවා
බිරිඳ ගෙදර නැහැ අද මම රජ වෙනවා
හොම්බෙන් යන්න අද නම් හොඳ හැටි බොනවා

තිලකයා දෙඩුවමුත් බොන්නට රට බීම
මට නම් එපා පර සුද්දගෙ රට බීම
සිංහලයකු ලෙසට කොතනත් වැජ බීම
සියරටදේ සිරි සැපයකි හැම දාම

මාටින් අයියගෙ තිප්පොල වෙත එන්න
පැය භාගයක්වත් යන්නේ නැහැ ඔන්න
වඩයක් ඕනමයි මුල් ෂොට් එක ගන්න
ගිනි පෙට්ටිය ගනින් බීඩිය දල්වන්න

පොලීසිය ආවමුත් මගෙ නැහැ බයක් ඉතින්
අලියා පෙනෙන්නේ දැන් කුඹියෙක් ලෙසින්
අන්තිම ෂොට් එකක් දාපන් උබේ අතින්
මාටින් අයියේ මම යනවා රජෙක් ලෙසින්

නිවහන වෙත එන්නේ සතයක් නැතුව අතේ
බයිලා දෙපදයක් කිව්වොත් හොඳයි හිතේ
බිරිඳ දකින කොට සිත් සහ සවිය ගතේ
කොහේ ගියාදැයි අම්මප පුදුම හිතේ

කෝප්‍රල් ද සොයිසා ඒ සී
(රෙජිමුබ ශ්‍රීලපාහ) නාරාහේන්පිට

# පියාණෙනි ඔබ එනතුරු මා මග බලා හිදිමි

ජාතියේ මුර දේවතාවෝ යනුවෙන්
පිදුම් ලබන මගෙ පියාණෙනි.....
ඔබේ එඩිතර වීර ක්‍රියා අද බලන බලන
තැන්වල ලියවී ඇත... මාගේ පියාණෙනි......

පියාණෙනි එදා යුධ බිමෙන් අප අතහැර
ගියත් අපගේ සිත්වලින් ඔබව කිසි දිනක
අමතක නොවේ............

ඔබේ යුතුකම අද ඉටුකර ඇත
අද අපගේ පුංචි කැකුළු වැනි
පුංචි ළමුන් සුන්දරත්වය
කිසිම බාධාවකින් තොරව අත්විඳිති
මාගේ පියාණෙනි............

ආසෙ සුජාන් ආර්එම්ජී
ඒ කණ්ඩායම 7 ශ්‍රීලපාහ




# ජීවිතය

සුළං රැල්ල ඇග දැවටී යයි
එහෙත් සිසිලසක් නොදැනෙයි
වැහි බිඳු එකින් එක හිස මත
වැටී යයි
එහෙත් තෙතමනය නොදැනේ
මා ජීවිතය ගැන සිහි කරමි
එහෙත් ජීවිතය තේරුම් ගත
නොහැක
එකකු තවකෙකු පරයා නැගීමට
උත්සාහ කරයි
මේ ජීවිතය අවසන් කොතැනද
සියල්ලන්ම එකම සිද්ධාන්තයක
මේ බව කිසිවෙකු නොසිතයි
අප සිතිය යුත්තේ එයයි
බුදුරදුන් දෙසූ පරිදි
මමය මාගේය යන දේ
අත් හල දාට අප සැමට
ජීවිතය තේරුම් ගැනීම
පහසුවනු ඇත

2/ලුති කේවී රොෂාන් ශ්‍රීලපාහ
20 ශ්‍රීලපාහ

THE WHITE HACKLE

# fifkyi

ඔබගේ සෙනෙහස හිමියනි මාහට
සොයුරු වූයේ ඔබයි හිමියනි
ඔබේ හද තුල තිබූ සෙනෙහස
මහ මෙරක් මෙන් නොසැලී තිබුණා
සැමදා මා ළඟ නොමැති උනත් ඔබ
ඔබ සිටිනා විට ගෙවන.........ඒ.....
නිමේෂය........ සුන්දරයි.......විනෝදයි
ඔබේ හඬ තවමත් මගේ හදවතේ
යළි යළිත් රැව්දේ අපේ පුංචි රන්
කැදැල්ල කිසිම දාක සුනු විසුනු
නොකරන් මගේ හිමි සඳ ඔබ
ලබන භවයේ මගේම හිමි සඳුවී
උපත ලබන්නට පාරමී මම
පුරමි සංසාරේ මගේ හිමි සඳුනි
සමන්........

සැරයන් සේනානායකගේ
ආදර බිරිය රේණු



# යහපත් හෙට දිනක් වෙනුවෙන්

පාබල විරුවන් භූමියේ ජය තහවුරු කරද්දී
ගුවන් අරා රජ කලේ ගුවන් හමුදා විරුවන්ය
මහ සයුර ආරක්‍ෂා කල නාවිකයන් නොමැතිනම්
ජාතියේ අළුගෝසුවන් පැනගොස්ය

එහෙත්......

දම්වැලක පුරුක් මෙන් ත්‍රිවිධ හමුදාව හා පොලීසිය
බැඳී සිටීම නිසා අළුගෝසුවන් සියල්ල
ලක් මව තුරුළේදීම මරු තුරුලට ගෙන ගියහ

යුගයක් නිමාවිය........

නව යුගයක් ආරම්භ විය........
අළුගෝසුවන් නසා ලීමට දුන් සහය
නව යුගය ගොඩනගන්නට
ලබාදිය යුතු නොවේද
එසේ නම් අපේ වගකීම කුමක්ද
එය ඔබ අතේය
වගකීම ඔබ සතුය
මොහොතක් සිතන්න

2 ලුතිතන් කේවී රොෂාන් ශ්‍රීලපාහ,
20 ශ්‍රීලපාහ

යුක්තිය සඳහා හෙලන කඳුලු අනාගතයේදී මුතු කැට බවට පත්වේ.

# රණවිරුවාණෙනි ඔබ අමරණීයයි !







අප බළඇණිය අරඹා කෙටි කාලයක් තුළ
පිරා නිමකලා මුලතිව් වන වදුල
වැලිඔය ජනකපුර ටී හන්දිය අසල
කොටියන් රැසක් කෙරුවා එක තැන නිසල

අප එන මගේ තැන් තැන් වල වලදාලා
තිබුණා බට්ටෝ මර උගුලක් අටවාලා
ඇතමෙක් නැවතුනත් අත් පා බිලි දීලා
අන් අය ගියා පෙරටම ජයටැඹ සොයලා

කොමලමුනේ මුලියාවේලි පසුකරලා
යන විට තිබුණි දර ගොඩවල් ගොඩ ගසලා
එතැනදී කොටියා පුල් බූම් එක දමලා
දුන්නත් පහර නැත අප සවි බල බිඳිලා

කපිතන් ප්‍රනාන්දුත් බනි II හේමන්තත්
එතැනදී කොටියා බිල්ලක් අරගත්තත්
ඔබගේ වියෝවෙන් අප හැම දෙන තැවුනත්
මතු අප අතර ඉපදේවා ඔබ නැවතත්

15 ශ්‍රීලපාහ ඒකකය සමග සේවයේ යෙදී සිටියදී රුදුරු ත්‍රස්තයන්ගේ ප්‍රහාරයකට ලක්ව මියගිය මේජර් එම්ආර් විජේරත්න, මේජර් ඩීආර් ප්‍රනාන්දු ශ්‍රීලපාහ සහ බනි II හේමන්ත එච්ජ්සී යන රණවිරුවන් තිදෙනා ඇතුළු මියගිය සියලුම විරුවන්ට උපහාර පිණිස 15 ශ්‍රීලපාහ සෙ/305704 ලාකෝ සිල්වා ඩබ්ජී විසින් නිර්මාණය කරන ලදි.

# ජීවිතය හා ඇන්ජිම

ජීවිතය යනු ජීවත් කළ යුතු අංගයකි. ඇන්ජිමත් එසේමය. මනුෂ්‍යයා ජීවත් කරන්නට නම් නිසි කලට වේලාවට ශරීරයට අවශ්‍ය කෑම බීම, බෙහෙත්, විටමින් වර්ග, නින්ද, ව්‍යායාම වැනිදේ අවශ්‍ය වේ. ඇන්ජිමත් එලෙසමයි. ඇන්ජිම පණ ගැන්වීමට පෙර එයට අවශ්‍ය ඉන්ධන, ජලය, වෙනත් ලිහිසි තෙල් වර්ග නිසි වේලාවට සැපයිය යුතුය. ජීවිතය ජීවත් කරවීමේදී ඇතිවන හා ඇතිවිය හැකි ආබාධ බොහෝමය. ඇතැම් අය උත්පත්තියෙන්ම ශරීරයේ අභ්‍යන්තර, බාහිර කොටස් අඩුව හෝ වැඩිව උපදිති. එවිට එම ජීවිතය සාමාන්‍ය තත්ත්වයට පත්කර ගැනීම සඳහා අපට විශාල දායකත්වයක් ඔහු හෝ ඇය වෙනුවෙන් කැප කිරීමට සිදුවේ. උදාහරණයක් ලෙස ගත්තොත් උපතින් හෝ ඉපදුනාට පසුව හෘදවස්තුවේ සිදුරක් වැනි දෙයක් ඇති වුවහොත් එය සුව කිරීම සඳහා විදේශ රටවල වෛද්‍යවරුන්ට රුපියල් ලක්‍ෂ ගණන් මුදල් වැය කිරීමට සිදුවේ. ඇන්ජිමද එසේමය. අලුතින් වාහන පොළකින් හෝ විදේශ රටකින් ආනයනය කර ගන්නා වාහනයකට වඩා කෙනෙක් හෝ කිහිපදෙනෙක් පාවිච්චි කළ වාහන වල ඇන්ජිම අලුත් වාහනයේ ඇන්ජිමට වඩා ආබාධය. කෙටියෙන්ම කියනවා නම් අසනීප බිරියක්/ස්වාමි පුරුෂයෙක් කසාද බැඳ ගත්තා වැනිය.

විවාහ වන්නට පෙර ස්ත්‍රී/පුරුෂ පක්‍ෂයේ පවුලේ සෞඛ්‍ය තත්ත්වය හෝ අනාගත බිරිය/ ස්වාමි පුරුෂයාගේ සෞඛ්‍ය තත්ත්වය ඇය/ඔහු ඇසුරු කරන කාලසීමාව තුල මැන ගත යුතුය. ඒ නිසාමයි යෝජිත විවාහයකට වඩා ඇසුරු කොට සිදුකර ගන්නා විවාහය සාර්ථක යැයි මතයක් තිබෙන්නේ. වාහනයක් මිලදී ගැනීමට පෙර අප දන්නවා වාගේ නොයා, කාර්මිකයකු රැගෙන ගියේ නම් ඔහු එම වාහනයේ තත්ත්වය පරීක්‍ෂා කර බලා මෙය සුදුසු ඇන්ජිමක්ද නුසුදුසු එකක් දැයි පහදා දෙනු ඇත. අසනීප බිරියක්/සැමියෙක් ලැබුණේ නම් ඔහු හෝ ඇය හැමදාම රෝහලේය. ආර්ථිකව හා මානසිකව වැටීමටද සිදුවේ. (අතර මගදී සිදුවන අසනීප හා ආබාධ අදාළ නොවේ) එසේ වූවහොත් එයට මානුෂික වශයෙන් සිතා සැළකිලි ඇප උපස්ථාන කටයුතු කිරීම ඔහු හෝ ඇය විසින් පැහැර නොහැරිය යුතුය. අතේ ඇති මුදල නිරපරාදේ වියදම් කොට ගන්නා වාහනයේ ඇන්ජිම මොනයම් විදිහකින් හෝ පණ ගැන්වීමට නොහැකි තත්ත්වයකට පත්වූයේ නම් හැමදාම මහ පාරේ අතරමං වේ. නොඑසේ නම් ගරාජ්වල රස්තියාදු වීමට ඔහුට හෝ ඇයට සිදුවේ. අධික මුදලක් පවා වැය කිරීමට සිදුවීමෙන් ඔහු/ඇය ආර්ථික වශයෙන් ද පරිහානියට පත්වේ. අද සමාජයේ නොව පැරණි සමාජයේ ද ඇතැම් මහා පරිමාණ ව්‍යාපාරිකයින්, සුළු ව්‍යාපාරිකයින් සාමාන්‍ය වැසියන් හා රජවරුන් පවා තමා පාවිච්චි කළ වාහනය කාලයාගේ ඇවෑමෙන් පාවිච්චියට නුසුදුසු යැයි සිතා එය මාරුකරති. සමහර විට ගන්නා අළුත් වාහනයේ ඇන්ජිම ආබාධ වී ඔහු හෝ ඇය කඩා වැටීමටද බොහෝ සේ ඉඩ ඇත. නැතිනම් තිබුණු තත්ත්වයට වඩා දියුණු මට්ටමට ඒමට පුළුවනි. ඇතැම් උදවිය තමන්ගේ සෙවණැල්ල මෙන් සිටි ආදරණීය බිරිය/ආදරණීය ස්වාමි පුරුෂයා මාරුකොට වෙනත් බිරියක් /ස්වාමි පුරුෂයෙක් ඇසුරට පත්වෙති. එවිට සිදුවන්නේද ඉහත සිද්ධියමය. එයින් පවුල් පරිහානියට ලක්වේ. සියයට එකක් හෝ දෙකක් පමණ දියුණුවට පත්වේ.

අප කළ යුත්තේ සෑම විටම පනින්නට පෙර සිතා බැලීමය. කරුණු එසේ හෙයින් ජීවිතය ජීවත් කරවීමට කරන සත්කාරය යම් සේද, ඒ හා සමාන සත්කාරයක් ඇන්ජිමටද ලබා දිය යුතුවේ. මේ නිසා ජීවිතය හා ඇන්ජිම යන දෙකම එකම පැතිකඩක් ඔස්සේ ගමන් කරවීමට හැකිනම් අපගේ ජීවිතයත් වාහනයේ ඇන්ජිමත් බාධාවකින් තොරව පවත්ත්වා ගැනීමට හැකිවෙනවා නොඅනුමානය.

ච/සැර පුන්‍යපාල ඩබ්ලිව්පී 16 (සේවි) ශ්‍රීලපාහ

ඖෂධ මිලට ගත හැක. නීරෝගී බව මිලට ගත නොහැක.

# තම යෞවනය මාතෘභූමියේ හෙට දිනය වෙනුවෙන්







ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ආධුනික සෙබළුන් බඳවා ගැනීමේදී කමාන්ඩෝ රෙජිමේන්තුව වෙත ඉඳුරාම බඳවා ගන්නා ලද ආධුනික සෙබළුන් පුරා මාස 4කට ආසන්න කාලයක් ශ්‍රී ලංකා යුධ හමුදාවට ආවේනික සියලු සටන් ක්‍රම හා යුධ උපක්‍රම පුරුදු පුහුණු වෙමින් මනා විනයකින් යුක්තව ඉතා දුෂ්කර වූ කාලසීමාවක් පසුකර ආධුනික සෙබළු 571 දෙනෙක් 2009.12.05 වන දින ජාතියේ මුර දේවතාවුන් වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදා පුහුණු පාසලේ ප්‍රධාන සරඹ භූමියේදී විසිරයන ලදී.

මෙම සෙබළු කැළට දිවයිනේ විවිධ පළාත් වලින් බඳවා ගන්නා ලද ආධුනික සෙබළුන් අයත් වූ අතර, ඒ සෑම දෙනාම මනා කැපවීමකින් යුක්තව තම ආධුනික පුහුණු පාඨමාලාව නිසියාකාරව හදාරා 2009.12.05 දින 0852 පැයට පෙළපාළියේ දෙවන අණදෙන නිලධාරී විසින් පෙළපාළිය භාර අණදෙන නිලධාරී වෙත භාරදෙන ලදී. ඉන්පසු 0855 පැයට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සපැමිණි ප්‍රදේශ මූලස්ථානය ගාල්ල ආඥාපති බ්‍රිගේඩියර් පීයුඑස් විතානගේ ආර්එස්පී යන ජ්‍යේෂ්ඨ නිලධාරී ශ්‍රීලපාහ රෙජිමේන්තු සේනාවිධායක කර්නල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්පී හා පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක මේජර් එම්එම් ගුණසේ-







'කර ශ්‍රීලපාහ විසින් හෘදයාංගමව පිළිගෙන සරඹ භූමියේ විශේෂ පීඨිකාව වෙත කැඳවාගෙන එන ලදී. අනතුරුව ආධුනික සෙබළුන් විසින් තම ජ්‍යේෂ්ඨ නිලධාරියා වෙත උත්තමාචාරය පිරිනැමීමෙන් පසු විසිරයාමේ පෙළපාළිය නිල  වශයෙන් ආරම්භ වන ලදී. ඉතාමත් අලංකාර ලෙසින් තම උගත් පා සරඹ හා අවි සරඹ විදහා පා අනතුරුව පුහුණු කාල සීමාව තුලදී පුහුණු කිරීම මෙන්ම පුහුණුව ලැබීම දක්ෂ ලෙස සිදු කළ අයවළුන්ට කුසලාන සම්මාන පිරිනමන ලදී.

- ★ දක්ෂතම පෙළ අණදෙන්නා - සෙ/314997 කෝප්‍රල් ප්‍රසාද් එන්එච්අයි
- ★ සෑම අතින්ම අතිශූර සෙබළා - සෙ/2014601 ආසෙ හල්පිටිය පීආර්සීඑන්
- ★ අතිශූර වෙඩික්කරු - සෙ/2014422 ආසෙ ප්‍රේමනාත් ඩීඑන්එල්
- ★ දක්ෂතම ක්‍රීඩකයා - සෙ/2014033 ආසෙ ගුණතිලක පිපීඑස්කේ

ත්‍යාග පිරිනැමීම අවසානයේ ආධුනික සෙබළුන් සහ පැමිණ සිටි ඔවුන්ගේ දෙමාපිය ඥාති හිතමිත්‍රාදීන් මෙන්ම ආරාධනා ලැබ සිටි ත්‍රිවිධ හමුදාවේ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් මෙන්ම සිවිල් දෙපාර්තමේන්තුවල උසස් නිලධාරීන් සහ මහා සංඝරත්නය මෙන්ම ප්‍රභුවරුන් අමතා ප්‍රධාන අමුත්තා ප්‍රකාශ කර සිටියේ අද දින විසිර යන ආධුනික සෙබළුන් රටේ ඒකීය භාවය වෙනුවෙන් කළ කැපකිරීම හා සමානම කැපකිරීමක් තම දූ පුතුන් ශ්‍රී ලංකා යුධ හමුදාවට භාරදීමෙන් එම දෙමාපියන් ද කර ඇති බවය. ඔවුන් මුළු ජාතියේම ගෞරවාදරයට හා බහුමානයට පාත්‍රවන බවත්, අවුරුදු 18 ක තරුණයකු මා හැගි විනයකින් යුක්තව කාර්යශූර සෙබළෙකු වශයෙන් පුහුණු කර රට ජාතිය වෙනුවෙන් ලබාදුන් සේවයට වත්මන් ප්‍රධාන උපදේශක සහ කාර්ය මණ්ඩලය වෙත තම ප්‍රණාමය පුද කරමින් තම ජ්‍යේෂ්ඨ නිලධාරීන් සහ සියලු රණවිරුවන් විසින් රුදුරු ත්‍රස්තවාදීන්ගෙන් මුදාගත් තම දේශය ආරක්ෂා කිරීම අද දින විසිරයන සෙබළුන්ගේ වගකීම බවත්, වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින ලදි. මෙම පාඨමාලාවේ පුහුණුවීම් කටයුතු නිසියාකාරව සිදු කළ උපදේශක මණ්ඩලයටත් පාලන රාජකාරීන් හී යෙදුන කාර්ය මණ්ඩලයටත් සමස්තයක් වශයෙන් මෙම සියලු කටයුතු සාර්ථක කරගැනීම සඳහා ඉතා කැපවීමෙන් කටයුතු කල රෙජිමේන්තු පුහුණු පාසල ශ්‍රීලපාහ හි සියලුම දෙනාටත් තම හෘදයාංගම ස්තුතිය පුදකර සිටින ලදී.

ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කතාව අවසන් වීමෙන් පසු විසිරයාමේ පෙළපාළියේ වැඩ කටයුතු අවසන් වූ අතර, ප්‍රධාන ආරාධිත අමුත්තා විසින් තම පැමිණීම සිහිපත් වීම පිණිස පුහුණු පාසල් කදවුරු භූමියේ "නා'' පැලයක් රෝපණය කරන ලදී. ඉන් පසු පුහුණු පාසල වෙතින් පිළියෙල කරන ලද තේපැන් සංග්‍රහය සඳහා සහභාගි වීමෙන් අනතුරුව අමුත්තන්ගේ සටහන් පොතේ සටහන් තබා කඳවුරෙන් නික්මයන ලදී.

ස්වල්ප වේලාවකින් තම දෙමාපියන් ඥාති හිතාමිත්‍රාදීන් හමුවීමට ආධුනික සෙබළුන් හට අවස්ථාව උදාවූ අතර, මෙම කාලසීමාව තවත් අර්ථවත් කිරීම සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රීලපාහ අධි රිද්ම සංගීත කණ්ඩායමේ ඉමිහිරි සංගීතය ද ඉවහල් වූ බව ඉතාමත් සතුටින් යුතුව දන්වා සිටිමි. තවද මෙම කටයුතු ඉතාමත් සාර්ථකව පාඨමාලාව පුරාටම සිදුකර ගැනීමට රෙජිමේන්තු අධිපති සේනාවිධායක ඇතුලු රෙම ශ්‍රීලපාහ හි රාජකාරී නියුතු සියලුම නිලධාරී සෙසුනිලයින්ගේ සහයෝගය ද මෙම පුහුණු පාසල වෙත නොඅඩුව ලැබුණි. ඒ සියලු දෙනාටත් නන් අයුරින් සහයෝගය දුන් සියලු දෙනාට පුහුණු පාසලේ ප්‍රශංසාව හිමිවන බව දන්වා සිටිනු කැමැත්තෙමු.

රෙජිමේන්තු පුහුණු පාසල ශ්‍රීලපාහ,





# ද්වේශයේ මුර දේවතා විලි විහිදුවාලන්නට වරම් ලැබූ තවත් 291 දෙනෙක් විසිර ගිය වගයි



කර්නල් එම්එම් කිත්සිරි ආර්එස්පී









වර්ෂ 2009 ජූලි මස 28 වන දින ආධුනික සෙනීන් 301 කින් සමන්විතව ආධුනික පාඨමාලා අංක 76 රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින් ආරම්භ කළ අතර, එහි ප්‍රධාන උපදේශක ලෙසින් මේජර් අයිඩීඑම් තිලකරත්න ශ්‍රීලපාහ ගේ මනා කැපවීම හා උනන්දුව මත සෙසු උපදේශකයින්ගේ අපිරිමිත උත්සාහයෙන් සොල්දාදුවෙක් සතු මූලික දැනුම් සම්භාරය සැලසුම්ගත පුහුණුවක් ආධුනික සෙබළුන් වෙත ලබා දී එම දැනුම් මනා ලෙස ඉගෙනගත් සෙනීන් 291 දෙනෙකු 2009 ඔක්තෝබර් මස 31 වන දින රෙම ශ්‍රීලපාහ කඳවුරු සරඹ භූමියේදී ඉතා උත්කර්ෂවත් අයුරින් විසිර යන ලදි.

මෙම විසිරයාමේ පෙළපාළිය කර්නල් එම්එම් කිත්සිරි ආර්එස්පී විසින් පිළිගෙන විසිර යන ආධුනික සෙබළුන් හට හරවත් උපදෙස් මාලාවක් ලබාදුන් අතර, මෙම සෙබළුන් යුද හමුදාවට එක්වීමට වරම් දුන් දෙමාපියන්ට ද එම පුතුන් යුද හමුදා සෙබළුන් ලෙස පුහුණු කළ සියලු දෙනාටද නන් අයුරින් දායක වූ සැම දෙනාටද ප්‍රනාමය කරන ලදි. මෙම පුහුණු පාඨමාලවේ සැම අතින්ම අති ශූර ආධුනික සෙබළා වූ සෙ2012764 ආසෙ සංජීව ඩබ්ළුඑම්පී ද, හොඳම වෙඩික්කරු වූ සෙ/2015493 ආසෙ පියරත්න පීඑයුඩබ් ද කුසලතා ලබාගන්නා ලදි. ආධුනික සෙබළුන් හට දැනුම ලබාදීමේ උපදේශක හැකියාවෙන් පෙරමුණේ සිටි සෙ/315978 ලාකෝ සාලියරත්න එච්එම්ආර් හොඳම පෙළ අණදෙන්නා ලෙසින් කුසලතා ලබාගන්නා ලදි. පුහුණුවේදී වැඩිම දක්ෂතා දැක්වූ බණ්ඩය ලෙසින් 6 වන බණ්ඩය සුදුසුකම් ලැබූ අතර, එහි කුසලතා පලිහ නි/63997 ලුතිතන් කේඑස් පුෂ්පකුමාර ශ්‍රීලපාහ හා සෙ/307072 සැරයන් රෝහණ එන්එන්කේ විසින් ප්‍රධාන ආරධිත අමුත්තා වෙතින් ලබාගන්නා ලදි.













පුහුණු අංශය රෙම ශ්‍රීලපාහ

# සිතෙහි දුක පවසමි......

තොල් අතරින් මිමිනු......
ඒ ලස්සන මිහිරි වචන...
සමුදාය......හිතෙහි ඇත
තවමත්.... සත්තකින්ම ඒ
සිනහව නතර වී දුක් සුසුම්
පමණක් අද ඉතිරි වන තරමටම
සිත පමණක් තනි වී ඇත එක තැනක
දුක සුසුම දැනෙන තරමට.....
ඒ සිත තුල එදා ලං වූ බව
අද මා සිත හොල්මන් කරයි.....
සැමදාම වාගේ ලස්සන චමත්කාර
අහිංසක ඒ රූපයට ඇත්තටම එදා
වගේම ආදරෙයි ලස්සනයි ආදරය
වැඩි වූ තරමට සිතේ ආදරය කෙරුවත්
එදා නැතිවා වාගෙයි අද ඉතින් හිරු.....
පායන්න හෙටත් රාත්‍රිය ගෙවී සිහිනයක්
දකින්න ආසයි ඒ තොල් අතරින් මිමිනු
ඒ ලස්සන වචන සමුදාය සමගින් එවිට
සිතෙහි දුක තනිකම නැතිවේවි මදක්
හෝ ඒත් සිතට දුකයි තාමත් පවසමි ඒ
දුක අකුරෙන් මෙසේ....

කෝප්‍රල් රම්සිල් මොහොමඩ්
12 ශ්‍රීලපාහ

# යුද්ධය නිමාවිය සාමයේ අරුණළු පහළ විය

නැසියො ළඟ නෑ
සෙනෙහස හිමි නෑ
තනියම උතුරු කරේ
කෙදිනක හෝ මා මළ බව සැලවේ
නාඩන් මව්නි මගේ

සුදු කොඩි වැල් ලෙළ දෙනවා
ගම් පුරා සරසන දා
මිතුරන් කරපිට මා යන දා
සුදු අම්මේ නුඹ හඬනු එපා

සිය පණ සේ රැක්ක මෙමා
ලක් මව්නි වෙන්න සමා
ඔබගෙන් වෙන් වී යන මොහොතේ
යළි ඉපදේවා මේ දෙරණේ

යුද්ධය නිමා විය
සාමයේ අරුණළු පහළ විය
කුරිරු වූ යුද්ධය මතු පරපුරට
උරුම කර නොදෙමින්
සිරිලක් දරණිතලයෙන්
මුලින් උපුටා දැමීමෝ
ජාතියේ මුර දේවතාවෝය

කෝප්‍රල් ද සොයිසා ඩීසීඑල්
20 ශ්‍රීලපාහ

# විරුවෙකු වූ මගේ පෙම්වතා

රණවිරුවෙකු වී යුද සේවයට ගිය
ඔබගේ බිරිය වී ආවා ඔබ ළඟට
කාලය උදාවී මේ ලෙස ගෙවිලා ගියා
යුද්දෙත් ඉවරයි දැන් සාමය පැතිරෙනවා

මසක් නිම වෙද්දී පෙර මග බලන්නේ
දුරකථනයට කන්දෙක යොමු කරන්නේ
කොතැනින් කෙලෙස මතුවේදැයි බලන්නේ
කවදද ඔබ මා බලන්නට එන්නේ

දින දහයක් ඔබ හට නිවාඩු ලැබෙන්නේ
එම දින දහය මා ළඟමයි සිටින්නේ
නිමවන හැම පැය අපි දෙන්න සතුටින් ගෙවන්නේ
දහවන දිනය යන බවකියි කියන්නේ

විරුවෙකුගේ සහකාරිය වීම ගැන සතුටක් ලබමි
ජීවන මගෙහි හොඳ නාමය රැක ගනිමි
ඔබ ළඟ නැතත් මාහට දුක සිතෙන්නේ
දින දහයේ නිවාඩුවත් නිම කරලා
ආයෙත් ඔබ යුධ පිටියේ සේවයට ගියා

ලාකෝ ප්‍රේමසිරි එකේපීඑන් ගේ
බිරිය මදුමාලි

*I love three things*
*The Sun Moon*
*And you ...*
*The Sun for the Day*
*The Moon for the Night*
*And you forever*

Diluka Sudarshani

# fh!jkh

දයාබර නංගියේ ළදරු විය ළමා විය
දිනෙන් දින පසු කරන්
සිප් හලෙන් සමු අරන් යොවුන් විය
වෙත එළඹ
සමාජයට එන දයාබර නංගියේ ධන
බලය නිල බලය
කෙසේ හෝ ලබන්නට ක්‍රෝධයෙන්
වෛරයෙන්
නිති පතා වෙර දරන
නොමිනිසුන් රජ කරන සමාජයක් ඇත
නොමිනිසුන් අතර හිඳ මිනිස්කම ගරු
කරන හෙටක් ගොඩ නගන්න
දයාබර නංගියේ.

ලාකෝ වීරසිංහ බංඩාර එස්ජීඑස්
20 ශ්‍රීලපාහ

# සුන්දර ළමාවිය සෙබළෙකුගේ සිහිනය

හිරි පොද වැටුනු උදෑසන අවදි වී
ජීවිතයේ ඉරණම සඳහා
උදෑසන වෙහෙස වී පාසල වෙත
පිය නැගූ මගේ මිතුරේ

ඉතින් ඒ සුන්දර කාලය
ඔබත් මමත් අතරින්
කෙමෙන් කෙමෙන් වෙන් වී
ගිය ඒ කාලය

ඉතින් සොයුර අපි දැන් සිටින්නේ
ඒ කාලෙන් ඉතා දුර ගොස්ය

ඔබටත් මටත් කාලයක්
උදාවුන ඒ ඔබත් මමත්
මේ රට වෙනුවෙන් කරන මහඟු
කර්තව්‍යය
අවිය අත දරා ගෙන නිදි නොලබා
කරන මහඟු සේවය
සදා අමරණීයයි

සාසෙ ජයරත්න යූපීඩීපීපී
20 ශ්‍රීලපාහ




# සාමය උදාවේවා කුමරුනි

මහා මෙරක් තරම් කඳුළු
සාගරයට බිලි දෙන්නද
මගේ හදට ගෙනෙන සුසුම්
පෙම් කවියක අමුනන්නද
නුබේ දෝතම ගිනි අවියෙන්
උණුසුම් වෙන්නට හැරියද
ලයේ දැවෙන දුක් ගීතය
නුබේ නමට පවසන්නද

පාළු සිතට ගෙනෙන කඳුළු
නුඹේ දෝතින් පිසදාන්න
මගේ හදට ගෙනෙන සුසුම්
නුබේ හදින් සනසවන්න
දිනක් ඇවිත් මගේ සකිසද
සාමයෙ මල් පුබුදුවන්න
සතුට අරන් මගේ සිතට
නුඹ හෙට දින ගෙදර එන්න

24 ශ්‍රීලපාහ ලාකෝ නාමල්
දේශප්‍රිය එස්ජ්ඒ ගේ බිරිය
එම්. සුජාතා තෙන්නකෝන්

මිනිසුන් බොහෝ විට අනුන්ගේ වැරදි ගැන කතා කරන්නේ තමන්ගේ වැරදි වසාගැනීමටය


# THE WORLD SNIPING RIFLES

**The Future**

Scarcely a year goes by without some advance in firearms design being announced, or so it seems to the casual observer, In fact meny of these announcements are optimistic and vanish when more research is done; others are merely old ideas being given a new nun because some aspect of technology has made them a little more attractive than they were is the past. But in all this activity, is there anything which promises improvements for the sniper"

Here, I think, we have to make a distinction between the two branches into which sniping has divided itself, antimateriel and anti-personnel. The first thing to be realised about anti-materiel sniping is that, so far, many of its advantages are entirely theoretical, it has very little trial in actual combat conditions, and the far trials it has had have not been very significant to the overall results of the operation. So whether the scenario of the infiltration party destroying the squadron of expensive jet fighters is a valid one, we haw no way of knowing. So far as equipment goes the anti-materiel sniper is well provided whit a variety of heavy caliber weapons, as the following pages show. But there are indications that enthusiastic designers are straying into the realms of giantism, and it cannot be long before somebody starts exploring the more powerful 20mm and even larger carriages, striving for the ultimate destructive power but with very little thought of the practicalities of carrying such monsters about the countryside. (Not to mention the weight of a reasonable quantity of anmmnition.)


So far as anti-personnel sniping goes, we seem to have arrived at the same plateau of excellence that has already been reached with assault rifles; it might be possible to improve the performance, but by how much and at what sort



Anti-Materiel Rifle IWS 2000

of cost? "The final ten percent of performance is sixty percent of the development cost" say the guided missile engineers and much the some is being said about more mundane weapons like rifles and machine guns. At the present, sniping rifles are generally so good that they are far more accurate than 99 out of 100 people call shoot them, and striving to make them any more accurate seems to be a waste of time and effort, Moreover it tends to price them out of the market; the prime example of this can be seen in the magnificent Waltherr WA 2000 rifle which appeared in the mid-1980s. It was designed around the. 300 Winchester Magnum cartridges, the barrel being, dimensioned and rifled for that alone. The barrel was fitted into a frame so that the recoil force was in a straight line to the firer's shoulder, the gum was a gas-operated semi-automatic, it had every conceivable adjustment for length, height, fit, and trigger pull. It had a muzzle brake, recoil absorbers, a bipod, hand rests, a magnificent telescope tight. And it cost something in the region of 8500. By cotrast, the current price of a top parker-hale rifle is just over sl000. As a result, Walther very wisely saw that there was no likelihood of a profit being made out of the limited number of weapons they were likely to sell avid abandoned tine WA2000 in 1988.

So I think we are likely to wait for some years before we see anytling very startling appearing in the anti-personnel sniping field. And although we shall undoubtedly see some slartling appearing in the anti-materiel sniping field. whether they will meet with military acceptance is likely to wait until some practical experience is gained as to just what tactical function they really can perform, as opposed to the lactical functions they are expected to perform. Not for the first time, the



development of a weapon system is going to have to wail until the military are satisfied that they can find a use for it.

## Step Anti-Materiel Rifle .IVES 2000 (Austria)

In the late 1980s the Steryr-Mannlicher company took a long look at tile targets which confronted the infantryman on the modern battlefield; men. helicopter, armoured personnel carriers. crew-sewed weapon vehicles of all shapes and sizes, radar and similar surveillance and observation systems- the list appeared endless, and it was obvious that the ordinary rifle and machine gun could not hope to deal with all of them. From this, and spurred no doubt by the contemporaneous rise of the 50 rifle in the USA, Sleyr set about 'project 5075' the development of a heavy-caliber infantry weapon capable of dealing with anything it met short of a main battlt tank.

Two of life prime requirements were the ability to defeat hard targets and high velocity in order to produce a flat trajectory. with a consequent reduction in range errors. This led to the adoption of fin-stabilized long rod projectile fired from a 14.5mm smooth-bore barrel at about 1400 meters per second.

This demanded a substantial caurtridge, and also a substantial weapon, and the design inlcorporaated a take-down barrel so as to make it convenient for a two-man crew to carry, and a concentric recoil buffer and high efficiency muzzle brake to Kook up a large proportion of the recoil.

Initial firings with die first design proved that the design was sound; the tungsten could defeat 40mm of armour at 1000 meters range. and the highest point of the trajectory was only 800mm above tile line of sight at the same range. The rifle itself was a long-recoil operated semi-automatic, feeding from five shot side mounted magazine.

Experience with this prototype led to some changes, notably the caliber to I5.2mm, and the project now became the infantry Weapon Syslant 2000' Development is still being carried out, with a view to simplifying and lightening the rifle, to prpoducing a full-automatic version, so as to allow a somewhat greater diversity of ammunition to be used.

The 15.2mm cartridge used a composite metal plastic case and is loaded with a 20 gram (0.71 oz) tungsten dart. At 1000 this deal with almost any target except a heavy rank, and against lighter tragets it is effective out to 2000 meters. As might be expected, the standard sighting system for the rifle is a 10x telescop.



Callber : 15.2mm (0.598in)
Operation : Long recoil, semi-antomatic
Length : 1800mm (70.86in)
Welght : 18kg (39.7Lbs)
Barrel : 1200mm (47.25in) smoothbore
Magazine : 5 rounds, side-mounted
Muzzle velocity : 1450m/sec (4757ft/sec)

Manufaturer :
Steyr-Mannlicher, Steyr, Austria

**Lt Cot MGANB Mahatuwakkara SLLI**
*Commanding Officer, 2 RFT - SLLI*

ආහාර මිලට ගත හැක. ආහාර රුචිය මිලට ගත නොහැක.

# මාරියා මොරේවිනා

ඔන්න එකෝමත් එක රටක ඉවාන් කියලා කුමාරයෙක් හිටියා. ඔහුට නංගිලා තුන්දෙනකි. එක්කෙනෙකු ගේ නම මාර්යා කුමාරි. අනිත් එක්කෙනා ගේ නම ඕල්ගා කුමාරි. තුන්වැනියාගේ නම ආන්නා කුමාරි.

මේ ගොල්ලන්ගේ දෙමාපියෝ මැරිලා. පිය රජතුමා මැරෙන විට, පුතාට කතා කරලා මෙහෙම කිව්වා. "නුඹගේ නංගිලා සරණ පාවා ගන්ට ඉස්සෙල්ලාම එන අයට ඒ ගොල්ලන්ව සරණපාවා දීපන්. නංගිලාව නුඹ ළඟ වැඩිකල් තියාගන්ට එපා.'' ඉවාන් කුමාරයා දෙමාපියන්ව වළලා දුක ඉවසා ගන්ට බැරුව නංගිලාත් සමග මල් වත්තට ඇවිදින්ට ගියා.

ඔන්න හිටි හැටියේ ම කළුපාට වළාකුළු අහසේ පාවෙන්නට වුණා. අහස ගොරවන්නට පටන් ගත්තා. "අනේ කුමරියනි අපි ඉක්මනින් මාලිගාවට යමු'' ඉවාන් කුමාරයා කිව්වා.

මාලිගාවට ආවා විතරයි, ගොරවලා හෙණ පහරක් වැදිලා මාලිගා වහල දෙබෑ වුණා. අහසේ ඉඳලා උකුස්සෙක් මාලිගාවට ආවා. උකුස්සා බිම හැප්පිලා ලස්සන කුමාරයෙක් බවට පත් වුණා. ඉතින් ඒ කුමාරයා කියනවා. "ආයුබෝවන් ඉවාන් කුමාරයා! ඉස්සර මම ආවේ අමුත්තකු හැටියට. අද ආවේ මනමාලයකු හැටියටයි. මම කැමතියි නුඹේ ලොකු නංගි මාර්යා කුමරියව සරණ පාවා ගන්ට.''

"නුඹ එයාට ආදරේ නම්, එයාව සරණ පාවා ගනින්. එයාට නුඹ එක්ක යන්ට පුළුවනි''

මාරියා කුමරිය කැමති වුණා. ඔහු ඇය සරණ පාවාගෙන ඔහුගේ රටට ගෙන ගියා. පැය ගෙවී ගියා, දවස් ගෙවී ගියා. ඔහොම අවුරුද්දක්ම ගෙවී ගියා ඉවාන් කුමාරයා නංගිලා දෙන්නත් එක්ක මල් වත්තේ ඇවිදින්න ගියා. ආයෙමත් අහසේ වළාකුළු පායන්නට වුණා. විදුලි කොටන්ට පටන් ගත්තා.

"කුමාරියනි, මාලිගාවට යමු'' ඉවාන් කුමාරයා කීවා. මාලිගාවට ආවා විතරයි. අකුණක් වැදිලා මාලිගා වහල දෙබෑ වුණා. රාජාලියෙක් මාලිගාවට ඇතුළු වුණා. ඌ ඔළුව බිම හප්පා ගත්තා විතරයි, ලස්සන කුමාරයෙක් වුණා. ඉතින් ඒ කුමාරයා කියනවා.

"ආයුබෝවන් ඉවාන් කුමාරයා, ඉස්සර මම ආවේ අමුත්තකු හැටියටයි. අද නම් ආවේ මනමාලයකු හැටියටයි. මා කැමතියි ඕල්ගා කුමරියව සරණ පාවා ගන්න.''

"නුඹ එයාට ආදරේ නම් නුඹ ඇයව සරණ පාවා ගනින්. මම ඒ අදහසට කැමතියි.'' ඕල්ගා කුමරිය රාජාලියාට කැමති වුණා. ඔහු ඇයව සරණ පාවාගෙන තමාගේ රටට ගෙන ගියා.

අවුරුද්දක් ගත වුණා. ඉවාන් කුමාරයා බාල නංගිට කතා කළා. "අපි මල් වත්තේ ඇවිදින්නට යමු''. පොඩ්ඩක් වෙලා ඇවිදින විට, අහස කළු පාට වුණා. ගොරවන්ටයි, විදුලි කොටන්ටයි පටන් ගත්තා.

"නංගියේ අපි මාලිගාවට යමු''. මාලිගා වට ආවා විතරයි, අකුණක් වැදුණා. මාලිගාවේ වහල දෙකට දෙබෑ වුණා. කාක්කෙක් මාලිගාවට ඇතුළු වෙලා ඔළුව බිම හප්පලා බොහොම ලස්සන කුමාරයෙක් බවට පත්වුණා. ඉස්සෙල්ලා ආපු උකුස්සයි, රාජාලියයි දෙන්නාම ලස්සනයි. මේ කාක්කා කුමාරයෙක් වුණාට පස්සේ අර දෙදෙනාටත් වැඩිය ලස්සනයි. "ඉවාන් කුමාරයා ඉස්සර මම ආවේ අමුත්තකු හැටියටයි, දැන් ආවේ මනමාලයකු හැටියටයි, මම කැමතියි ආන්නා කුමරියව සරණ පාවා ගන්න.''

"නුඹ මගේ නංගිට ආදරේ නම්, නුඹ ඇයව සරණ පාවා ගන්නවාට මම කැමතියි''. ආන්නා කුමරිය සතුටු වුණා. කාක කුමාරයා අන්නා කුමරියව සරණ පාවා ගෙන එයාගේ රටට ගියා.

ඔන්න දැන් ඉතින් ඉවාන් කුමාරයා අවුරුද්දක් තිස්සේම නංගිලා නැතිව තනියම ඉන්නවා. එයාට දැන් කාන්සියි. "නංගිලා බලන්ට යන්න ඕනෑ''. ඉවාන් කුමාරයා කල්පනා කළා. ඉවාන් කුමාරයා ගමනට පිටත් වුණා. ඔහු ගිහිල්ලා, ගිහිල්ලා, එක තැනකට ආවා. එතැන විනාශ වුණු ලොකු යුද්ද හමුදාවක් වැටිලා ඉන්නවා. ඉවාන් කුමාරයා මෙහෙම ඇහුවා.

"මෙතන මිනිහෙක් ජීවත්වෙලා ඉන්නවා නම් පිළිතුරු දීපල්ලා මේ මහා යුද්ද හමුදාව විනාස කෙරුවේ කවුද?'' මිනිහෙක් ඔහුට පිළිතුරු දුන්නා. "මේ මහා යුද්ද හමුදාව විනාස කෙරුවේ මාරියා මොරේවිනා කුමාරි, අපේ සුන්දර රැජිණිය.''

ඉවාන් කුමාරයා තවත් දුර ගියා සුදු පාට කූඩාරම් තියෙන රටකට ආවා. ඒ රටේ රැජිණිය මාරියා මොරේවිනා ඉවාන් කුමාරයාව පිළිගන්නට ආවා. "ආයුබෝවන් ඉවාන් කුමාරයා, කොහෙ ද ඔයා යන්නේ, නිදහසේ යනවාද? නිදහස නැති හින්දා යනවාද?. "වීර කුමාරයෝ නිදහස නැති හින්දා රට රටවල්වලට යන්නේ නැහැ.'' ඉවාන් කුමාරයා පිළිතුරු දුන්නා. "ඉතින් ඔයාට හදිසියක් නැති නම් මගේ කූඩාරමක නැවතිලා විවේක ගන්න.''

ඉවාන් කුමාරයා සතුටු වුණා. රෑ දෙකක්ම කූඩාරමේ ගත කළා. ඉවාන් කුමාරයා මාරියා මොරේවිනා ගැන හිතක් ඇතිවෙලා එයාව සරණ පාවා ගත්තා.

සුන්දර රැජිණිය මාරියා මොරේවිනා ඉවාන් කුමාරයාත් සමග ඇගේ රටට ගියා. ඔහොම ඉතින් ටික කාලයක් දෙදෙනා ම එකට ජීවත් වුණා. මාරියා මොරේවිනාට හිතුණා යුද්ද කරන්නට ඕන කියලා. යුද්ද හමුදාවක් අරගෙන යුද්දෙට යන්ට ලෑස්තිවෙලා මාරියා මොරේවිනා ඉවාන් කුමාරයාට අණ කලා.

"ඔයා මගේ රටේ හැම තැනම ගිහිල්ලා හැම තැනම බලන්න, හැබැයි, මේ ගබඩා කාමරේට විතරක් යන්ට එපා''. ඉවාන් කුමාරයාට ඉවසුම් නැහැ. මාරියා මොරේවිනා ගිය හැටියේම ඉවාන් කුමාරයා ගබඩා කාමරේට ගිහිල්ලා දොර ඇරලා බැලුවා. එතැන ඉන්නවා නොමැරෙන කසේයි නැමැති රාක්ෂයා. ඔහුව



එතැන විනාශ වුණු ලොකු යුද්ද හමුදාවක් වැටිලා ඉන්නවා. ඉවාන් කුමාරයා මෙහෙම ඇහුවා.


"මෙතන මිනිහෙක් ජීවත්වෙලා ඉන්නවා නම් පිළිතුරු දීපල්ලා මේ මහා යුද්ද හමුදාව විනාස කෙරුවේ කවුද?'' මිනිහෙක් ඔහුට පිළිතුරු දුන්නා. "මේ මහා යුද්ද හමුදාව විනාස කෙරුවේ මාරියා මොරේවිනා කුමාරි, අපේ සුන්දර රැජිණිය.''

දම්වැල් දොළහකින් බැඳලා. කසේයි ඉවාන් කුමාරයා දැකලා මෙහෙම කිව්වා.

"මට බොහොම වතුර තිබහයි. වතුර ටිකක් දෙන්න. අවුරුදු දහයක් තිස්සේ මම වද විඳිනවා. කෑවෙත් නැහැ. බීවෙත් නැහැ. මගේ උගුර කට වේලිලා''. ඉවාන් කුමාරයා ඔහුට වතුර බාල්දියක්ම දුන්නා. ඔහු ඒක බීලා තවත් වතුර ඉල්ලුවා. "ඒක වතුර බාල්දියක් බීලා මට මදි. තවත් වතුර දෙන්න''. ඉවාන් කුමාරයා තවත් වතුර බාල්දියක් දුන්නා. කසේයි රාක්ෂයා ඒක බීලා තවත් වතුර බාල්දියක් ඉල්ලුවා. තුන්වැනි වතුර බාල්දිය බීපු හැටියේම ඔහුට ආයෙමත් බොහොම සවි ශක්තිය ලැබුණා. ඔහු දම්වැල් දොළහම කඩා දැම්මා.

"ඉවාන් කුමාරයා නුඹට බොහොම ස්තුතියි. දැන් ඉතින් නුඹට කවදාවත් නුඹේ මාරියා මොරේව්නා බලන්ට ලැබෙන්නේ නැහැ.'' කසේයි රාක්ෂයා කිව්වා. කසේයි රාක්සයා කුණාටුවක් වගේ ජනේලයෙන් ඉගිලිලා ගිහිල්ලා සුන්දර රැජිණිය මාරියා මොරේව්නාව අල්ලා ගත්තා. රාක්සයා ඇය තමාගේ රටට ගෙනගියා.

ඉවාන් කුමාරයා බොහොම අඬලා, අඬලා, ගමනට ඕන කරන බඩුත් අරගෙන පිටත් වුණා. "මොනවා වුණත්, මාරියා මොරේව්නාව හොයා ගන්නවාමයි. දවසක් ගියා, දෙකක් ගියා, තුන්වන දවසෙ උදේ පාන්දර ඔහු ලස්සන මාලිගාවක් දැක්කා. මාලිගාව ඉස්සරහ ලොකු ඕක් ගහක් තියෙනවා. එතැන උකුස්සෙක්



ඉන්නවා. උකුස්සා පියාඹා ඇවිල්ලා ඔළුව බිම ගහලා කුමාරයෙක් වුණා. "ආ ඉවාන් කුමාරයා මගේ මස්සිනා ඇවිල්ලා''. කියලා ඔහු කෑ ගැසුවා.

මාරයා කුමරිය දුවගෙන ඇවිල්ලා බොහොම සතුටු වෙලා, අයියාගෙන් සැප සනීප ගැන ඇසුවා. තොරතුරු සේරම ඇසුවා. ඉවාන් කුමාරයා මාලිගාවේ දවස් තුනක් නැවතිලා හිටියා. "මීට වැඩිය නුඹලාගේ මාලිගාවේ මට නවාතැන් ගන්ට බැහැ. මගේ සුන්දර රැජිණ, මාරියා මොරේව්නා හොයන්නට මම යනවා''. ඉවාන් කුමාරයා කිව්වා.

"එයාව හොයන්ට ලේසි නැහැ. කොහොම වුණත් නුඹගේ රිදී හැන්ද මෙහි තියලා පලයන්. හැන්ද දිහා බල බලා නුඹ ගැන මතක් කරන්නම්.'' උකුසු කුමාරයා කිව්වා.

ඒ රටේ රැජිණිය මාරියා මොරේව්නා ඉවාන් කුමාරයාව පිළිගන්නට ආවා. "ආයුබෝවන් ඉවාන් කුමාරයා, කොහෙ ද ඔයා යන්නේ, නිදහසේ යනවාද? නිදහස නැති හින්දා යනවාද?. "වීර කුමාරයෝ නිදහස නැති හින්දා රට රටවල්වලට යන්නේ නැහැ.''

ඉවාන් කුමාරයා උකුස්සාට රිදී හැන්ද දීලා ගමනට පිටත් වුණා. දවසක් ගියා, දෙකක් ගියා, තුන්වැනි දවසේ උදේ පාන්දර ඉස්සෙල්ලා දැකපු මාලිගාවටත් වඩා ලස්සන මාලිගාවක් ඉවාන් කුමාරයා දැක්කා. මාලිගාව ළඟ ඕක් ගහක් තියෙනවා. ගහ උඩ රාජාලියෙක් වහලා ඉන්නවා. රාජාලියා ගහෙන් පියාඹලා බිමට ඇවිල්ලා, ඔළුව බිම හප්පලා ලස්සන කුමාරයෙක් වෙලා කෑ ගැහුවා. "ඕල්ගා කුමරිය නැගිටින්න අපේ ආදරණීය අයියා ඇවිල්ලා''. ඕල්ගා කුමරිය දුවගෙන ඇවිල්ලා අයියාව බදාගෙන සිපගත්තා. සැප දුක් ගැන ඇහුවා. තොරතුරු ඇහුවා. ඉවාන් කුමාරයා මද්දුම නංගිලාගේ මාලිගාවේ දවස් තුනක් ඉඳලා මෙහෙම කිව්වා. "නුඹලා ගේ මාලිගාවේ මීට වැඩිය ඉන්ට බැහැ. සුන්දර රැජිණිය, මාරියා මොරේව්නා හොයාගෙන මම යනවා''. රාජාලි කුමාරයාට කිව්වා.

"එයාව හොයන්ට ලේසි වෙන එකක් නැහැ. නුඹව මතක් කරල බල බලා ඉන්ට නුඹේ රිදී ගෑරුප්පුව අපට දීල පලයන්''. ඉවාන් කුමාරයා රිදී ගෑරුප්පුව ඔවුන්ට දීල ගියා.

දවසක් ගියා, දවස් දෙකක් ගියා, තුන්වැනි දවසේදී උදේ පාන්දර ඉස්සෙල්ලා දැකපු මාලිගා දෙකටත් වඩා ලස්සන මාලිගාවක් ඉවාන් කුමාරයා දැක්කා. මාලිගාව ළඟ ඕක් ගහක හිටිය කාක්කෙක්. එකපාරටම කාක්කා පියාඹලා බිමට බැහැලා ඔළුව හප්පා ගත්තා විතරයි. බොහොම ලස්සන කුමාරයෙක් වුණා.

"ආන්නා කුමරියනි ඉක්මනට එන්න, අපේ අයියා ඇවිල්ලා''. ආන්නා කුමරිය දුවගෙන ඇවිල්ලා අයියාව සතුටින් පිළි අරගෙන, බදාගෙන සිපගත්තා. සැප දුක් ඇසුවා. තොරතුරු ඇසුවා. ඉවාන් කුමාරයා බාල නංගි ළඟ දවස් තුනක් ඉඳලා ගමනට පිටත් වෙලා මෙහෙම කිව්වා. "ආයුබෝවන්, දැන් ඉතින් මම යනවා. මගේ සුන්දර රැජිණිය මාරියා මොරේව්නා හොයාගෙන''.

"නුඹට මාරියා මොරේව්නා හොයන්ට ලෙහෙසි නැහැ. නුඹ ගැන මතක් කරල බල බලා ඉන්නට නුඹේ රිදී පුටුව අපට දීලා පලයන්''. කාක කුමාරයා කීවා. ඉවාන් කුමාරයා රිදී පුටුව ඔවුන්ට දීලා, සමුගෙන යන්ට ගියා. දවසක් ගියා, දවස් දෙකක් ගියා, තුන්වැනි දවසේදී මාරියා මොරේව්නා ළඟට ගියා. මාරියා මොරේව්නා ඉවාන් කුමාරයා දැකලා ඔහුව බදාගෙන අඬ අඬා මෙහෙම කිව්වා. "අනේ ඉවාන් කුමාරයා, ඔයා මගේ කීම ඇහුවේ නැත්තේ ඇයි? ඔයා ගබඩා කාමරේට ගිහිල්ලා නොමැරෙන කසේයි රාක්සයාව නිදහස් කළේ ඇයි?''

"මාරියා මොරේව්නා, මට සමාවෙන්න. පරණ දේ මතක් කරන්ට එපා. නොමැරෙන කසේයි රාක්සයා අහල පහළ පේන්නට නැහැ. අපි යමු. ඔහුට අපව අල්ලා ගන්ට බැරිවේවි''. ඉවාන් කුමාරයයි, මාරියා මොරේව්නායි පැනලා ගියා. කසේයි රාක්සයා දඩයමේ ගිහින් හවස ඔහු ගෙදර ආවා. ඔහුගේ අශ්වයා කකුල් අද්ද අද්දා යනවා. "නුඹ මොකද ඔහොම යන්නේ, කෑවා මදිද? නැතිනම් විපතක් ඉව වැටුණ ද?''. "ඉවාන් කුමාරයා ඇවිත් මාරියා මොරේව්නාව ගෙනගියා''. අශ්වයා පිළිතුරු දුන්නා. "ඒ ගොල්ලන්ව අල්ලා ගන්ට පුළුවන් ද?'' "තිරිඟු වපුරලා, ඒවා වැවෙන කල් බලාගෙන ඉඳලා, අස්වැන්න කපලා තිරිඟු කොටලා, පිටි කරලා පිටි වලින් පොරනු පහක පාන් පුච්චලා. ඒ පාන් කෑවට පස්සේ, එළවාගෙන ගියත්, ඒගොල්ලන්ව අල්ලා ගන්ට පුළුවනි''. අශ්වයා කීවා.

මාරියා මොරේව්නාට හිතුණා යුද්ද කරන්නට ඕන කියලා. යුද්ද හමුදාවක් අරගෙන යුද්දෙට යන්ට ලෑස්තිවෙලා මාරියා මොරේව්නා ඉවාන් කුමාරයාට අණ කලා.

"ඔයා මගේ රටේ හැම තැනම ගිහිල්ලා හැම තැනම බලන්න, හැබැයි, මේ ගබඩා කාමරේට විතරක් යන්ට එපා''.

කසේයි රාක්සයා අශ්වයා පිට නැගලා ඉවාන් කුමාරයා ළඟටම ආවා. "පළමුවැනි වතාවට මම නුඹට සමාව දෙනවා. නුඹ මට කරුණාවෙන් වතුර ගෙනැවිත් දීපු හන්දා. දෙවැනි වතාවටත් මම නුඹට සමාව දෙනවා, තුන්වෙනි වතාවේදී, අහු වුණොත් මම නුඹව කෑලි කෑලි වලට කපනවා. නුඹ ප්‍රවේසම් වෙයන්.''

මාරියා මොරේව්නා උදුරාගෙන රාක්සයා ආපසු ගියා. ඉවාන් කුමාරයා ගලක් උඩ වාඩිවෙලා අඬන්ට පටන් ගත්තා. අඬලා අඬලා ආපහු මාරියා මොරේව්නාව හොයාගෙන ගියා. කසේයි රාක්සයා ගෙදර හිටියේ නැහැ. "මාරියා මොරේව්නා අපි යමු''. "අනේ ඉවාන් කුමාරයා රාක්සයා අපව අල්ලා ගනීවී''. "එකට කමක් නැහැ. පැයක් හරි දෙකක් හරි අපට එක්වෙලා ඉන්නට පුළුවනි''. දෙදෙනාම එක්වෙලා යන්ට ගියා. නොමැරෙන කසේයි රාක්ෂයා ගෙදර ආවා. ඔහුගේ අශ්වයා හෙමින් එනවා. "නුඹ මොකද හෙමින්, හෙමින් යන්නේ? කෑවා මදිද? නැතිනම් විපතක් ඉව වැටුණ ද?'' "ඉවාන් කුමාරයා ඇවිත් මාරියා මොරේව්නාව ගෙනගියා''. "ඒ ගොල්ලන්ව අල්ලා ගන්ට පුළුවන් ද?'' "බාර්ලි වපුරලා, වැවෙන කල් බලා ඉඳලා, අස්වැන්න කපලා, බීර හදලා, වෙරිවෙනතුරු බීර බීලා, නිදාගෙන ඉඳලා, නැගිටලා ඊට පස්සේ ගියත් උන්ව අපට අල්ල ගන්ට පුළුවනි''. කසේයි රාක්සයා ඉවාන් කුමාරයාව අල්ලා ගත්තා.

"මම නුඹට කිව්වා නේද, ආයෙත් කවදාවත් මාරියා මොරේව්නා නුඹට දකින්නට ලැබෙන්නේ නැහැයි කියලා''. රාක්සයා කිව්වා. කසේයි රාක්සයා මාරියා මොරේව්නාව උදුරාගෙන යන්ට ගියා. ඉවාන් කුමාරයා තනි වුණා. ඔහු අඬලා අඬලා ආපහු මාරියා මොරේව්නා හොයන්ට ගියා. එදත් කසේයි රාක්සයා ගෙදර හිටියේ නැහැ. "මාරියා මොරේව්නා, අපි යමු''.

"අනේ ඉවාන් කුමාරයා රාක්සයා ඇවිත් ඔයාව අල්ලාගෙන කෑලි, කෑලි වලට ඉරා දමාවි නේද?'' "එහෙම කළාට කමක් නැහැ. මට ඔයා නැතුව බැහැ.'' දෙදෙනා ම යන්ට ගියා. නොමැරෙන කසේයි රාක්සයා අශ්වයා පිට යනවා. අශ්වයා හෙමින් හෙමින් යනවා. "මොකද නුඹ හෙමින් හෙමින් යන්නේ විපතක් ඉව වැටුණද?'' "ඉවාන් කුමාරයා ඇවිල්ලා, මාරියා මොරේව්නාව ගෙන ගියා''. කසේයි රාක්සයා ඉක්මනට ගිහින්, ඉවාන් කුමාරයාව අල්ලා ගෙන ඔහුව කෑලි කෑලි වලට කපලා, ලාටු පීප්පයක දමලා, පීප්පය වටේ යකඩ පටි පහලා එක මහ මුහුදට දැම්මා. මාරියා කුමරිය අරගෙන ගියා.

රාක්සයා ඉවාන් කුමාරයාව කෑලි කෑලි වලට කපාපු හැටියේම එයා නංගිලා ගේ සැමියන්ට දීපු රිදී හැන්දයි, රිදී ගෑරප්පුවයි, රිදී පුටුවයි කළුපාට වුණා. "අනේ, අපොයි, විපතක් වෙලා''. ඒ කුමාරයෝ තුන්දෙනාම කිව්වා. උකුස්සා පියාඹා ගිහිල්ලා මහ මුදේ තිබුණ පීප්පය අරගෙන ගොඩ දැම්මා. රාජාලියා ගියා, පණ දෙන වතුර හොයාගෙන එන්නට, කාක්කා ගියා පණ ගන්න වතුර ගෙනෙන්නට.

තුන්දෙනාම එකතුවෙලා පීප්පය ගළවලා ඉවාන් කුමාරයාගේ ඇඟේ මස් කෑලි හා ඇට කටු එළියට අරගෙන ඒවා හරි විදියට තිබ්බා. කාක්කා පණ ගන්න වතුර ඉහපු හැටියේම මස් කෑලි ඇට කටු ඔක්කොම බොහොම හොඳට ඉස්සෙල්ලා තිබුණා වගේ පෑස්සුණා. රාජාලියා පණදෙන වතුර ඇඟට ඉහපු හැටියේම ඉවාන් කුමාරයාට පණ ආවා. ඔහු නැගිටලා මෙහෙම කියනවා.

"මදෑ, මම හුඟක් වෙලා නිදා ගත්තා නේද?'' "අපි නැතිනම්, නුඹ තව බොහෝ කාලයක් නිදාගනීවී''. කුමාරයෝ තුන්දෙනා කීවා''. "දැන් ඉතින් අපේ මාලිගාවලට එන්න''. කියලා ඒ ගොල්ල ඉවාන් කුමාරයාට අඬ ගැහුවා. "සහෝදරවරුනි, අනේ මට බැහැ. මම යනවා මාරියා මොරේව්නාව හොයාගෙන''. මාරියා මොරේව්නා ළඟට ඇවිල්ලා ඉවාන් කුමාරයා මෙහෙම කියනවා''.

"නුඹ නොමැරෙන කසේයි රාක්සයාගෙන් අහලා දැනගනින් කොහෙන්ද එයා ඔය තරම් හොඳ අශ්වයෙකු හොයා ගත්තේ කියලා''. මාරියා මොරේව්නා හොඳ වේලාවක් බලාගෙන ඉඳලා අශ්වයා ගැන ඇහුවා. "රට, රටවල් තිස් නවයකට එපිට, හතළිස් වැනි රටේ ගිනි ගඟ ළඟ ඉන්නවා බාබායිගා යකින්න. එයාට ඉන්නවා වෙළඹක්. ඔය වෙළඹගේ පිට උඩ නැගලා තමයි, බාබයිගා යකින්න අහසේ පියාඹන්නේ. ඈ ළඟ තව ඒ වගේ හොඳ වෙළඹියන් ඉන්නවා. මම බාබායිගා යකින්න ළඟ දවස් තුනක්ම එඬේර රස්සාව කළා. මට වෙළඹක් දුන්නේ නැහැ. අස්ස පැටියෙක් විතරක් දුන්නා.''

"නුඹ කොහොමද ගිනි ගඟ හරහා ගියේ?'' මාරියා මොරේව්නා ඇහුවා. "මගේ ළඟ තියෙනවා මායාකාර ලේන්සුවක්. ඔය ලේන්සුව තුන් පාරක් දකුණු පැත්තට වනාපු හැටියේම ගිනි දැල් ඒ පාලමට වැදෙන්නේ නැහැ.'' කසේයි රාක්සයා කීවා. මාරියා මොරේව්නා මේ කතාව ඉවාන් කුමාරයාට කිව්වා. ඈ මායාකාර ලේන්සුවත් හොරෙන් අරගෙන ඉවාන් කුමාරයාට දුන්නා.

ඉවාන් කුමාරයා ලේන්සුවේ බලෙන් ගිනි ගඟෙන් එගොඩ වෙලා, බාබායිගා යකින්න ළඟට ගියා. ඔහුට දවස් ගණනක් කෑමක් නැහැ. බීමක් නැහැ. කිරිල්ලියකුයි, කුරුළු පැටවු හත් දෙනෙකු යි එනවා දැකලා ඉවාන් කුමාරයා මෙහෙම කියනවා. "එක කුරුළු පැටියකු කන්ට ඕන''. ඉවාන් කුමාරයා පැටව් කන්ට එපා. නුඹට ඕන වෙලාවට මම නුඹට පිහිට වෙන්නම්. කිරිල්ලිය කන්නලව් කලා. "ඉවාන් කුමාරයා නොකා යනවා. කැලයක මී වදයක් තියෙනවා ඔහු දැක්කා.

"පැණි ටිකක් කන්ට ඕන''. ඉවාන් කුමාරයා කීවා. මී වදයේ මී මැසි රැජිණ කතා කළා. "ඉවාන් කුමාරයා, මගේ මී වදය කඩන්ට එපා. මම නුඹට පිහිට වෙන්නම්''. මී වදය නොකා ඔහු යන්ට ගියා. ඔන්න ඒ පාර සිංහදෙනකුයි, සිංහ පැටියකුයි ඉස්සරහට එනවා.

"මේ සිංහ පැටියාව හරි මරාගෙන කන්ට ඕන. දැන්නම් හොඳටම බඩගිනියි''. ඉවාන් කුමාරයා කිව්වා. ''සිංහ පැටියාව මරන්ට එපා. නුඹට පිහිට වෙන්ට මම එනවා''. සිංහ දෙන කීවා. "හොඳයි, නුඹේ කැමැත්තක්''

බඩගින්නේ ගිහිල්ලා, ගිහිල්ලා, බාබායිගා යකින්නගේ ගේ ළඟට ආවා. ඒ ගේ වටේට කණු දොළහක් හිටවලා තියෙනවා. කණු එකොළහක මිනී ඔළු. එක කණුවක විතරයි, මිනී ඔළුවක් නැත්තේ.

"ආයුබෝවන් ආච්චියේ''

"ආයුබෝවන්, ඉවාන් කුමාරයා. හිතේ කැමැත්ත අනුව ආවා ද? උවමනාවකට ආවා ද?'' "නුඹ ළඟ වැඩ කරලා යෝධ අස්වයකු ලබාගන්න ආවා.'' "ඉවාන් කුමාරයා මා ළඟ අවුරුද්දක් වැඩ කරන්ට ඕන නැහැ. දවස් තුනක් මා ළඟ ඉන්න. වෙළඹියන්ට තණකොළ කැව්වොත්, ඒ ඇති. එතකොට මම නුඹට යෝධ අස්වයකු තෑගි දෙන්නම්. නැතිනම් කණගාටු වෙන්න එපා. අර කණුවේ නුඹේ ඔළුව හිටවනවා.'' ඉවාන් කුමාරයා එකඟ වුණා.

බාබායිගා ඔහුට කෑම බීම දීලා කරන්ට ඕන වැඩ කියා දුන්නා. ඉවාන් කුමාරයා වෙළඹියන්ව තණ පිටියට ගෙනගියා විතරයි. උන් වලිග වනලා හැම දෙනම දුවලා ගියා. ඇස් වහලා, ඇස් ඇර බලන්ටත් ඉස්සෙල්ලා වෙළඹියන් ආ ගිය අතක් නැහැ.

ඉවාන් කුමාරයා අඬලා අඬලා ගලක් උඩට වෙලා නිදාගත්තා. හිරු බැහැලා යන්ට වුණා. කිරිල්ලිය ඉවාන් කුමාරයා නිදා හිටි තැනට ඇවිල්ලා ඔහුට කතා කළා.

"නැගිටපන්, ඉවාන් කුමාරයා, නුඹගේ වෙළඹියෝ ඔක්කොම ගෙදර ඇවිල්ලා''. ඉවාන් කුමාරයා ගෙදර ගියා. බාබායිගා යකින්නට තරහා ඇවිත් වෙළඹියන්ට කෑ ගහනවා බණිනවා. "නුඹලා ගෙදර ආවේ මොකටද?''. "ගෙදර නැවිත් පුළුවන්ද, ලෝකේ ඉන්න ඔක්කොම කුරුල්ලෝ ඇවිල්ලා අපේ ඇස්වලට කොටන්ට පටන් ගත්තා නෙව.'' වෙළඹියෝ කීවා. "හෙට නුඹලා තණ පිට්ටනිවලට දුවන්ට එපා. මුකලාන් කැලෑවට පලයල්ලා.'' ඉවාන් කුමාරයා රෑ නිදා ගත්තා. පහුවදා උදේ බාබායිගා යකින්න ඉවාන් කුමාරයාට මෙහෙම කියනවා. "එක වෙළඹියකුටවත් තණකොළ නොදී තිබුණොත්, එක වෙළඹියක් හරි නැති වුනොත් එහෙම නුඹ ගේ ඔළුව කපලා අර කණුව උඩ හිටවනවා''.

ඔහු වෙළඹියන් අරගෙන එළියට ගියා විතරයි, උන් වළිග වනලා මුකලන් කැලෑවට පැනලා ගියා. ආයෙමත් ඉවාන් කුමාරයා අඬලා අඬලා නිදාගත්තා. හිරු බැස ගියා. සිංහදෙන දුවගෙන ආවා "නැගිටපන් ඉවාන් කුමාරයා නුඹේ වෙළඹියන් ඔක්කොම ගෙදර ඇවිත්''. ඉවාන් කුමාරයා නැගිටලා ගෙදර ගියා. බාබායිගා යකින්න ඉස්සර දවසටත් වැඩියෙන් වෙළඹියන්ට කෑ ගහන්ටයි බණින්ටයි පටන් ගත්තා.

"නුඹලා මොකටද ගෙදර ආවේ?'' "ගෙදර නැවිත් කොහොමද? කැලෑවේ හැම පැත්තකින්ම නපුරු සත්තු ඇවිල්ලා අපව මරා දමන්නට ලෑස්ති වුණා''. "එහෙනම් හෙට නුඹලා මහ මුහුද පැත්තට දුවපල්ලා''. එදා රෑ ඉවාන් කුමාරයාට බාබායිගා


යකින්න මෙහෙම කිව්වා.

"අද නුඹ මගේ වෙළඹියන්ට කෑම නුදුන්නොත් නුඹේ ඔළුව අර කණුව උඩ තියෙනවා". ඔහු වෙළඹියන්නව තණ පිටියට ගෙනගියා. උන් වලිගය වනලා එක වරම මහ මුහුද පැත්තට දුවලා ගියා. උන් මුහුදට බැහැලා බෙල්ල විතරක් උඩ තියාගෙන ඉන්නවා. ඉවාන් කුමාරයා ගළක් උඩ වාඩිවෙලා අඬලා, අඬලා නිදාගත්තා. හිරු බැහැලා ගියා. මී වදයේ රැජිණ ඉගිලිලා ඇවිත් මෙහෙම කියනවා.

"ඉවාන් කුමාරයා නැගිටපන්. නුබේ වෙළඹියන් ගෙදර ගියා. නුඹත් ගෙදර පලයන්. හැබැයි. බාබායිගා යකින්නක් ගේ ඇහැට පෙනෙන්නට ඉන්නට එපා. අස්ස ගාලට ගිහිල්ලා පැටවුන් ඉන්න තැන හැංගියන් එතැන එක මුරණ්ඩු අස්ස පැටියෙක් ඉන්නවා. ඌ ගොම ගොඩේ ලැගලා ඉන්නවා. රෑ යාමට නුඹ ඒ අස්ස පැටියවත් අරගෙන නුඹ ගේ රටට පලයන්.

ඉවාන් කුමාරයා නැගිටලා අස්ස ගාලට ගිහිල්ලා අස්ස පැටවුන් ඉන්න තැනට වෙලා නිදාගත්තා. බාබායිගා යකින්න වෙළඹියන්ට කෑ ගහනවා. බනිනවා. "නුඹලා මොකට ද ගෙදර ආවේ ". "ගෙදර නැවිත් කොහොම ද?. අහස පුරා මී මැස්සෝ ඇවිත් අපට දස්ට කළා. අපි ගෙදර ආවා " වෙළඹියා කීවා. බාබායිගා යකින්න නිදා ගත්තා. රෑ යාමෙට ඉවාන් කුමාරයා මුරණ්ඩු අස්ස පැටියාවත් අරගෙන උගේ පිට උඩ නැගලා ගිනි ගඟ ළඟට ආවා. මායාකාර ලේන්සුව අරගෙන දකුණු පැත්තට හැරිලා තුන් පාරක් වැනුවා. එතකොට, කොහොම මැවුණ ද කියන්නට දන්නේ නැහැ ගිනි ගඟ හරහා උස, බොහොම ලස්සන පාලමක් මැවුණා. ඉවාන් කුමාරයා පාලම හරහා ගිහිල්ලා ලේන්සුව අතට අරගෙන වම් පැත්තට හැරිලා දෙවරක් වැනුවා. එතකොට පාලම බොහොම හීන් වුණා. උදේ බාබායිගා නැගිටලා බලනවා. මුරණ්ඩු අස්ස පැටියාව හොයනවා. ඌ පේන්නවත් හිටියේ නැහැ. බාබායිගා යකින්න යකඩ වං ගෙඩය උඩ නැගලා,යකඩ මෝල් ගහෙන් කොට, කොටා,කොස්සේන් අතුගාලා. අහසින් යනවා, අස්ස පැටියාව හොයන්නට. ගිනි ගඟ ළඟට ඇවිල්ලා පාලම දිහා බලා කල්පනා කරනවා. "හොඳ පාලමක්" බාබායිගා යකින්න පාලම දිගේ ගිහිල්ලා මැදට ආව විතරයි, පාලම කඩා වැටුණා. බාබායිගා යකින්න ගිනි ගඟට වැටිලා පිච්චිලා මළා. ඉවාන් කුමාරයා අස්ස පැටියා තණ පිටියට ගෙනියලා ඌට තණ කැව්වා. ඌ බොහොම හොඳ අශ්වයෙක් වුණා. ඔය අශ්වයා පිට නැගලා ඉවාන් කුමාරයා මාරියා මොරේව්නා ළඟට ආවා. ඈ ඇවිත් ඔහු බදාගෙන සිප ගත්තා. "ඔයා කොහොම ද නොමැරී බේරුණේ?"

ඉවාන් කුමාරයා විස්තර කළා. "අපි යමු" කියලා ඔහු මාරියා මොරේව්නාට කිව්වා. "ඉවාන් කුමාරයා, ආයෙමත් කසේයි රාක්සයා ඔයාව අල්ලා ගත්තොත් ඔයාව මරා දමාවි යි කියලා මට බයයි?" "නැහැ! දැන් ඉතින් එයාට මාව අල්ලා ගන්නට බැහැ! මං ළඟ ඉන්නවා අපූරු අස්සයෙක්. ඌ සුළඟ වගේ වේගයෙන් දුවනවා." ඉවාන් කුමාරයයි මාරියා මොරේව්නායි අශ්වයා පිට උඩ නැගිලා යන්ට ගියා. නොමැරෙන කසේයි රාක්සයා ගෙදර එනවා. ඔහුගේ අශ්වයා හෙමින්,



හෙමින් එනවා. "අස්සයා නුඹට බඩගිනි ද? නැතිනම් විපතක් ඉව වැටිලාද?" "ඉවාන් කුමාරයා ඇවිල්ලා මාරියා මොරේව්නාව ගෙනගියා." "ඔවුන්ව අල්ලා ගන්න පුළුවන්ද?" "දන්නේ නැහැ. ඉවාන් කුමාරයාගේ අස්වයා බොහොම සවිබල තියෙන සතෙක්. මටත් වඩා හොඳයි." අශ්වයා කීවා. "බැහැ. ඉවසාගෙන ඉන්ට බැහැ. උන්ව අල්ලා ගන්ට යනවා." කසේයි රාක්සයා ගිහිල්ලා, ගිහිල්ලා ඉවාන් කුමාරයාගේ බෙල්ල කපන්ට කඩුව ඇදලා ගත්තා. එතකොට ඉවාන් කුමාරයාගේ අශ්වයා නොමැරෙන කසේයි රාක්සයාට පයින් පහරක් ගැහුවා. රාක්සයාගේ ඔළුව පැළුණා. ඉවාන් කුමාරයා රාක්සයාට පොල්ලකින් ගැහුවා.

ඊට පස්සේ ඉවාන් කුමාරයා දර ගොඩක් ගහලා, රාක්සයාව දර ගොඩට ඇද දමලා ගිනි තිබ්බා. රාක්සයාගේ අළු අරගෙන හුළඟේ පා කරලා හැරියා. මාරියා මෝරේවනා රාක්සයාගේ අශ්වයා ගේ පිට උඩ නැග්ගා. ඉවාන් කුමාරයා එයාගේ අසු පිට නැග්ගා. ඉස්සෙල්ලාම කාක කුමාරයා ගේ මාලිගාවට ගියා. පස්සේ රාජාලියා ගේ මාලිගාවට ගියා. අවසානයේදී උකුස්සා ගේ මාලිගාවට ගියා. නංගිලා තුන්දෙනයි, ඒ ගොල්ලෙන්ගේ කුමාරයොයි බොහොම ආදරයෙන් මේ දෙදෙනාව පිළිගත්තා.

"අනේ ඉවාන් කුමාරයා නුඹව දැකීමට පවා අපි හිතුවෙ නැහැ. නුඹ උත්සාහ ගත්තේ නිකමට නොවෙයි. මාරියා මොරේව්නා තරම් ලස්සන කුමාරියක් මේ මුළු ලෝකේ කොහේවත් නැහැ." කුමාරයෝ තුන්දෙනා කීවා.

නංගිලා තුන්දෙනා ගේ මාලිගාවල දී හොඳට කාලා, බීලා, සතුටු වෙලා, පසුව ඒ ගොල්ලන්ගේ රටට ගියා. ඉවාන් කුමාරයායි, මාරියා මොරේව්නායි බොහොම සැපෙන්, සතුටින් ජීවත් වෙනවා. යහපත් වැඩ කරනවා. මී පැණි බොනවා.

(රුසියන් සුරඟන කතාවකි. "ලස්සන වසිලිස්සා" පොතෙන් උපුටා ගන්නා ලදී.)

## නුඹ බරක් නැත රටට

හැඳෑරූ සිප්සතර
පැතුම් මල් පුදින තෙක් බලා හිඳිද්දී....
තනන්නට නිවහල් ලොවක්
සදන්නට සොඳුරු ලෝකයක්
ඔබේ යෞවනය කැප වූයේ මව්බිම වෙනුවෙන්....
නිදා නොනිදා විටෙක හාමතේ බංකරයේ
පහන් කළ කර්ෂක ජීවිතයේ
මරණය අත්හදා බලද්දී
ප්‍රාණය නිරුද්දවන සගයන් දැක දැක
හද්‍ර යෞවනයේ වසන්තය
බිලි දුන්නේ උදාර මව්බිමේ නිවහල් බව උදෙසා...
අභිමි වූ ඔබේ අතපය
වලට වන්දි ගෙවන්නට
නැතත් අපට කළ හැක්කේ
රෝද පුටුවක්,
ඇඳක් මත ගෙවී යන ඔබේ තාරුණ්‍යය
නිකරුනේ කාලය ගිල දමනා
වෙනත් පවුකාර ජීවිත වලට වඩා
වටිනා බව රටට නුඹට වැටහේනම්.....

ඉරේෂා එදිරිවීර, ලුතිතන් කර්නල් ඊඑජී එදිරිවීරගේ බිරිය

## රිඟින් ටෝන්



තව්තිසා දිව්‍ය ලෝකයේ සිට
ඔබව සාදරයෙන් පිළිගනී
සක්‍ර දේවේන්ද්‍රයාට කාර්ය බහුල බැවින්,
කරුණාකර පසුව අමතන්න.

මේ...පුතේ උඹ සක්‍ර දේවේන්ද්‍රයගෙ පුතා
උනත් මට කමක් නෑ. ආමි එකේ
ඇබිසන් කියල එකක් තියනව. හෙට ආවෙනැත්නම් ඇබිසන්
ගහනව හරිද?

චිත්‍ර - අදහස

සෙ/16 ඕ 00029 ච/සැර පුන්‍යපාල ඩබ්ජී

## පාසල් මිතුරිය

අපි දුව පැන්නා වෙල් ඉපනැල්ලේ ළමා වියේ
හරි දඟකාරයි මිතුරියේ නුඹ ගලනා දිය රැල්ලක් සේ
කාලය ගෙවිලා ලැම මල් පිපුනා
දැන් නුඹ ළමස්සියකි මිතුරී
මා ද තුරුණු විය එළඹුනු තරුණයෙකි දැන්
කඳුළැලි දොර ගලමින් සමු ගන්නා ගුරු ගෙදරට
අපි වෙන් වුවා කිසිදු කළ නොසිතූ ලෙස
නොපැතූ ලෙස තව එක් නිමේෂයක නුඹ සිත
සොරාගෙන වෙන කෙනෙකු දැන් නුඹ කිරි දරුවෙකුගේ
මවකි තවත් කල් ගෙවී යන්නට වුවද
නුඹ දැන් තරුණ දරුවන්ගේ මහළු මවකි
ඒත්.... නුඹ දඟකාර සිනහව එලෙසමය
එහෙත් නුඹට නැත පෙරමෙන් දඟකාර කම්
දරුවන්ට වාරුවක් දරුවන්ගේ අත රැගෙන
යන නුඹව දැක දුක දැනුනි දුක සිතුනි මට
වාරුවක් වීමට මටද නොහැක
මා ද නුඹටත් වඩා මහළු වී දැන්

වර්ණ සැරයන් පුන්‍යපාල ඩබ්ජී
16 ශ්‍රීලපාහ ඒ කණ්ඩායම

## හොඳ සහ නරක

| | |
|---|---|
| ඒමෙන් හොඳ ඒම හමුදාවට | ඒම |
| වීමෙන් හොඳ වීම සැම ට්‍රේනින් | වීම |
| කෑමෙන් හොඳ කෑම කල්දේරම් | කෑම |
| කීමෙන් හොඳ කීම ගුඩ් මෝනින් | කීම |
| ඒමෙන් නරකමයි ඇබ්සන් වී | ඒම |
| වීමෙන් නරකමයි ට්‍රේනින් නොම | වීම |
| කෑමෙන් නරකමයි වරදට ගුටි | කෑම |
| කීමෙන් නරක කීමයි කේලම් | කීම |
| පෑමෙන් හොඳ පෑම සිනහාවක් | පෑම |
| බීමෙන් හොඳ බීම බෙටි වී එක | බීම |
| නෑමෙන් හොඳ නෑම තනිවම ඇද | නෑම |
| යාමෙන් හොඳ යාම 22කින් | යාම |

වර්ණ සැරයන් පුන්‍යපාල ඩබ්ජී
16 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම

## fnd|j .h
## u;lh

බොඳවුණු දෑසින් එපා බලන්නට
සමුගෙන යන්නට මොහොත ළඟයි
මා ළය තෙරපෙන දුකම හඬන්නට
එපා යලිත් මගේ සිත පෑරෙයි
සිල්බර කොට මත පරව ගියාවේ
අපේ කඳුළු මේ ලොවට බරයි
සැමරුම් හසුනක් පෙරළා දුන්නත්
හදවත සෙනෙහෙන් මිදේවිදෝ
අද හිනැහි කල්පයක් හඬන්නට
ඔය නෙතු රිදවනු නොහැකි
බැවින් සමුගෙන යන්නට පව් කළ
අප ගැන ඉකි නොබිඳනු මැන
සිහින් සරින්.............

11 ශ්‍රීලපාහ කෝප්‍රල් රත්නායක
ආර්එම්ආර්පිගේ
නැගණිය ආර්ඩබ්එස් සංජීවනී

## සදාදර පියතුමනි

සීතල මැදියම් රැයේ මහා වනයක තනිවී
සතුරු වෙඩි හඬ මධ්‍යයේ දිවි ගෙවන්නේ
කෙලෙස කියනු මා සකිසඳ....දෝතට ගෙන
රුදුරු ගිනි අවියක් ඔබේ උණුසුම් දෑතට
තුරුළු කරගෙන සිටිනා විටදී නුඹ
ගිනිගෙන දැවේ මා හද.. පෙරදා නුඹේ ළය තුරුලේ
පුංචි කිරිල්ලියක් ලෙසින් සිටි ඒ සොඳුරු යුගය
අමතක වී ද නුඹ හට.. ඒ සොඳුරු විය
තවත් පැහැබර වන්නට දෝතට වැඩිය
මේ නුඹේ පුත් රුවන නොදැක
ඉන්නට හැකිද නුඹ හට
පෙරදින තිබූ ඔය අහිංසක හදවත
අද එතරම්ම නපුරු වූයේ
එඩිතර වූ නිසාමැයි නුඹ සිත
රැකදෙන්න අපේ ලක්බිම
සියලු දෙවියන් රැකදේවි නුඹ..

24 ශ්‍රීලපාහ
ලාන්ස් කෝප්‍රල් නාමල් දේශප්‍රිය එස්බීජී ගේ
බිරිය එම් සුජාතා තෙන්නකෝන්




## යුද බිමේ සිතුවිලි

ආටි ගහන බිමට හැරෙන
හිත පොඩ්ඩක් මගෙ ගැස්සෙන
දෙවිවරු බුදුවරු මා ගැන
කරුණාවෙන් සවන් දෙන්න
ඊට කලින් හැකි වේවිද
ගෙදර නිවාඩුවක් යන්න

ඩුග් ගගා ඇවිදින් ආටි ද
මෝටාර් වැටෙයි
ඒවා ගුවනින් ඇවිදින් අපේ
ළඟම පතිත වෙතේ
මගේ හිතට බියක් නැතේ
රට රැකුනොතින් ඇතේ
ඒත් අනේ ගෙදර ගිහින්
අම්මලා බලන්නට ආසයි

සාසෙ වීරසිංහ ඒජීඑස්
20 ශ්‍රීලපාහ

## සෙබළ සිතුවිලි

ගිනි අවිය අත දරා
සතුරා නසන්නට පැමිණි මා හට
අම්මේ ඔබෙ සුවඳ ඇත හද තුල
කුරිරු යුද්ධය නිමාවී
සොඳුරු තාරුණ්‍යකට
පැමිණි දා සිට බලාපොරොත්තුව
හද පුරවාගෙන රැකදෙන්න
දෙව්දුනි මගේ මව් බිම

සාසෙ සමරසිංහ එස්ජීජේකේ
19 ශ්‍රීලපාහ
"බී" කණ්ඩායම

## දිදුලන තරු ඔබයි

ත්‍රස්තවාදයෙන් රට බේරා ගැනීමට දිවි පරදුවට තබා සටන් වැදී....
ජීවිතය පූජා කළ අභීත රණ විරුවන්....... ඔබයි
මේ ලක්දෙරණේ......... එස්එම්එස් ජන්දය නොමැති තරු වන්නේ........
කවදා හෝ ඔබගේ ද නම ද ඉතිහාසයේ සනිටුහන් වේවි......
එදවස සිහියට නැගෙන විට...... හදවතට දුකක් දැනේ........
ඔබ සමග එකට හිටි හැටි එකට යුධ පිටියේ පුහුණුවෙන් ලද පන්නරය
උපයෝගි කර ගනිමින්......... මහා ඝණ වනයේ සතුරා සොයා යුධ වැදුනු හැටි.......
එය එස්එම්එස් නොමැති තරගයකි........... අද බිහිවී සිටින තරු එස්එම්එස්
මනාපයෙන් බිහිවූවෝය. ඔබ නිතරගයෙන් බිහිවූ තරුවක් නොවේද
අතීත තරු ද, වර්තමාන තරු ද, අනාගත තරු ද වන්නේ ඔබයි.

2 ලුතිතන් එච්ආර්එන් සංජීව ශ්‍රීලපාහ
23 ශ්‍රීලපාහ

## අහිමි පෙම

සොඳුරු අහසේ පායනා හිරු හොරෙන් මට
නුඹ ගැන කියයි රෑට අහසේ පායනා සඳු
ආයෙ මට නුඹ ගැන කියයි ප්‍රථම ප්‍රේමය
සිහිවෙලා මගෙ දෑසේ කඳුළැලි දෝරෙ යයි
ඒත් මම අද මක් කරන්න ද
ඔබ අයිති වෙන කෙනෙකුටයි

කෝප්‍රල් දිසානායක ආර්එම්එල්
යුධ හමුදා කඳවුර, ඇතාවැටුණු වැව

**ජීවිතයේ කඳුළු බර අවස්ථා දෙකකි. එකක් ආශාව ඉටු නොවීම අනෙක ආශාව ඉටු වීම.**

# ශ්‍රී ලංකා පාබල හමුදා අන්තර් ඒකක වෙඩි තැබීමේ තරගාවලිය

2009 වසර සඳහා අන්තර් ඒකක පාබල හමුදා වෙඩි කරුවන්ගේ සංග්‍රාමික වෙඩි තැබීමේ තරගාවලිය උත්සවශ්‍රීයෙන් යුතුව තුනුක්කායි වෙඩි පිටියේදී පවත්වන ලදී.

මෙම තරගාවලිය ප්‍රධාන වශයෙන් 11 ශ්‍රීලපාහ 19 ශ්‍රීලපාහ මූලිකත්වයෙන් යුතුව පැවැත්විණි. අනෙක් සියලුම ඒකක වලින් මේ සඳහා ලද නොමඳ සහය ඉතා අගය කොට සැළකිය යුතුය. මෙම තරගාවලිය දහසකුත් බාධක තරණය කරමින් පාබල සෙබළාට අයිති සියලුම රාජකාරීන් නොපිරිහෙලා ඉටුකරමින් තරගාවලිය පැවැත්වීමට සංවිධාන කටයුතු සිදුවීමත් පුරන් කුඹුරු යායක් ඉතාම කෙටි කාලයකදී අලංකාර වෙඩි පිටියක් බවට පත් වීම කැපී පෙනේ.



මෙම තරගාවලිය සඳහා බොහෝ රාජකාරී මැද පුහුණු වීම කටයුතු සිදු කළ ඒකක අණදෙන නිලධාරීන් තම කණ්ඩායම් තුළ තරග මානසිකත්වයක් ඇති කර තම කණ්ඩායම පුහුණු කර තරගය සඳහා ඉදිරිපත් කිරීම කැපී පෙනේ.

මෙම තරගාවලිය සඳහා රෙම ශ්‍රීලපාහට අයත් නිත්‍ය හා ස්වේච්ඡා ශ්‍රීලපාහ ඒකක 21ක් සහභාගී වූ අතර එහිදී පැවැත්වුණු සියලුම තරග වෙනුවෙන් ලකුණු 2500ක් හිමි විය. එම ලකුණු අතුරින් ලකුණු 1715ක් ලබාගත් 11 ශ්‍රීලපාහ ඒකකය පළමුවන ස්ථානයත් ලකුණු 1115ක් ලබාගත් 19 ශ්‍රීලපාහ දෙවන ස්ථානයත් ලකුණු 966ක් ලබාගත් 16 (සෙව්) ශ්‍රීලපාහ තෙවන ස්ථානයත් හිමිකරගත් අතර අනිකුත් ඒකක පිළිවෙලින් දක්වා ඇති පරිදි ස්ථාන හිමි කරගන්නා ලදී.

8 ශ්‍රීලපාහ ලකුණු 943ක් ද, 21 (සෙව්) ශ්‍රීලපාහ ලකුණු 894ක් ද, 12 ශ්‍රීලපාහ ලකුණු 874ක් ද, 6 ශ්‍රීලපාහ ලකුණු 840ක් ද, 15 ශ්‍රීලපාහ ලකුණු 794ක් ද, 5 (සෙව්) ශ්‍රීලපාහ ලකුණු 775ක් ද, 4 ශ්‍රීලපාහ ලකුණු 762ක් ද, 7 ශ්‍රීලපාහ ලකුණු 756ක් ද, 18 (සෙව්) ශ්‍රීලපාහ ලකුණු 720ක් ද, 20 ශ්‍රීලපාහ ලකුණු 700ක් ද, 23 ශ්‍රීලපාහ ලකුණු 657ක් ද, 1 ශ්‍රීලපාහ ලකුණු 631 ක් ද, 9 (සෙව්) ශ්‍රීලපාහ ලකුණු 617ක් ද, 22 ශ්‍රීලපාහ ලකුණු 539ක් ද, 2 (සෙව්) ශ්‍රීලපාහ ලකුණු 523 ක් ද, 10 ශ්‍රීලපාහ ලකුණු 503ක් ද, 17 (සෙව්) ශ්‍රීලපාහ ලකුණු 407 ක් ද, 14 (සෙව්) ශ්‍රීලපාහ ලකුණු 381 ක් ද ලබාගෙන ඇත.

## තරගාවලියේ දක්ෂතම අණදෙන නිලධාරීන්

**පළමුවන ස්ථානය :- ලුතිː කර්නල් පීඑම්සීකේඩී ඒකනායක ආර්එස්පී 11 ශ්‍රීලපාහ**
**දෙවන ස්ථානය :- මේජර් පීඑල් කිත්සිරි 5 (සෙව්) ශ්‍රීලපාහ**
**තුන්වන ස්ථානය :- ලුතිː කර්නල් ඊජීපී එදිරිවීර ශ්‍රීලපාහ 20 ශ්‍රීලපාහ**

වෙඩි තැබීම පිළිබඳ දැනුමෙන් සහ ශක්තියෙන් පිරිපුන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් බොහෝමයක් අපට සිටිති. ඔවුහු පාබල හමුදා වෙඩි තැබීම සඳහා ආරම්භයක් ලබා දුන් නියමුවන් ලෙසින් නම් කිරීමට කැමැත්තෙමි. එදා සිට ඔවුන් දැමූ අඩිතාලම උඩ වත්මන් රෙජිමේන්තු වෙඩි තැබීම ගොඩ නැගෙමින් පවතින බැව් අපගේ විශ්වාසයයි.



එම නිසාවෙන්ම තරග සංවිධාන මුල් අවධියේම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ වෙඩි තැබීම් තරගාවලිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. එය පාබල සෙබළුන්ගේ චිත්ත ධෛර්ය ඉහළ නැංවීමටත් අනෙකුත් රෙජිමේන්තු වලට ආදර්ශයක් ද වනු නොඅනුමානය.

## ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙඩි තැබීම තරගාවලියේ ජයග්‍රාහකයින්

**පළමුවන ස්ථානය :- බ්‍රිගේඩියර් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී**
**දෙවන ස්ථානය :- බ්‍රිගේඩියර් එච්එම්ජේකේ ගුණරත්න ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී**
**තුන්වන ස්ථානය :- කර්නල් එම්එම් කිත්සිරි ආර්එස්පී**

රෙජිමේන්තු අධිපති තුමන්ගේ උපදෙස් හා මග පෙන්වීම මෙම තරගාවලිය පුරා පැවතීම අප සැමට ශක්තියක් වූවාට සැක නැත. මෙම තරගාවලියේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ වත්මන් රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ය. මෙහිදී සංදර්ශණ වෙඩි තැබීම් රෙජිමේන්තු වෙඩි තැබීම අංශය වෙතින් සිදු කරන ලදී. එමෙන්ම මෙම තරගාවලියේ දක්ෂතම වෙඩි කරුවන් සහභාගි කර ගැනීම 11 ශ්‍රීලපාහ අණ දෙන නිලධාරීගේ නායකත්වයෙන් යුතුව සිදු කරන ලදී. මෙහිදී රෙජිමේන්තු අධිපතිතුමන් මෙයට සහභාගි වූ සියලුම දෙනා අමතා තම තුති පුද කරන ලද අතර මෙවන් තරග තව තවත් සංවිධානය කළ යුතු බවත් ඒ සඳහා තම පූර්ණ ශක්තිය සහ සහයෝගය



සැමවිටම ලබා දීමට සූදානම් වන පාබල හමුදාවට කළ නොහැකි යමක් නොමැති බවත් යුද්ධයේදී පමණක් නොව මෙම තරග සංවිධානය තුළ දීද එය මනාව ඉස්මතු වූ බව පවසමින් සියලුම පාබල නිලධාරීන් හා සෙබළුන් දිරිමත් කරන ලදී.



තරග සංවිධානය කිරීමේදී විශේෂයෙන් එය විනිවිදභාවයකින් යුතුව සිදු විය යුතු නිසාවෙන්ම වෙඩි තැබීම් පිළිබඳ මනා දැනුමක් හා හැකියාවක් ඇති විනිශ්චයකරුවන් මෙම තරගාවලිය විනිශ්චය කිරීමට සහභාගි කර ගැනීමට දියතලාව ප්‍රවෙපුපා වෙතින් ලබා දුන් සහයෝගය ඉතා අගය කොට සලකන අතර මේ සඳහා තම කාලය මිඩංගු කර ඒ සඳහා සහභාගි වූ 36 ශ්‍රීලංජාආබමු ඒකකයේ අණදෙන නිලධාරී මේජර් ටීඑස්බීආර් ප්‍රනාන්දු සහ 21 ශ්‍රීලංජාආබමු ඒකකයේ මේජර් යූඩීආර් ෆ්‍රෙඩ්‍රික් ශ්‍රීලංසිරෙ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සේවය ඉතා අගය කොට සලකමු. එමෙන්ම මෙම තරගාවලිය පුරාවට රෙජිමේන්තු වෙඩි තැබීම් අංශය එම නිලධාරී සමගින් තරගාවලියේ සියලුම කටයුතු වලට ශක්තිය සහ ජීවය ලබා දෙමින් දිවා රෑ නොබලා කටයුතු කිරීම පිළිබඳ අපි කෘතඥවන්නෙමු.





මේජර් එන්පීඑජේඑම් සමරසිංහ ශ්‍රීලපාහ
වෙඩි තැබීමේ අංශය රෙමශ්‍රීලපාහ

# දසුනේ හසුන




හිටි ගමන්ම හයිටි රටේ පොළොව පැලුන හරිම දුකයි
පිටි කිරෙන්ම බඩ පිරෙයි ද පුංචි පුතා අම්ම සොයයි
සිහල වුනත් දමිළ වුනත් සිතට ගතට රිදුම් එකයි
හයිටි වුනත් මහිටි වුනත් කොයි දරුවත් අපට එකයි

දසුන : ශ්‍රී ලංකා යුද හමුදා වෙබ් අඩවිය අනුග්‍රහයෙනි
හසුන : මේජර් තරිඳු වීරසිංහ ශ්‍රීලපාහ




රුහුණු පුරවරයේ ඓතිහාසික ගාලු කොටු පවුර තුල 2009-12-26 දිනසිට 2009-12-31 දින දක්වා උත්කර්ශවත් ලෙසින් පවත්වන ලද ගාලු සමය ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා යුධ හමුදා ප්‍රදර්ශන භූමියේ සියලුම පාබල රෙජිමේන්තු විසින් පරිහරණය කරනු ලබන අවි ආයුධ ශ්‍රීලපාහ රෙජිමේන්තුව විසින් ද කාලතුවක්කු රෙජිමේන්තුව විසින් එම රෙජිමේන්තුවට අයත් අවි හා උණ්ඩ ද ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායට අයත් සන්නද්ධ රථ ද, මධ්‍යම අවි ගබඩාව මගින් එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙන් අල්ලා ගන්නා ලද අවි ආයුධ විශාල සංඛ්‍යාවක් ද, මෙහිදී ප්‍රදර්ශණය කරන ලදී. මෙම ප්‍රදර්ශන කුටි නැරඹීම සඳහා දෙස් විදෙස් නරඹන්නන් විශාල සංඛ්‍යාවක් ද ප්‍රදේශයේ දේශපාලකයින් සහ ප්‍රභූවරුන් ද පැමිණ සිටියහ. ශ්‍රී ලංකා පාබල හමුදා අවි ප්‍රදර්ශන කුටිය ද සිත් ගන්නා සුළු අයුරින් සකස් කර තිබුණි. මෙවන් ප්‍රදර්ශන කුටියක් නිර්මාණ කර නරඹන්නන්ගේ සිත් සතන් තුල යුධ හමුදාව පිළිබඳව ගෞරවයක් ඇති කිරීම සම්බන්ධයෙන් ප්‍රදර්ශණය සංවිධානය කල සියලු දෙනාට මෙන්ම ඉතා කාර්ය බහුල වාතාවරනයක් යටතේ එහි රාජකාරි කල විරුවන්ට අපගේ ගෞරවය පුදකර සිටින්නෙමු.



## පෙරට යමු නොවී පලා

| | |
|---|---|
| කොටියන් දිව්වා සිය කඳවුරු අත | හැරලා |
| සිතා ගන්න බැරි ලෙස උන් | අසරණ විලා |
| සමගියේ බලය රණවිරුවන් පෙරමුණ | බැඳලා |
| නොම ආවෙමි යළි ආපස්සට | හැරිලා |
| | |
| කොටියගෙන් ලැබෙන වදහිංසා වලට | බියේ |
| සිටියා ඔවුන් උන්ගේ බල මහිමය තිබෙන | වියේ |
| සතුරගෙ තිබු ආරක්‍ෂක වළලු බිඳපු | වෙලේ |
| බලෙන් ගන්න මිනිසුන් අද නිදහස් | උනේ |
| | |
| උතුර දකුණ බස්නාහිර නැගෙන | හිර |
| අද නිදහස්ය කොටියා නැත අපගෙ | රටේ |
| එක්වී සැවොම එක අම්මගෙ දරුවො | වගේ |
| යමු ඉදිරියට නියතයි ජය අපගෙ | රටේ |

ලාකෝ රුවන් කුමාර එඑම්ආර්
ජනාධිපති ආරක්‍ෂක සේනාව
අරලියගහ මන්දිරය

## පෙරදිනයක මා

පෙරදිනයක මා යුධ කල යුධ බිම
යුධ ගිනි ඇවිලෙනවා
මගේ ම අවියෙන් සතුරන් වැනසූ
හැටි මට සිහිවෙනවා
සිනාසුනෙමි මම දමිළ සොයුරි හට
ඇය දත නියවනවා
හිරුට සඳුට නොකියා හොර රහසේ
යුද ගිනිදැල් නිවුනා

එදා වගේ තවමත් කොටි සටනේ
කොටසක් ඉල්ලනවා
නෙත් අදහන්නට බැරි මහ ගානක්
උතුරේ හිනැහෙනවා
නොකා නොබී යුධ බිම ගතකල
හැටි යළි මට සිහිවෙනවා
මේ බිම අඟලක්වත් දෙන්නෙ නෑ
පණමෙන් සුරකිනවා

ලාකෝ සුරංග අයිපී
ජනාධිපති ආරක්‍ෂක සේනාව
අරලියගහ මන්දිරය




## ඊදා හා අද

| | |
|---|---|
| රටේ භීෂණ කාලේ - කිසිම නිදහසක් | නෑ |
| ඒ කාලේ වෙඩි ශබ්ද - මේ කාලේ ඇහෙන් | නෑ |
| දැන් නෑනේ එහෙ යුද්ධ - රට්ටුන්ට බයක් | නෑ |
| මොන වෙසින් පැමිණියත් - හමුදාව බයත් | නෑ |

සැරයන් ටිකිරි බණ්ඩා කේඑ 4 ශ්‍රීලපාහ

## ආදරණීය හිමියනි

| | |
|---|---|
| සුරතට ගන්න විට දිලිසෙන ගිනි | අවිය |
| ඔබ හට ලැබේනවා දුටුගැමුණුගෙ | සවිය |
| සතුටින් ගෙනියන්න ඔබගේ යුග | දිවිය |
| ඔබ හට ලැබේවා හදවත තුල | සවිය |
| | |
| මා ගැන සිතා දුක්ගින්දර නොගෙන | ඔයා |
| කාල බිල සැනසිමෙන් ඉන්න | කියා |
| කිවත් වස්තුවේ මේ ලෙස නිතර | ඔයා |
| කොහෙමද ඉන්නේ රන්කද මේ පපුව | තියා |
| | |
| අමතක කලත් කන්තලේ වැවෙ සුදු | රැල්ල |
| අමතක නොකරන්න මේ අසරණ | කෙල්ල |
| කෙරුවත් ඔයා මතුදින හදවත | සල්ල |
| තියනව සහතිකයි රේල්ලුවට | බෙල්ල |
| | |
| දුරකථනයෙන් ඔබගේ හඩ ඇසෙන | විට |
| ඇතිවන දුක සතුට බැහැ කවියක | ලියන්නට |
| බාරකරලා ඔබ දළදා | සම්දුන්ට |
| අවසර දෙන්න කවිම්ටකින් | සමුගන්නට |

කරුණාරත්න කේඑල්එ ගේ
ආදරණීය බිරිය එච්එම් සිරියලතා
14(සෙව්) ශ්‍රීලපාහ

## රත්තරං පුතේ

**නුඹේ සිගිති වදන් දඟකාරකම් මැද**
**කෙසේ තනිකර එන්නද පුතේ**
**නිවාඩුව අවසන් වී නිවසින්**

**2/ලුතිතන් මිහිර ශාන්ත**
**2(සෙව්) ශ්‍රීලපාහ**

## මගේ සඳ

**මගේ සඳ**
**ඔබ මගේ නම්**
**එළිය කරන්න**
**ඔබේ ඔය මෘදු කිරණින්**
**මා මෙන්ම මගේ ආත්මය------**

**මගේ සඳ**
**ඔබ මගේනම්**
**දෙන්න මට ඔබේ උණුසුම------**
**විශ්වාසයෙන් මගේ දිවිය**
**ගොඩ නගා ගැනුමට**

**මගේ සඳ**
**ඔබ මගේ නම්-------**
**එවන්න ඔබේ සීතල කිරණ මා වෙත**
**ආදරයත් සමග------**
**විවෘතයි මගේ හදවතේ ජනේලය**
**ඔබට හැකියි නවතින්නට**
**අය නොකරමි බදු කුලිය**


**කෝප්‍රල් දිසානායක ආර්එම්එල් ගේ**
**ආදරණීය දියණිය හංසනි විජේවිර**

## සුදු පරවියෝ ඉගිලෙති වන්නි අහසේ

| | |
|---|---|
| ගසකින් ගිලිහුනත් කොළයක් සුළඟෙ | වැදී |
| කවියකු එයට ලස්සන පද පේළී | බඳී |
| නොදැනෙයි ඊරිසියා ගතිගුණ කුහක | ගතී |
| කවිසිත මගේ ලග රැඳියන් සුවඳ | දීදී |
| | |
| පාබල මැණිගේ ළඟ මම | දරුවෙක්වී |
| ඈත මේවන විටදී පහලොස් | වසරක්වී |
| නිවසට යන තුරුම මගේ සේවය | නිමවී |
| සේවය කරමී අම්ම ගේ | තුරුලටමවී |
| | |
| පාබල බළඇණියේ දරුවන් එකට | වැටී |
| පෙරමුණු කිපෙකින් සටනට ඇදුන | හැටි |
| බිම්වෙඩි මරළගුල් පස්බැමි බිඳපු | හැටි |
| දසමහ යෝධයොත් බැලුවලු පුදුම | වෙවී |
| | |
| හමුදා බළමුළු අභියස දනින් | වැටී |
| සිගමන් යැද්ද හැටි වන්නියේ හිටපු | කොටි |
| වැනසුව අයුරු සතුරන් යුධ වැදුනු | හැටි |
| පැරකුම් දුටුගැමුණු නිරිඳුන් බලා | සිටි |
| | |
| ලොකු මකුළුවෙකි මම දැල් ගොමුවක | සිටින |
| මහරජු මමයි ඊලම් රජ සුන | දරණ |
| පවසන විටදී මහ කොටියගේ | වීරදින |
| සතුටින් ඉපිලුනා සිටි පොඩි කොටි | රෑන |
| | |
| බංකර් යුද අගල් පස්බැමි බිමට | හෙලා |
| හමුදා බලමුලුව එන විට උතුර | බලා |
| කොටි තංගච්චිලට මරණයේ බිය | ගැනිලා |
| පසුපස ගියේ ඉදිකළ බංකර් | දමලා |
| | |
| කොටින්ගේ හදවත එවකට | කිලිනොච්චි |
| යුද අගලකින් පස්බැම්මෙන් | වටවෙච්චි |
| බැම්මට පහර දෙනවිට දෙවි | සිහිවෙච්චි |
| දිව්වේ අවිත් අත හැරලයි | තංගච්චි |
| | |
| කොටින්ගේ බලය ටික ටික ගිලිහෙන්න | වුනා |
| පෙරුබාහරං මරුවෙත ලං වෙන්න | වුනා |
| පිටරට මාමලාගේ හිත හොදටම | රිදුනා |
| යුද්ධය නවතන්න කෑ මොර දෙන්න | වුනා |
| | |
| කොටි හැතිකරය වනසන්නට හිතට | ගත් |
| බළමුළු ඇදුනි පෙරටම අවි අතින් | ගත් |
| අවසන් වෙඩි මුරය තබනා | පැයේදිත් |
| හකුලා ගත්තේ නැත පිටරට බළල් | අත් |
| | |
| ප්‍රභාකරං සහ පිරිවර එලොව | ගියා |
| සාමය සදාකාලික බව ලොවට | කියා |
| කොටි නංගිලා මල්ලිලා අවි බිම | තියා |
| රණවිරුවන්ගේ රැකවරණය වෙතට | ගියා |
| | |
| අවියෙන් නොහැක හෙට ලෝකය ජය | ගන්න |
| ඉගෙනුම තුලින් හොඳ පුරවැසියෙක් | වෙන්න |
| පොත්පත් තුරුළු කරගෙන පාසැලට | යන්න |
| තංගච්චියේ අපි එක්කත් | හිනැහෙන්න |
| | |
| ලක්බිම පුරා එදිනට ජය ගීත | ඇසේ |
| සුදු පරවියෝ ඉගිලෙති වන්නියේ | අහසේ |
| හමුදා පුතුන් පෙරදින යුද්දෙට | බැස්සේ |
| සාමයේ කිරුළ පළඳන්නයි මවගේ | හිසේ |

2/ලුතිතන් එච්එම් රාජපක්‍ෂ ශ්‍රීලපාහ
24 ශ්‍රීලපාහ

**සිනාසීමට කාලය ගන්න එය ආත්මයේ සංගීතයයි**



# සෙබළ හිමියණි එවමි හසුනක්

යනවිට තනි කරල ඔබ මා ළඟින් අද
දැනුනා තනිකමක් මහ ගින්දරක් මැද
ඉවසන්නේ කෙලෙස මේ දුක තනිව ඉද
ගොතලා කවි ලියමි පාළුව අතර මැද

රත්තරනේ ඔබෙ ආදර රන් කැටියා
සුව නින්දේ සිටිනු බලලා ඇති සැටියා
ලිව්වේ මෙලෙස ලිපියක් ඔබ දුර සිටියා
බලලා යන්න එන්නේ කවදද පැටියා

ආසයි ඔබේ තුරුලේ ළඟ හිදින්නට
පාළුයි තනියි සිත සැරසේ අඬන්නට
කඳුළුයි තනි කමයි තද කරගෙන හිතට
සත්තයි දිව එන්න සිතෙනව ඔබෙ ළඟට

පාළුව තනි කමට අතගෙන තුවක්කුව
සැරසී ඉන්නේ ඔබ ඈතට යන්න දිව
නොමැකේ මතක කිසිදා ඔබ ළඟින් තව
තනිවී නොමැත මා ළඟ ඇත ඔබේ රුව

යාළුවො සැවොම එක්වී අමතන විටදී
ඔබ තනි නොමැත රොක්වී ගුලිවුණු විටදී
සැනසේ ඉතින් බංකරයේ ඔබ පැහැදී
ඔබෙ ජීවිතය රැකදෙයි දෙවියන් සැමදී

අඳුරේ ගෙවන ඔබ දිවියේ හසරැල්ල
මහදේ නිතර ඇත ඔබගේ සිතුවිල්ල
ලමැදේ හොවාගෙන ඔබගේ සෙවණැල්ල
තනිවේ හදේ මේ ඔබගේ පවනැල්ල

සාමය සතුට සැනසුම නිති ගෙනදේවා
කාලය ගෙවනු මැන සතුටට ලැබේවා
නාදය සියොතුන්ගෙ ඔබ සවනට ඒවා
මා හද පැතුම ඔබ දෙවියන් රැකදේවා

සිටියත් දුර ඈත මා තනිකර දමලා
අවියක් අත අරන් සාමයෙ මල් පිපිලා
සවියක් තිබෙයි ඔබ හට යනු පිය මැනලා
දෙවියන් ඔබව රැකදෙයි නිතිනෙත් යොමලූ

මුලතිව් කැලයෙ ඔබ තනිවී සිටින්නේ
වනයට වෙලා මහ දුකකිය විදින්නේ
නිවසට වෙලා අපි කඳුළුය බුදින්නේ
මහිමිට සම්දුගේ සරණයි පතන්නේ

සියළුම සෙබළ සොයුරන් අමතා ලියමි
යහළුවො සැවොම හට නිති ශක්තිය පතමි
සතුරට නිබඳ සැම සිත් බැඳ වෙර කරමි
සියළුම දෙවියො ඔබ සැම රැකදේ පතමි

**24 ශ්‍රීලපාහ ලාකෝ නාමල් දේශප්‍රිය එස්බීජ් ගේ බිරිය එම් සුජාතා තෙන්නකෝන්**

# ප්‍රහේලිකා අංක 43

නිවැරදි විසඳුම්පත් 2010 ජුලි මස 15 වන දිනට පෙර එවිය යුතුය.

තරග කූපනය සහ තරග කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

## වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 43

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 7 | | | | | |
| | | | | | | | | 7 |
| | | 7 | | | | | | |
| | | | | | 7 | | | |
| | | | | | | | 7 | |
| 7 | | | | | | | | |
| | 7 | | | | | | | |
| | | | | | | 7 | | |
| | | | | 7 | | | | |

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.

2. කුඩා කොටු නවය තුල 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර එය පිළිවෙළකට අවශ්‍ය නොවේ.

3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.

4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙළකට අවශ්‍ය නොවේ.

5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.

6. කුඩා කොටුවක් තුල හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

**සුළු සුළු කරුණු ගැන උනන්දු නොවී අංග සම්පූර්ණ කිසිවක් කළ නොහැක.**




## වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 41

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **1** | 7 | 4 | 9 | 3 | 2 | 8 | 5 | **6** |
| 2 | 5 | 3 | 4 | **6** | 8 | 7 | 1 | 9 |
| 8 | 6 | 9 | 7 | 1 | 5 | 3 | 2 | 4 |
| 6 | 3 | 1 | **8** | 7 | 9 | 5 | 4 | 2 |
| 7 | **2** | 5 | 3 | 4 | 1 | **6** | 9 | 8 |
| 9 | 4 | 8 | 2 | 5 | 6 | 1 | 7 | 3 |
| 3 | 9 | 7 | 5 | 8 | 4 | 2 | 6 | 1 |
| **4** | 8 | 6 | 1 | 2 | 7 | 9 | **3** | 5 |
| 5 | 1 | 2 | 6 | 9 | **3** | 4 | 8 | 7 |

මෙවර කිසිදු ජයග්‍රාහකයෙක් නොමැත.

## තරග කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරගයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගී විය නොහැක.
3. පළමුවන,දෙවන හා තුන්වන ජයග්‍රහණ හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්වය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. ප්‍රහේලිකා අංක 43 හි නිවැරදි විසඳුම් පත් 2010 ජුලි 15 වන දිනට පෙර එවිය යුතුයි.
6. නිවැරදි පිළිතුරු පත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණ-ක් තෑගි දීම සිදු කෙරේ.
7. පිළිතුරුපත් එවන ලියුම් කවරේ වම් පස උඩ කෙලවරේ වයිට් හැකල් ප්‍රහේලිකා අංක 43 යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ
වයිට් හැකල් ප්‍රකාශන අංශය
රෙම ශ්‍රීලපාහ
යුද්ධ හමුදා ජනපදය
පනාගොඩ
හෝමාගම

## mkä,

ගම මැද පිහිටියත් මේ උතුම් කඳවුර
නිවයි සැම සිත් බැතින් හැම විට
සියලු කරදර දුරුකරවා ගන්නට
යන්නෙ හැම පෝයකම
අපි අපේ මල්ලාවි පන්සලට
පන්සලත් ආගමත් සිහිවුනත් අප හට
තෙරුවණ් නමදින්න බැති සිත් උපදවන්න
අපි සැම යන්නෙමු 19 ශ්‍රීලපාහ
ඉදිකළ මල්ලාවි පන්සලට
සැමට සැනසුම ගෙනෙන මේ භූමියේ
ගමට සිරියාවක් ද ගෙනදෙයි
මේ පන්සල........ රකිමු අපි බැති සිතින්
අපි අපේ පන්සල..........

සාසෙ මධුසංඛ එල්එච්එච්
19 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම

## වයිට් හැකල් ප්‍රහේලිකාව

**අංක 43**

**කූපනය**

අංකය :..............................................................................

නිලය :..............................................................................

නම :..............................................................................

රාජකාරී ලිපිනය :..................................................................

..............................................................................

..............................................................................

ඒකකය :..............................................................................

ජාතික හැඳුනුම්පත් අංකය :..................................................

දඩුවම නව ජීවනය ගෙන දෙන අමෘතයකි.







# 30 වසරක යුද්ධය ජය ගැනීම නිමිත්තෙන් යුද හමුදාපතිතුමාගේ ප්‍රණාමය

30 වසරක ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් අවසන් විය. රුදුරු ත්‍රස්තවාදීහු අවසන් හුස්ම ද හෙලා ඇත. ඒ සඳහා පෙරමුණ ගත් එම බැරෑරුම් කාර්යයට කැපවූ රණවිරුවන්ගේ සේවය අගය කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාපති ලුතිතන් ජෙනරාල් ජේ ජයසූරිය යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ සංකල්පයක් මත දශක තුනක ඉතිහාසය පුරා ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාවය හා සාමය ආරක්ෂා කිරීම වස් සිදු කළා වූ මෙහෙවරට ප්‍රණාමය පුද කරමින් සහතික පතක් ලබාදුන් අතර, එම සහතික පත් ශ්‍රී ලංකා පාබල හමුදාවේ විරුවන්ට පුද්ගලිකව ලබාදීම එතුමා ගේ කාර්ය බහුලත්වය හේතුවෙන් අපහසු විය. එතුමා වෙනුවෙන් ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් 2010 ජනවාරි මස 15 වන දින රෙම ශ්‍රීලපාහ හීදී ලබාදෙන ලදි. එම මොහොත කැමරා කාචයේ සටහන් වූ අවස්ථා කිහිපයකි මේ.







# ලිපිකරු පාඨමාලා අංක 01 හා 02

රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත හා ඒ යටතේ පාලනය වන ඒකක වෙත ඇවසි ලිපිකරුවන් පුහුණු කිරීම වස් රෙජිමේන්තු සේනාවිධායක තුමාගේ සංකල්පයකට අනුව ලිපිකරු පාඨමාලාවන් දෙකක් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන්නට යෙදුනි. එහිදී ඒකක වෙතින් හා රෙජිමේන්තු පාලන කණ්ඩායම වෙතින් පළමුවන පාඨමාලාව සඳහා සෙනින් 37 දෙනෙක් හා දෙවන පාඨමාලාව සඳහා සෙනින් 41 දෙනෙක් සහභාගි වූහ. මෙම ලිපිකරු පාඨමාලාවන්හී ප්‍රධාන උපදේශක වශයෙන් රෙජිමේන්තු ප්‍රධාන ලිපිකරු කටයුතු කළ අතර ලිපිකරුවෙක් සතු දැනුම් සම්භාරය ලබා සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරීන් මෙන්ම බළලත් නිලධාරීන්/ජේ්‍යකොනොනි/කොනොනි වරු විසින් දේශන පවත්වන්නට යෙදුනාහ. තවද ශ්‍රීලයුයුබ, ශ්‍රීලඉසේරෙ, ශ්‍රීලයුපොහේබ, ශ්‍රීලයුසේබ, ශ්‍රීලයුපොදුසේබයන හා ශ්‍රීලයුවෛබ රෙජිමේන්තු හී ක්‍රියා පිළිවෙත් හා ඒ ආශ්‍රිත දේශනයන් එම රෙජිමේන්තු නියෝජිතයින් මගින් ලබාදීමට කටයුතු කරන ලදී. මෙම පාඨමාලා තුලින් වෘත්තීය පුහුණු ලිපිකරුවන් 68 දෙනෙක් බිහි කිරීමට හැකි වූ අතර එම ලිපිකරුවන් වෙත සහතික පත් රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශන ශාලාවේදී රෙජිමේන්තු සේනා විධායකතුමා විසින් ප්‍රදානය කරන ලදී.

මෙම පාඨමාලාවෙන් ලත් දැනුම යුධ හමුදාවේ දියුණුවට මෙන්ම තමන්ගේ යුධ හමුදා ජීවිතය සාර්ථක කරගැනීමට ඉවහල් කර ගනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු. ඔවුන්ගේ ඉදිරි අනාගතය සාර්ථක වේවා! යි අපි සුබ පතන්නෙමු.



# ANOTHER BATTALION TO HAITI FROM THE SRI LANKA LIGHT INFANTRY



*The SLLI troops to Haiti are being mustered by Colonel of the Regiment Major General RMD Rathnayaka RWP RSP USP ndu psc.*

**Gird up your loins to keep the SLLI flag flying in Haiti....**

*Bon Voyage!*